
1 පරිච්ඡේදය

# අසිරිමත් බුද්ධිය

"විශ්වය" යනු මිනිසාට විස්තර කළ නොහැකි විශාලතම වචනයයි. විශ්වය සෑදී ඇත්තේ මන්දාකිනි මිලියන ගණනක් එකතු වීමෙනි. මන්දාකිනියක් නිර්මාණය වන්නේ සූර්යග්‍රහ මණ්ඩල මිලියන ගණනක් එක්වීමෙනි. අප ජීවත් වන මන්දාකිනිය "ක්ෂීරපථය" ලෙස හඳුන්වයි. සූර්යග්‍රහ මණ්ඩලයක් නිර්මාණය වන්නේ තරුවක් වටා භ්‍රමණය වන ග්‍රහලෝක කීපයක් එක්වීමෙනි. අප ජීවත් වන්නේ පෘථිවිය නැමැති ග්‍රහ වස්තුව මත බව ඔබ දන්නවා ඇති.

මේ පොත කියවන ඔබට විශ්වයේ ආකර්ෂණ බලය අත්දැකීමට නම් ඔබ අවට පරිසරයේ ඇති නිර්මාණශීලි බව ගැන නිතර විමර්ශනයෙන් සිටිය යුතුය. පරිසරය නිර්මාණය වී ඇති ආකාරය, ඔබව නිර්මාණය වී ඇති ආකාරය, ඔබ අවට ඇති වස්තුවල ක්‍රියාකාරීත්වය ගැන නිතර සිතන්න. ඔබ විශ්වයේ සිටින ස්ථානය ගැන සිතන්න.






ඔබේ නිවස → ඉඩ
→ පෘථිවිය → සූර්
විශ්වය කොතරම් වි
හිතන්නවත් පුළුව
වී ඇති බුද්ධිය

විශ්වයේ
අතරින් අප ජීවත්
සිට කුඹියා දක්
නිර්මාණය වූව
කොපමණද? ම
ඇත්තේ කෙ
ගණනකගේ මු
සහ කට යන
ගණනක් එක්
ගත්තා කෙ
සම්බන්ධ වී
කැන, එම ක
නිර්මාණය
පොළවේ ව
සෑදී තිබේ
නිර්මාණයෙ
ඔබව පුදුම
කළ විටයි.
වෙනස් ව

ඔබේ නිවස → ඉඩම → ගම → නගරය → රට → මහද්වීපය → පෘථිවිය → සූර්යග්‍රහ මණ්ඩලය → ක්ෂීරපථය → විශ්වය. විශ්වය කොතරම් විශාලද? විශ්වයේ ඇති ශක්තිය ගැන අපට හිතන්නවත් පුළුවන්ද? මේ විශ්වය නිර්මාණය කිරීමට දායක වී ඇති බුද්ධිය කොතරම් විස්මිතද?

විශ්වයේ ඇති ප්‍රකෝටි ගණනක් වන ග්‍රහ වස්තූ අතරින් අප ජීවත් වන පෘථිවිය කොතරම් සුන්දරද? මිනිසාගේ සිට කුඹියා දක්වා ඇති මිලියන ගණනක සත්තු කෙසේ නිර්මාණය වූවාද? පෘථිවියේ ඇති ගස් වර්ග ගණන කොපමණද? මල් වර්ග, සුවඳ, වර්ණ, ආදී දේ නිර්මාණය වී ඇත්තේ කෙසේද? පෘථිවියේ ජීවත් වන මිනිසුන් මිලියන ගණනකගේ මුහුණුවල හැඩ මැව්වේ කවුද? ඇස්, කන්, නාසය සහ කට යන අවයව පමණක් ඇති මුහුණට හැඩ මිලියන ගණනක් එක් කළ බුද්ධිය ගැන මදක් සිතන්න. ඔබ ආහාරයට ගන්නා කෙසෙල් ගෙඩියක් ගැන සිතන්න. කෙසෙල් ගෙඩිය සම්බන්ධ වී ඇති කෙසෙල් ඇවරි, ඒවා එක් වුණු කෙසෙල් කැන, එම කැන හැදුන කෙසෙල් ගස ගැන සිතන්න. මේ නිර්මාණය කොතරම් අපූරුද? මේ කෙසෙල් පැළය ක්‍රමයෙන් පොළවේ වැඩෙන ආකාරය සිතන්න. කෙසෙල් ගසේ කඳ සෑදී තිබෙන ආකාරය කොතරම් විස්මිතද? මේ අපූරු නිර්මාණයෙන් ඉතා රසවත් කැනක් බිහි වන ආකාරය ගැන ඔබව පුදුමයට පත් වන්නේ ඒ ගැන වුවමනාවෙන් කල්පනා කළ විටයි. කෙසෙල් කැන පැසී ඉදෙන විට එහි වර්ණය වෙනස් වන්නේ මිනිසාගේ සිත් දිනා ගැනීමට නොවේද?

එයට වර්ණය සමගම සුවඳ සහ රස එක් කිරීමට "විශ්ව බුද්ධිය" අමතක කර නැත. කෙසෙල් ගෙඩියේ අප ආහාරයට ගන්නා කොටස ආවරණය කර තිබෙන්නේ පිරිසිදුකම සහ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට නොවේ ද? අඹ, ගස්ලබු, රඹුටන්, අන්නාසි, මිදි, වරකා, පැෂන්, අලිගැටපේර, ජම්බු, පේර, උක්, දොඩම්, දිවුල් ආදී පළතුරු විශේෂ පිළිබඳ ඔබ තනිවම කල්පනා කර විශ්වයේ ඇති පුදුමාකාර වූ බුද්ධි ශක්තිය ගැන සිතන්න. අප ආහාරයට ගන්නා බත් හදන ගොයම් ගස ගැන සිතන්න. වී ඇටයෙන් ගොයම් පැළය නිර්මාණය වන අපූරුව කෙසේ ද? ගොයම් පැළය වර්ධනය වී කරල සැදෙන ආකාරය කල්පනා කරන්න. මුලින්ම වී මලේ පෙති දින කීපයකින් හැකිලී වී ඇටයේ ස්වභාවයට බද්ධ වේ. ඉන්පසු ඒ වී පොත්ත නැමැති කවරය තුළට කිරි පුරවන්නේ ගොයම් ගසෙනි. වී කරල පැහෙන්න කලින් වී ඇටයක් හැපුවහොත් ඒ වී ඇටයේ ඇති කිරි රස ඔබට අත් විඳිය හැකි ය. මේ අත්දැකීම ඔබ මේ වනවිටත් ලබා තිබිය හැකි ය. මේ වී ඇටය තුළට පිරෙන කිරි දින කිහිපයක් යන විට ශක්තිමත් ව හාල් බවට පත් වේ. ගොයම් ගසේ වර්ගය අනුව ඒ තුළට පුරවන කිරි විශේෂය තීරණය වේ. සුදු, රතු, සම්බා, ආදී වර්ග වන්නේ ඒ අනුවයි. වී කරල බර වී නැවෙන්නේ දැන් සූදානම් බව අපට දැන්වීමටයි.

හරිත වර්ණයකින් යුතු මේ සෑම ගසක්ම අදාළ එලදාව නිෂ්පාදනය කරන්නේ "ප්‍රභාශංස්ලේෂණය" නැමැති

ප්‍රතික්‍රියාව මගිනි. ප්‍රභාශංස්ලේෂණය සිදු කරන්නේ සූර්ය ආලෝක කිරණ ආධාරයෙනි. සූර්යාගෙන් ලැබෙන ආලෝක කිරණ ශාකවල කොළ පැහැති පත්‍ර මතට පතිත වී, පත්‍ර අභ්‍යන්තරයේ සුවිශේෂී රසායනික ප්‍රතික්‍රියාවක් සිදුවන්නේ හරියටම යන්ත්‍රයක් ක්‍රියාත්මක වන ආකාරයට ය. මේ ප්‍රභාශංස්ලේෂණයෙන් සාදන ආහාර සමහර ශාක මගින් ඒ පත්‍ර මතම ද තවත් සමහර ශාක අතු අගින් පිටතට එන ගෙඩි ආකාරයට ද තවත් සමහරක් ශාක පොළව තුළ අල ආකාරයට ද අදාළ ආහාර තැන්පත් කරයි. පොළවේ පස් ටිකක් බුරුල් කර මඤ්ඤොක්කා දඬු කෑල්ලක් යට කරන්න. ටික දිනකින් පොළව සහ ඒ දණ්ඩ අතර සම්බන්ධයක් හට ගනී. දණ්ඩ පැළ වී හෙමින් හෙමින් ඉහළට එන්නේ එහි පත්‍ර ද වැඩෙමිනි. ඒ පත්‍රවලට හිරු කිරණ පතිත වන විට ඒ පත්‍ර තුළ ප්‍රභාශංස්ලේෂණ ක්‍රියාව සිදුවේ. ප්‍රභාශංස්ලේෂණ ක්‍රියාවෙන් සෑදෙන ආහාර කඳ හරහා පොළව තුළ ඇති එහි මුල් තුළට යවනු ලබයි. මුල් තුළට ආහාර එක්වන විට ඒවා මහත් වී අල බවට පත් වේ. මාස කිහිපයකින් පසු මේ ගස ගලවන විට පොළව යට ඇති මඤ්ඤොක්කා අල ගැලවෙන ආකාරය ඔබේ සිතේ මැවෙනු ඇති. මේ නිර්මාණය ගැන ඔබ වුවමනාවෙන් කල්පනා කළහොත් මේ සඳහා විශේෂ නිර්මාණශීලිභාවයක් සහ විශේෂිත බුද්ධියක් අවශ්‍ය බව වැටහෙනවා ඇති.

සියඹලා පත්‍රයක් ඉතා කුඩා බව ඔබ දනියි. මෙතරම්

කුඩා සියඹලා පත්‍රයක් මතට සූර්ය කිරණ පතිත වූ පසු ඒ තුළ සිදුවන ක්‍රියාවලියට (ප්‍රභාශංස්ලේෂණ ක්‍රියාව) සමාන ක්‍රියාවක් සිදු කරන යන්ත්‍රයක් අද වනවිටවත් මිනිසා විසින් නිර්මාණය කර නැත. මිනිසා එය නිර්මාණය කළ ද ඒ යන්ත්‍රය පිහිටුවීමට ඉඩම් අක්කරයක්වත් අවශ්‍ය වනු ඇත. **මිනිස් බුද්ධිය, විශ්ව බුද්ධියේ අංශු මාත්‍රයකි.**

සමන් පිච්ච වැලක එක් කොළයක් කඩාගෙන එහි සුවඳ බලන්න. එයින් විශේෂ සුවඳක් විහිදෙන්නේ නැත. එහෙත් එම සමන් වැලෙන් ම හට ගන්නා සමන් පිච්ච මලේ සුවඳ කෙතරම් මිහිරි ද? මේ සුවඳ මලට එක් කළේ කව්ද? කෙසේද?

නෙළුම් සැදෙන්නේ මඩේ ය. නමුත් නෙළුම් මල මඩෙන් එළියට ඇවිත් පිපෙන විට එහි හමන සුවඳ, එහි ඇති වර්ණය සහ එහි ඇති නිමාව කෙතරම් විස්මිත ද? **පෘථිවියේ ඇති ගස් සහ වැල් වර්ග මිලියන ගණනකි. මේ සෑම නිර්මාණයක්ම එකිනෙකට වෙනස්ව නිර්මාණය කළේ කෙසේද? මෙහි අන්තර්ගත බුද්ධිය කෙතරම් ද? මෙය "විශ්වයේ බුද්ධියයි". මේ "විශ්ව බුද්ධිය" ගැන අපට අර්ථ දැක්වීම කළ නොහැක. මෙය අවබෝධය සඳහා පමණි. මේ විශ්වයේ ඇති සෑම නිර්මාණයක්ම "විශ්ව බුද්ධියේ" නිර්මාණ වේ. විශ්ව බුද්ධිය යනුවෙන් මෙහි හඳුන්වන්නේ විශ්වයේ තිබෙන මේ සෑම නිර්මාණයකටම පාදක වී ඇති මහා බුද්ධියටයි.**

මෙය හඳුනා නොගත් මහා බලයකි. අප ද විශ්ව **බුද්ධියේ** අවයවයකි. අප නිතරම මේ විශ්ව බුද්ධියට ස්තුති, ප්‍රශංසා කළ යුතු ය. අපේ සිතේ මහා ගෞරවයක්, භක්තියක් සහ ආදරයක් විශ්ව බුද්ධිය කෙරෙහි ඇති කර ගත යුතු ය. මහා භක්තියකින් යුක්තව විශ්ව බලයට, විශ්ව බුද්ධියට ඔබ ආදරය කරන්න. මුදල් ඔබ වෙත ආකර්ෂණය කර ගැනීමේ පළමු පියවර මෙය වේ. **විශ්වයේ ඇති සෑම නිර්මාණයක් දෙසම ඔබ තර්කානුකූලව බලන්න. එම නිර්මාණයේ ඇති විස්මිත බව අත්විඳින්න. ඒ නිර්මාණයට සිතින් ස්තුති කරන්න. මේ විශ්ව නිර්මාණයට ආදරය කරන ඔබට විශ්ව බලය ද ආදරය කරනු ඇත. එවිට ඔබ නොදැනුවත්වම විශ්වයේ ආසිරි ඔබ දෙසට යොමු වී ඔබේ සාර්ථකත්වයේ ගමන ආරම්භ කරනු ඇත.** විශ්වයේ ඇති ගස් වැල් වලට ආදරය කිරීමේ පුරුද්ද ඇති කරගන්න. ටික කලක් මෙසේ ගත කරන විට ගහක කොළයක් හෝ කැඩීම නීති විරෝධී බව ඔබේ සිතට දැනෙනු ඇත. නිතරම විශ්වයේ ආසිරි ලබා ගැනීම කළ යුතු ය. ඔබ වෙතට මුදල් ආකර්ෂණය වීමට නම් ඔබ ප්‍රථමයෙන් විශ්ව බුද්ධියට ස්තුති කරන්න. විශ්ව බුද්ධිය යනුවෙන් මා අදහස් කරන්නේ විශ්වයේ ඇති සෑම නිර්මාණයකටම අවශ්‍ය වන විශේෂිත දැනුමයි. මේ විශේෂ බුද්ධියක් මගින් විශ්ව නිර්මාණ බිහි වී ඇති බව අපට වැටහෙනවා ඇත. නමුත් මේ විශ්ව බුද්ධිය කිසිදු තාක්ෂණයකට හෝ මිනිස් බුද්ධියට හසු නොවේ. මේ නිසා මෙය විද්‍යාත්මකව තහවුරු කළ නොහැක.

මතකයෙන් මැකී යාමට පෙර

- විශ්වයේ විස්මිත බව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වන්න.

---

## විශ්ව

පෘ

මල් සහ එ

අලංකාර වී

නිල් අහස

පායන දේදු

ලෝකයේ

ඇති ස්වභා

කර එහි ඇ

එවිට විශ්ව

මේ සෑම

එවිට ඔබේ

ඇති සම්බ

ඇසට දකි

සහ නාස

යාකඩුව

වතින

ශ්ව

2 පරිච්ඡේදය

# විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය

පෘථිවිය යනු ඉතාම සුන්දර ග්‍රහ වස්තුවකි. ගස් වැල්, මල් සහ ඵල හට ගනිමින් ඇළ දොළ, ගංගා, සාගරවලින් අලංකාර වී වාතයෙන් ගහන වූ මේ සුන්දර භූමිය වටා ඇති නිල් අහස පුදුමාකාර සුන්දර නිර්මාණ වේ. තත්පර කීපයකට පායන දේදුන්න තවත් මෙය වර්ණවත් කරයි. ඔබ ජීවත් වන ලෝකයේ සුන්දරත්වය ඔබ හොඳින් අත් විඳින්න. ඔබ අවට ඇති ස්වභාවික නිර්මාණ දෙස බලා ඒ ගැන හොඳින් කල්පනා කර එහි ඇති නිර්මාණාත්මක බව ගැන හොඳින් සිතන්න. එවිට විශ්වයේ ඇති බුද්ධි බලය ගැන ඔබට වැටහේවි. සිතින් මේ සෑම නිර්මාණයක්ම කළ විශ්ව බුද්ධියට ස්තුති කරන්න. එවිට ඔබේ සිත ප්‍රභාශ්වරව අවදි වේ. ඔබ සහ විශ්වය අතර ඇති සම්බන්ධය එවිට තවත් ශක්තිමත් වේ. **තිතරම ඔබ ඇසට දකින, සමට ස්පර්ශ වන, කනට ඇසෙන, දිවට සහ නාසයට දැනෙන ස්වභාවික නිර්මාණ කෙරෙහි**

**විශේෂිතව ගෞරවයෙන් සිතන්න පුරුදු වන්න. ඒ සෑම නිර්මාණයක්ම අප වෙනුවෙන් (මිනිසා) විශ්වය විසින් සාදා ඇති බව තේරුම් ගන්න. ඒ සෑම දෙයක්ම අපේ සතුටට යොදා ගත හැකි ය.** සීතල සුළඟ ඔබේ ශරීරයේ ගැටෙන විට දැනෙන සනීපය කොතරම් ද? මිත්පසු සුළඟ ඔබේ සිරුරේ ස්පර්ශ වන විට සුළඟ නිර්මාණය කළ විශ්ව බුද්ධියට ස්තුති කරන්න. සෑම විටම විශ්වයේ ඇති විශ්ව නිර්මාණ බිහි වීමට දායක වී ඇති මහා දැනුම එනම්, විශ්ව බුද්ධිය කෙරෙහි ඔබේ සිතේ මහා ප්‍රබල ගෞරවයක් ඇති කර ගන්න. මී මැස්සා මලෙන් මල් පැණි බී නැවත තමාට අයත් නවාතැන (මී වදය) වෙතට එන්න පාර සොයා ගන්නේ කෙසේ ද? සමහර විට මී මැස්සාට අයත් මී වදයේ සිට කිලෝමීටර ගණනක් ඈතට පියාසර කර නැවත නියමිත තැන වෙතටම පැමිණේ. මී මැස්සා තුළ ඇති මේ හැකියාව එයාට ලැබුණේ කොහෙන් ද? මී මැස්සා මී වදයේ කුටීර අටපට්ටම් ලෙස බැඳීමට අවශ්‍ය දැනුම ලබා ගන්නේ කෙසේ ද? මී වදයේ කුටීර තුළට මී පැණි පුරවන්න අවශ්‍ය දැනුම ලැබුණේ කොහෙන් ද? මේ සෑම තැනකටම විශේෂිත වූ බුද්ධියක් ක්‍රියාත්මක වන බව ඔබට වැටහෙනවා ඇත. වඩු කුරුල්ලා එයාගේ කූඩුව නිර්මාණය කරන්නේ අරුම පුදුම විස්මිත ආකාරයට ය. කනාමැදිරියෙක් අල්ලා ගෙනැවිත් එයාගේ කූඩුවේ රඳවන්නේ රාත්‍රී කාලයේ දී අවශ්‍ය ආලෝකය ලබා ගැනීමට ය. විශ්වයේ අන්තර්ගත මේ මහා විශ්ව බුද්ධිය සෑම විශ්ව නිර්මාණයකටම බලපාන බව දැන් ඔබට

වැටහෙනවා ඇත. සත්ව ලෝකය යනු මහා අපූරු නිර්මාණයකි. ගොඩබිම වාසය කරන කුඹියාගේ සිට දැවැන්ත හස්තියා දක්වා ඇති ජීවීන් වර්ග මිලියන ගණන එකිනෙකට වෙනස් ආකාරයට නිර්මාණය කිරීමට කොතරම් බුද්ධියක් අවශ්‍ය වන්නේ ද? සමනලයාගේ පියාපත් කොතරම් අලංකාර ද? මිනිසා සතුටු කිරීමට මේ නිර්මාණ සිදුකර තිබෙන බව වැටහෙන්නේ ඒ ගැන හොඳින් කල්පනා කළ විට ය. විශ්ව බුද්ධියට කෙසේ ස්තුති කරන්න ද? ජලයේ ජීවත් වන හාල් මැස්සාගේ සිට තල්මසා දක්වා ඇති මිලියන ගණනක මත්ස්‍යයන්ගේ හැඩතල සහ ක්‍රියාකාරීත්වය මොනතරම් අපූරු ද? ඩොල්පින් මත්ස්‍යයා ගැන ඔබ අසා ඇත. මුහුදේ මග පෙන්වන්නා ලෙස විරුදාවලිය ලත් මේ අපූරු මත්ස්‍යයා මුහුදේ අතරමං වන මිනිසුන් ගොඩබිමට ඇරලවන්නේ මිනිසාට අවශ්‍ය ආරක්ෂාව ද සපයමිනි. මේ හැකියාව එම මත්ස්‍යයාට ලැබුණේ කුමන ආකාරයට ද? මේ සෑම සතෙකුටම විශ්ව බුද්ධියේ ආකර්ෂණය ලැබෙන බව අපට සිතිය හැක. ජීවත් වන සෑම සතෙකුම හුස්ම ගැනීම සිදු කරයි. හුස්ම ගන්නා සෑම වාරයක් පාසාම විශ්වය ඔබ හඳුනා ගන්නවා ඇතැයි වරෙක මට සිතේ. **ඕනෑම සතෙකුගේ ක්‍රියාකාරීත්වය ගැන තර්කානුකූලව කල්පනා කරන්න. ඒ සෑම සතෙක්ම ක්‍රියාත්මක වන්නේ මහා පුදුමාකාර වූ ක්‍රමවේදයක් අනුව ය. එම සතුන්ට අවශ්‍ය බුද්ධිය ලැබෙන්නේ වෙනත් මහා බලවේගයක් හරහා බව අපට සිතිය හැකි ය. විශ්වයේ අන්තර්ගත මේ මහා**

**විශ්ව බුද්ධි බලය මිනිස් ශරීරය සැලසුම් කිරීමට යොදාගෙන තිබෙන බව අපට අවබෝධ වන්නේ අප ගැන හොඳින් කල්පනා කරන විට ය.** සත්ව ලෝකයේ සිටින මහා බල සම්පන්නම ජීවියා මිනිසා වේ. අපට ඕනෑම දෙයක් පිළිබඳ තර්කානුකූලව කල්පනා කළ හැකි ය. සිතීමට අවශ්‍ය මනසක් අප සතුව ඇත. වෙනත් කිසිම ජීවියෙකුට අප මෙන් සිතීම කළ නොහැක. මනස උසස්ම (මන + උසස්, මන + උස්, මනුස්සයා) සත්වයා මනුස්සයා හෙවත් මිනිසා ය. **විශ්ව බුද්ධියේ මහා අපූරුම නිර්මාණය මිනිසා වේ. විශ්වය විසින් නිර්මාණය කළ ලෝකය, තවත් ලස්සන කිරීමේ හැකියාව ඇති එකම සතා මිනිසා ය.** ටොන් ගණනක් බර යකඩ ගොඩකින් (ගුවන් යානයකින්) අහසේ පියාසර කරන මිනිසා මැවුවේ කවුද? යකඩ ගොඩක් භාවිත කර (රොකට්ටුව) හඳට යාමට මිනිසාට අවශ්‍ය බුද්ධිය ලැබුණේ කොහෙන් ද? මිනිස් සිතට අවශ්‍ය සිතිවිලි තරංග ලැබුණේ විශ්ව බුද්ධිය හරහා ද? ගිනි පෙට්ටියක් තරම් කුඩා උපකරණ (Telephone) දෙකක් භාවිත කර පෘථිවියේ එක් කෙළවරක සිට අනෙක් කෙළවරට කථා කරන්නේ මුහුණට මුහුණ බලාගෙන කථා කරන්නා සේ ය. මේ මහා විස්මිත නිර්මාණ මෙලොවට බිහි කළේ මේ සුපිරි මිනිසා ය. මිනිස් මොළයේ හට ගන්නා සිතිවිලි තරංග ද්‍රව්‍ය බවට පත් වන්නේ මහා පුදුමාකාර ලෙසට ය. අපට යම් දෙයක අවශ්‍යතාවය දැනෙන විට ඒ දේ ලබා ගැනීමට අවශ්‍ය සිතිවිලි තරංග අපේ මොළය වෙත ගලා එන්නේ අප නොදැනුවත්වම ය. අපට පිපාසය

දැනෙන විට අප වතුර සොයාගෙන ගමන් කරන්නේ අපටත් නොදැනුවත්වම ය. වතුර ලබා ගැනීමට අවශ්‍ය සිතිවිලි තරංග අපේ මොළයේ ක්‍රියාත්මක වී අදාළ අවශ්‍යතාව සම්පූර්ණ කරයි. **අපට අවශ්‍ය දේ අප වෙතට ළඟා කර ගැනීමේ විශේෂ බලයක් මිනිසාට ඇත.** විශ්ව බුද්ධිය මිනිසාට විශේෂ ආදරයක් දක්වයි. මන්ද, විශ්වයට අවශ්‍ය දේ ඉටු කර ගත හැකි එකම සත්වයා මිනිසා නිසා ය. පිපාසය දැනෙන විට වතුර ද කුසගින්න දැනෙන විට ආහාර ද ධනවත් බව අවශ්‍ය විට මුදල් ද ආදී අපේ අවශ්‍යතා සපුරා ගැනීමේ විශේෂ හැකියාව අප සතුව තිබේ. මිනිසාට මුදල් ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් ද තිබෙන අතර එම හැකියාව වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය උපදෙස් මේ පොතෙහි අඩංගු වේ.

ඔබ ගැන, ඔබ හොඳින් කල්පනා කරන්න. ඔබ මෙලොවට බිහිවූයේ කෙසේ ද? ඔබගේ මවගෙන් සහ පියාගෙන් නිකුත් වන බීජ දෙකක එක් වීමෙන් "ඔබ" නැමැති කළලය මවගේ කුසේ හට ගනී. මෙම කළලය ක්‍රමයෙන් වර්ධනය වෙමින් ඔබගේ හදවත, මොළය ඇතුළු සියලු කොටස් වර්ධනය වේ. මෙම සමස්ත ක්‍රියාවලිය සිදුවීමට අවශ්‍ය බුද්ධිය කෙතරම් සුපිරිද? මෙම සමස්ත ක්‍රියාවලිය සැලසුම් කිරීම සිදු කරන ලද්දේ විශ්ව බුද්ධිය බව අපට වැටහෙන්නේ මේ පිළිබඳ අප හොඳින් කල්පනා කරන විට ය. විශ්ව බුද්ධිය මොනතරම් බල සම්පන්න ද? විශ්ව බුද්ධිය

ගැන නිතර ගෞරවයෙන් සිහිපත් කර ස්තුති කරන්න. මෙ
ඔබට මිනිස් ආත්මයක් ලබා දීමට විශ්ව බුද්ධිය කටයුතු ක
ඇති බැවිනි. මිනිසකු ලෙස ඉපදීම ද අප ලද ලොවු
භාග්‍යයකි. **'අංග සම්පූර්ණ මිනිසකු සේ මෙලොව**
**දකින්නට අවස්ථාව මා හට ලබා දුන් විශ්ව බුද්ධියට**
**මම ස්තුතිවන්ත වෙමි'** යනුවෙන් ඔබ නිතර සිතින් සිහිප
පුරුදුවන්න.

ඔබ ඔබේ වටිනාකම ගැන හොඳින් කල්පනා කරන්න
මිනිස් ආත්මයක් ලැබීම ම කොතරම් භාග්‍යයක්ද? විශ්වය
දැක එය අත් විඳීමේ හැකියාව ඇති එකම සත්වයා මිනිසා
ය. ඔබට ද විශ්වයේ ඇති සුන්දරත්වය ගැන කල්පනා කර
සිත ඉතා ප්‍රභාශ්වරව හා බලවත්ව පවත්වා ගත හැකි ය. ඔබ
**වෙතට මුදල් ආකර්ෂණය කර ගැනීමට නම් ඔබේ සිත**
**සන්සුන්ව බලවත්ව පිහිටිය යුතු ය.** සන්සුන් බවට සතුට
අත්‍යවශ්‍ය වේ. සිතට සතුට ලබා ගැනීමට විශ්වයේ ඇති
හාස්කම් දෙස හොඳින් බලා ඒ ගැන ස්තුති කරන්න. ඔබට
මොනතරම් කරදර ප්‍රශ්න තිබුණත් ඔබ විශ්වය ගැන සිතීම
සහ ස්තුති කිරීම අමතක නොකරන්න. ඕනෑම කරදරයක්
හෝ ප්‍රශ්නයක් ඔබ වෙත ආ සැනින් ඔබ විශ්වයේ ඇති
සුන්දර විශ්ව නිර්මාණයක් ගැන මතක් කරන්න. එහි වර්ණය,
සුවඳ හා හැඩය මොනතරම් අපූරු ද? එය නිර්මාණය කළ
විශ්ව බුද්ධියට ස්තුති කරන්න. ඔබ, ඔබ ගැනම සිතන්න.
ඔබට මිනිස් ආත්මයක් ලැබීම මොනතරම් භාග්‍යයක් ද?




ඔබට පරිසරය දකින්න ලැබුණ නෙත් දෙක ගැන සිතන්න. ඔබ අවට ඇති ගස්වැල්, මල්, සත්තු, දිය ඇලි ආදි සුන්දර දේ දැක ඒවායේ රූප ඔබේ මොළය වෙත ගෙන යාමේ සුවිරි කාර්යය සිදු කරන්නේ ඔබේ ඇස් බව ඔබ දන්නවා ඇති. අවදියෙන් සිටින සෑම මොහොතකම ඔබේ ඇස් ක්‍රියාත්මක වේ. දුර ඇති වස්තු සහ ළඟ ඇති වස්තු වෙත ඇස නාභිගත වෙමින් ගතවන සෑම තත්පරයක් පාසාම ගුණාත්මක බවින් ඉතා ඉහළ රූප ලබා ගැනීම මොනතරම් සුවිරි කාර්යයක් ද? ඔබ කෙතරම් වාසනාවන්ත ද? මේ පහසුකම නිර්මාණය කළ විශ්ව බුද්ධියට අප කෙසේ ස්තුති කරන්න ද? ඔබේ දෙනෙත් වසා එය ස්පර්ශ කරමින් ඔබේ දෙනෙත්වලට ස්තුති කරන්න. ඔබේ සිත සතුටින් පුරවන්න. මෙසේම නාසය, දිව, කන, කට ආදී කොටස්වලින් සිදුකරන මහා කාර්ය භාරයන් ගැන හොඳින් සිතන්න. ඔබ පුදුමයට පත් වේවි. මේ කාර්යයන් සිදු කිරීමට මිනිසාට යන්ත්‍ර සෑදිය හැකි ද? යන්ත්‍ර සෑදුවත් ඒවා අක්කර ගණනක් පුරා විහිදන මහා විශාල යන්ත්‍ර වේවි. ඒවායෙන් විශාල ශබ්ද නිකුත් වේවි. කොපමණ විදුලියක් ඒ සඳහා අවශ්‍ය වේ ද? නමුත් නිහඬව ක්‍රියාත්මක වන මිනිස් යන්ත්‍රය කොපමණ අපූරු ද? ඔබේ හදවත ගැන සිතන්න. ඔබ ඉපදුන දා සිට මියයන තුරු සෑම තත්පරයක් පාසාම ක්‍රියාත්මක වන මෙම පොම්පය ඔබේ සෑම සෛලයක් වෙතටම රුධිරය කී වතාවක් පොම්ප කර ඇත් ද? මේවා කෙසේ නිර්මාණය කළා ද? අදටත් ලොව සිටින කිසිදු විද්‍යාඥයෙකුට මේ ගැන සොයා ගත

නොහැකි ය. අප ස්තුති කළ යුත්තේ විශ්වයේ අන්තර්ගත මේ මහා දැනුම හෙවත් විශ්ව බුද්ධියට ය. ඔබට සිතෙන තැනකට ඔබ ගෙනයන ඔබේ පාද කොතරම් විස්මිත නිර්මාණයක් ද? ඔබේ ශරීරය ඔසවාගෙන මාරුවෙන් මාරුවට පාද තබා ගමන් කරන ආකාරය ගැන සිතන්න. ඔබේ අවශ්‍යතාව අනුව වේගය වෙනස් කරමින් ඇවිදීම, දිවීම, පැනීම ආදී විවිධ ක්‍රියා කිරීමේ හැකියාව ගැන සිතන්න. මේවා මහා පුදුම නිර්මාණ වේ. මේ හැකියාව, මේ තාක්ෂණය කොතරම් විස්මිත ද? නිතරම තමාට ලැබුණ මේ සුවිශේෂී ශරීරයට ස්තුති කරමින් තමා ඉතා බලවත් බව සිතන්න. **'මම බලවත් මට එය කළ හැකියි'** යනුවෙන් නිතරම සිතන්න පුරුවන්න. සෑම විටම ඔබ ඔබේ සිත අවදියෙන් තබා ගන්න. ඔබ ජීවත් විය යුත්තේ ඔබේ සිතත් සමගයි. සිත සමග කථාකර සිත ඔබේ යහළුවකු කර ගන්න. **ඔබට ඉන්නා හොඳම මිතුරා ඔබේ සිතයි.** ඔබ මෙය පුරුදු පුහුණු කළ යුතු ය. සිත ඔබේ මිතුරකු බවට පත් කර ගන්නේ කෙසේ ද? මෙහි පළමු කාර්ය වන්නේ ඔබ ඔබේ අවට පරිසරය ගැන හොඳින් නිරීක්ෂණය කිරීමයි. නිරීක්ෂණය කරමින් ඒවායේ ඇති නිර්මාණාත්මක බව සහ ඒවාට භාවිත වී ඇති තාක්ෂණික ක්‍රම සහ ඒවා නිර්මාණය කිරීමට අවශ්‍ය වන බුද්ධිය ගැන සිතන්න. එම වස්තුව නිර්මාණය කිරීමට දායක වූ විශ්වයේ බුද්ධියට ස්තුති කරන්න. මෙය ඔබ පුරුද්දක් කර ගන්න. ලස්සන මලක, අලුත් විදියේ සතෙක්, අමුතු විදියට හැදුන ගසක්, ලස්සනට වලාකුළු විහිදුන අහස, පලින් බරවුණ ගස්,



මවගෙන් කිරිබොන වසු පැටියෙක් ආදී මේ සියලු දේ ඔබේ සතුටට, ස්තුතියට යොදා ගත හැකි ය. මෙම ස්තුතිය පුරුදු පුහුණු කළහොත් ඔබට දවස පුරාම ඉතා සතුටින් කාලය ගත කළ හැකි ය. ඔබේ සිත ප්‍රභාශ්වරව පවතින අතර ඔබ සහ ඔබේ සිත අතර සම්බන්ධය ස්ථාවර වේ. එසේ ස්තුති කරමින් **'මේ දේ අත් විඳින්නට මට ලැබුණ මගේ ශරීරයට ස්තුති වන්ත වෙමි'** යනුවෙන් ද හිතට කියන්න. ඔබට පරිසරය අත් විඳීමට අවස්ථාව හිමි වුණේ ඔබේ ශරීරය නිසා නොවේ ද? විශ්ව නිර්මාණවලට ස්තුති කරන සෑම වාරයක් පාසාම ඔබ ඔබගේ ශරීරයට ස්තුති කරන්න. එවිට ඔබ ඔබගේ සිත සමග බද්ධව වැඩ කරයි. ඔබ ඉලක්ක හඹා යෑම අපේක්ෂා කරන්නේ නම් ඔබ ඒ ගමන යා යුත්තේ ඔබේ සිතත් සමග බව හොඳින් අවබෝධ කර ගන්න. සිත හීලෑ කර ගැනීම ඉතාම අපහසු කාර්යයකි. සිත නිතරම තැනින් තැනට ගමන් කරයි. දවසේ වැඩිම වේලාවක් සිත පවතින්නේ තමාගේ පාලනයෙන් තොරව බව ඔබ දන්නවා ඇති. ගතවන සෑම තත්පරයක් පාසාම අපේ සිත තුළ විවිධ චිත්‍ර මැවේ. බොහෝ විට මෙම චිත්‍ර විවිධාකාරයේ ඒවා වන අතර ඒ එකිනෙක අතර ඇති සම්බන්ධතාව ද නිතර වෙනස් වේ. ඇස්, කන්, නාසය, සම සහ දිව හරහා අපගේ මොළය වෙත පැමිණෙන විවිධකාරයේ දත්ත අපේ සිතිවිලිවලට බලපායි. ඊට අමතරව **ඔබට ද සිත සමග කථා කිරීමේ හැකියාව තිබේ. මේ නිසා ඔබට ඔබව පාලනය කර ගත හැකි අතර ඔබේ ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව ඇත්තේ ඔබ තුළ**

**පමණි.** මේ ගැන ඔබ තනිවම කල්පනා කරන්න. කල්පනා කර සිතේ ක්‍රියාකාරීත්වය ගැන අවබෝධ කර ගන්න. මෙලොවට මිනිසා විසින් බිහි කරන සෑම නිර්මාණයක්ම බිහි වීමට පෙර ඊට අදාළ සිතිවිලි ඒ මිනිසුන්ගේ සිත තුළ බිහි වේ. ඒ සිතිවිලි ද්‍රව්‍ය බවට පරිවර්තනය වන්නේ පුදුමාකාර ලෙසටයි. අපේ අවශ්‍යතාවයට අදාළ සිතිවිලි අප තුළ ජනනය වන්නේ එසේත් නැත්නම් අපේ සිත තුළට ලැබෙන්නේ කෙසේදැයි තවම කිසිවෙක් නොදනී. විශ්වය පුදුමාකාර ලෙස බුද්ධිමත් ය. විශ්වයේ සෑම නිපැයුමකම අන්තර්ගත වූ බුද්ධිය ගැන සිතද්දී එහි ඇති බුද්ධිමත් බව අපට වැටහේ. අප ආශ්වාස කරන ඔක්සිජන් වායුව ගැන සිතන්න. ඔක්සිජන් අනුවක ව්‍යුහය සෑදී තිබෙන්නේ මහා පුදුමාකාර ලෙසටය. ඔක්සිජන් පරමාණු දෙකක් එක් වී ඔක්සිජන් අණුව සෑදේ. එම අණු අප ආශ්වාස කරන අතර අපේ ශරීරයේ රුධිර පද්ධතිය පිරිසිදු කරමින් අපට අවශ්‍ය ශක්තිය ලබා දේ. ඔක්සිජන් පරමාණුවක ව්‍යුහය පහත පරිදි වේ.






ඔක්සිජන් පරමාණුවේ න්‍යෂ්ටිය ප්‍රෝටෝන 8ක් සහ නියුට්‍රෝන 8ක් එක් වීමෙන් සෑදී ඇත. න්‍යෂ්ටිය වටා ගමන් කරන ඉලෙක්ට්‍රෝන 8ක් ද පවතින අතර ඒවාට නියමිත කක්ෂවල මේවා ගමන් කරයි. ඔක්සිජන් පරමාණුව නිර්මාණය වූයේ කෙසේද? මේ සඳහා විද්‍යාත්මක සැලැස්මක් තිබේද? විශ්වයේ කොහේ තිබුණත් ඔක්සිජන් අණුවේ සැකැස්ම එකම වේ. මා උත්සාහ කරන්නේ විශ්වයේ ක්‍රියාත්මක වන මේ මහා බුද්ධිය ගැන තවදුරටත් ඔබට අවබෝධ කර දීමටයි. මිනිසා යනු, විශ්ව බුද්ධියේ තවත් නිර්මාණයකි. එනම්, විශ්ව බුද්ධියේ අංගයකි. විශ්ව බුද්ධිය යන මහා දැනුම් සාගරයේ අප ද ජීවත් වන අතර අපගේ අවශ්‍යතාව අනුව අපට අවශ්‍ය සිතිවිලි විශ්ව බුද්ධිය සමග හුවමාරු වන බව අපට උපකල්පනය කළ හැකි ය. විශ්වයේ ඇති මේ මහා බුද්ධිය ගැන ඔබ දැන්ම විශ්වාස කරන්න. ඔබගේ අවශ්‍යතාවයට අදාළ සිතිවිලි ඔබේ සිත තුළ නිර්මාණය වන බව සහ ඔබේ අවශ්‍යතාවය ඉටු වීමට විශ්ව බුද්ධියෙන් ලැබෙන සහය අති මහත් ය. විශ්ව බුද්ධිය නම් එම මහා බුද්ධියේ උප බුද්ධිය වන්නේ අපගේ මොළයයි. මොළය තුළ සිතිවිලි උත්පාදනය වේ. සිතිවිලි අපව මෙහෙයවයි. අපව ජීවත් කර වන්නේ සිතිවිලියි. සිතිවිලි ඔබගේ මොළය මත බිහි වූ විට එය ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීමේ කාර්යය ද මොළය මගින් මෙහෙයවයි. අපගේ ශරීරයේ ඇති සියලු අංග පාලනය කරනුයේ අපගේ මොළයයි. උදාහරණයකින් මේ ගැන අපි අවබෝධ කර ගනිමු. මා වෙත මුදල් ආකර්ෂණය වන්නේ

කාන්දම් වෙත යකඩ ආකර්ෂණය වන්නා සේය. නමුත් ම
දන්නා බොහෝ දෙනාගේ තත්ත්වය මීට වඩා බොහෝ
සෙයින් වෙනස් ය. මවුන්ගේ සාක්කු හැමදාමත් හිස් ය. මු
මෙය හොඳින් විමර්ශනය කරමින් තොරතුරු රැස් කළෙමි.
මට අවබෝධ වූයේ අප දෙගොල්ල අතර ඇති පැහැදිලි
වෙනසයි. මේ වෙනස ඇති වී තිබෙන්නේ සිතිවිලි වලිනි.
අප දෙගොල්ල සිතන ආකාරය එකිනෙකට වෙනස් ය. ම
එක් අයෙකු සමග කථා කර, ඔහු සිතන ආකාරයේ වෙනස්
සිදුකළෙමි. කෙටි කලකින් ප්‍රතිඵලය වූයේ ඔහුගේ මුදල්
පසුම්බිය පන්දහසේ නෝට්ටුවලින් පිරීයාමයි. සිතිවිලි අපගේ
ජීවිතයේ සාර්ථකත්වයට බලපාන බව මම තේරුම් ගතිමි.
සියලු මිනිසුන් ධනවතුන් නම් ලොව කොතරම් අපූරුද?
දැන් පෙර සඳහන් කළ උදාහරණය බලන්න. මගේ අවශ්‍යතාව
මුදල් ආකර්ෂණය කර ගන්නේ කෙසේද? යන්න ඔබට
කියාදීමයි. අවශ්‍යතාවට අනුව මම පොතක් ලිවීමට තීරණය
කළෙමි. මෙම පොත ලිවීමේ තීරණය ලැබුණේ මගේ
අවශ්‍යතාව නිසා නොවේ ද? 'මුදල් ආකර්ෂණය' නමින්
පොතක් ලියන්න යන සිතිවිල්ල මගේ මොළයට ආවේ
කොහෙන් ද? මේ සිතිවිල්ලට අනුව මම ක්‍රියාත්මක වුණෙමි.
කඩදාසි, පෑන් මා වෙත ආකර්ෂණය විය. අතේ පේශි
ක්‍රියාත්මක වූයේ මොළෙන් ලබා දෙන සංඥාවලට අනුව ය.
මොළයෙන් සංඥා ලබා දෙන්නේ මොළයේ හට ගන්නා
සිතිවිල්ල අනුවයි. මෙහි ලියැවෙන සෑම කරුණක්ම මා
වෙත ලැබෙන්නේ මගේ මොළය හරහා වන අතර මොළයට



සිතිවිලි ලැබෙන්නේ විශ්වයේ තිබෙන්නා වූ මේ මහා විශ්ව
බුද්ධිය හරහා බව මට සිතේ. කිසිම පොතක් අනුකරණය
කර හෝ කට පාඩම් කර මේ පොත මම නොලියමි. මගේ
මොළයට ලැබෙන සිතිවිලි අකුරු බවට පරිවර්තනය වන්නේ
මහා පුදුමාකාර ලෙසිනි. මම මාගේ සිතින් විශ්ව බුද්ධියට
ස්තුති කරමි. සියල්ල වෙනස් කළ හැක්කේ සිතට පමණි.
**ඔබ දුම් පානය කරන්නේ නම් ඔබේ සිතට මේ දැන්
එය සදාකාලිකවම නැවැත්විය හැකිය. ඔබ කළ යුත්තේ
'මම මට ආදරෙයි මගේ පෙනහළුවලට මම ආදරෙයි.
මගේ ශරීරය තුළට යා යුත්තේ හොඳ ගුණාත්මක ආහාර
පමණයි' යනුවෙන් සිතීමයි.** ඔබට දුම් බීමේ අවශ්‍යතාවය
දැනෙනවිට ම මේ ගැන සිතන්න. අනවශ්‍ය සිතිවිලිවලට
වහලෙක් වෙන්න එපා. එවිට ඔබ ඉබේම පාලනය වේ.
නිතරම ඔබේ සිතට ස්තුති කරන්න. **"මගේ හොඳ සිතිවිලි
ඉතා ප්‍රබලයි"** යනුවෙන් සිතන්න. අවශ්‍යතාවය සිතිවිලි
බවට ද සිතිවිලි ද්‍රව්‍ය සේ ක්‍රියා බවට ද පරිවර්තනය වේ. මේ
නිසා ඔබට අවශ්‍ය ද්‍රව්‍ය හිමි කරගැනීමේ හැකියාව ඔබේ
සිතට කළ හැකිය. ඔබට අවශ්‍ය ක්‍රියාවක් ඉටු කර ගැනීම ද
ඔබේ සිතට කළ හැකිය. ඔබේ සිතෙන් ඔබ ඉල්ලන්නේ
හොඳ දෙයක් ද නරක දෙයක් ද යන්න සිත නොදනී. ඔබ
ඉල්ලන දේ ලබා දීම සිතේ කාර්යය බව අවබෝධ කර
ගන්න. ඔබට මුදල් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍යනම් එය
කළ හැක්කේ ඔබේ සිතට පමණි. **ඔබට වෙනස් වීමට
අවශ්‍යනම් මේ දැන්ම එය කළ හැකිය. ඔබේ සිතට**

**ඔබ ගෞරවයෙන් ස්තුති කරන්න. ඔබේ සිත ඔබ යහපත්, ධනවත්, සුවපත් මිනිසකු බවට පත්කරන බව සිතන්න. කල් දැමීමේ පුරුද්ද මේ දැන් සිටම නවත්වන්න.** කල් දැමීම යනු, අපේ ජීවිතය පසු පසට ගමන් කරවන්නාකි. දැන් කළ යුතු දේ මේ දැන්මම කරන්නා මහා ශ්‍රේෂ්ඨයෙකි. සෑම දෙයක්ම දිනා ගැනීමට කැප වී කළ යුතුය. 'මම මේ දැන්ම ක්‍රියාත්මක වෙමි' යනුවෙන් ඉතා ප්‍රබල සිතිවිල්ලක් ඔබේ සිතේ ඇති කර ගන්න. එම සිතිවිල්ල අනුව මේ දැන්ම ක්‍රියාත්මක වන්න.

තීරණයකින් සියල්ල වෙනස් කළ හැකිය. මුදල් ආකර්ෂණය කර ගන්නේ කෙසේද? යන ප්‍රශ්නයට පිළිතුරු බලාපොරොත්තු වන්නේ නම් මේ දැන්ම ඔබ ක්‍රියාත්මක වන්න. මේ පොත කිහිප වතාවක් කියවා මෙහි ඇති සියලු කරුණු ප්‍රායෝගිකව මේ දැන්ම ක්‍රියාත්මක කරන්න. මේ තීරණය ඔබේ ජීවිතය ධනවතෙකු බවට පත් කරවන තීරණය වන අතර මේ මොහොත ඔබේ ජීවිතය "ධනවතකු" බවට පත්කරන මොහොත වනු ඇත.



**මතකයෙන් මැකී යාමට පෙර**

- විශ්වයේ විස්මිත බව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වන්න.
- **විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය**

**මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.**

3 පරිච්ඡේදය

# ආපසු හැරෙන්න බැරිද?

බොහෝ දෙනාගේ ජීවිතය පාලනය කරන්නේ තමන්ගේ කේන්ද්‍රයයි. එසේ නැත්නම් රාහු කාලයයි. එසේත් නැත්නම් නැකතයි. මම මේ විශ්වයේ අවුරුදු දහස් ගණනක් පැවත ආ ශිල්පීය ක්‍රම, එනම්, ජ්‍යෝතිෂය, අංක විද්‍යාව, දෙවි දේවතාවන් ආදි ක්‍රම හැල්ලුවට ලක් නොකරමි. ඒවායේ යම් සත්‍යයක් තිබිය හැකි ය. කිසිම අසත්‍යයක් අවුරුදු දහස් ගණනක් පැවතිය නොහැක. තව ද මේ විශ්වයේ බොහෝ රහස් තවම මිනිසාගේ බුද්ධියට හසු නොවී තිබේ. මේ නිසා මා කිසිදු විට ලෝකයේ අවුරුදු දහස් ගණනක් පැවත එන ශිල්පීය ක්‍රම අසත්‍ය යයි ප්‍රකාශ නොකරමි. නමුත් මේ සියල්ලටම වඩා ප්‍රබල වස්තුව අපේ සිතයි. **තමාගේ සිත තමා පාලනය කරයි. ලෝකයේ පවතින සියලුම බලපෑම් තමාගේ සිතිවිලි හරහා ජීවිතයට ඇතුළු වේ. තමාගේ සිතිවිලි ප්‍රබල නම් කිසිදු බාධාවකට තමාගේ ජීවිතයට ඇතුළු විය නොහැක. එය අවබෝධ කරගත යුතු ය.**

**දෙවියන්, ග්‍රහයන්, ප්‍රේතයන්, හොල්මන් යන සියලු දේ සිත ප්‍රබල මිනිසා ඉදිරියේ දණ නමස්කාර කරයි. සිත ප්‍රබල මිනිසා ඉදිරියේ මේ සියලු දේ පැන දුවන්නේ ආපසුවත් නොබලා ය.** ඒ නිසා ඔබේ සිත ගැන විශ්වාස කරන්න. සිතට සියල්ල සාර්ථකව කළ හැකිය. "ලැබෙන සෑම තත්පරයක්ම සුබයි" යනුවෙන් සිතන්න. "මම ප්‍රබලයි, සාර්ථකයි" යනුවෙන් දැඩිව සිතන්න. ඔබ හුස්ම ගන්නා වාරයක් වාරයක් පාසාම සාර්ථකත්වය ඔබේ ජීවිතයට ඇතුළු වන බව සිතන්න. ඔබ පූජා වට්ටියක් සමඟ දෙවියන් වහන්සේ ඉදිරියට යන්නේ ඔබේ සිත ශක්තිමත් කර ගැනීමට නොවේ ද? මෙය වැරැද්දක් කියා මා පවසන්නේ නැත. නමුත් ඔබ මීට වඩා සාප්‍ර අයෙකු විය යුතු ය. කේන්දර ඔබේ ජීවිතයෙන් ඉවත් කිරීමට තරම් සාප්‍ර සිතක් ඔබට තිබේ. රාහු කාලයේත් සුබ දෙයක් ආරම්භ කළ හැකි සාප්‍ර සිතක් ඔබට තිබේ. නමුත් ඔබ ඔබේ සිතෙන් වැඩ ගනීද? යන්න ප්‍රශ්නයකි. ඔබේ සිත ප්‍රබල කර ගත යුත්තේ ඔබයි. "මේ සියල්ල විශ්ව බුද්ධියේ අවයවයි. මම විශ්ව බුද්ධියට ස්තුති කරමි. **මගේ ශක්තිය මගේ සිතයි. මගේ සිතට සියල්ල කළ හැකි ය. හැම මොහොතක්ම මට සුබයි. මගේ ඉලක්ක ඉටු කිරීම කළ හැක්කේ මගේ සිතටයි. මගේ සිතට ස්තුතියි"** යනුවෙන් සිතන්න. ඔබ ඔබට කියන්න.

මිනිස්සු හඳට යන්න කලින් නැකැත් බැලුව ද? ලෝකයේ ධනවත්ම මිනිසෙකු වන බිල්ගේට් මහතා ඔහුගේ



සමාගම වන ලෝක ප්‍රකට මයික්‍රොසොෆ්ට් සමාගම ආරම්භ කළේ නැකැත් බලල ද? ගෙදරක ප්‍රධාන දොර බස්නාහිර දිශාවට තිබීම අසුබ නම් ටෝකියෝ වැනි ලොව දියුණුම නගරවල ගොඩනැඟිලි කීයක ප්‍රධාන දොරවල් බස්නාහිර දිශාවට තිබේ ද? එම ගොඩනැඟිලිවලට සිදු වී ඇත්තේ කුමක් ද? සිත දුර්වල මිනිසාට මේ සියල්ල බලපායි. සිත ප්‍රබල මිනිසාට මේ කිසිවක් බල නොපායි. අපේ රටේ සිටින දරුවන්ගෙන් 90%කටම අකුරු කියවීමට පෙර නැකතක් බලයි. ඒ නැකතට අනුව අකුරු කියවන දරුවන්ගෙන් කී දෙනෙක් විශ්ව විද්‍යාලයයට ඇතුළුවේ ද? කී දෙනෙක් සාමාන්‍ය පෙළ විභාගය අසමත්වේ ද? ලංකාවේ සිටින විද්‍යාඥයින් ගණන කීයද? ලංකාවේ බොහෝවිට යුවලක් විවාහයට පත්වීමේ දී නැකැත් අනුව සියලු කාර්යයන් සිදු කරයි. මුල්ම ආරාධනා පත්‍රය පිරිනැමීමේ සිට යුවල උත්සවය අවසන් කර පිටව යාම දක්වා සියල්ල සිදුවන්නේ නැකතට අනුවයි. මෙසේ සිදු කළ අය අතරින් කී දෙනෙකුගේ විවාහ ජීවිත අසාර්ථක ද? **ලංකාව තරම් නැකැත් බලන, කේන්දර විශ්වාස කරන, දෙවියන් විශ්වාස කරන වෙනත් රටක් නැති තරම් ය. නමුත් මෙහි ප්‍රතිඵලය වන්නේ සිත ගැන විශ්වාස නොකරන මිනිසුන් පිරිසක් බිහිවීම හා ආත්ම විශ්වාසය අඩු ජනතාවක් බිහිවීමයි. ආත්ම විශ්වාසය ඉහළ පිරිස් බලකාය රටේ දියුණුවට දායක වේ. ඔබ රටේ දියුණුවට දායක වන බලකායට අයත් ද?** දියුණු රටවල මිනිසුන් තම රට දියුණු කරන්නේ ආත්ම විශ්වාසයෙන්

හා දැඩි කැප කිරීමෙන් වැඩ කිරීම තුළින් ය. දියුණු රටව
බොහෝ මිනිසුන්ට කේන්දර නොමැත. ලග්න නොමැ
අපේ රටේ දරුවෙක් මෙලොව දකින විටම, උපන් වේලා
බලා ලග්නයක් ලබා දේ. මෙය සිංහලයන් 99%ක් කර
කාර්යයකි. එතැන් සිට එම දරුවාගේ අනාගතය ගැ
කොළයක ලියයි. ඉන් පසු ඒ දරුවා වර්ධනය වන්නේ
කොළේ ලියා ඇති කරුණුවලට අනුවයි. මන්ද ඒ දරුවාගේ
දෙමාපියන් සහ ඥාතීන්ගේ සිතේ ක්‍රියාත්මක වන්නේ
වේලා පත්කඩේ සඳහන් කර ඇති කරුණුය. ඒ කරුණුවල
අනුව සිත ක්‍රියාත්මක වේ. ඒ සිතිවිලි අනුව ක්‍රියාව සිදු වේ
මෙය සාමාන්‍ය ක්‍රමයයි. නමුත් මෙය කොතරම් ප්‍රායෝගි
ද? ඒ දරුවා වැඩිහිටි තත්ත්වයට පත්වී වයසට යන තුරුම
ලග්නයේ ඵලාඵල කියවමින් කාලය ගත කරයි. සමහ
ලග්නවලට මේ වර්ෂයේ අය 2 වැය 11. මේ ලග්නයට අනු
අය වැය කියවා සිතට එය ගතහොත් සිදු වන අපරාධ
කොපමණ ද? ඔහු හෝ ඇය ඒකාන්තයෙන්ම ණයකාරයෙ
නොවේ ද? මා මෙයින් උත්සාහ කරන්නේ ජ්‍යොතිෂ
බොරුය යන්න ප්‍රකාශ කිරීම නොව ඒවා අප වැළඳගන්න
ආකාරයේ යම් ගැටළුවක් ඇති බව ප්‍රකාශ කිරීමටයි.

මේ මොහොතේ සිට ඔබ වෙනත් බලවේග මත
ක්‍රියා නොකරන සෘජු සිතක් ඇති ප්‍රබල මිනිසෙක් බව සිතන්න
බොහෝ දෙනා මෙම සෘජු තීරණ ගැනීමේ අපහසුතාවයට
මුහුණපායි. ඔබ තනිවම මේ සියල්ල ගැන තර්කානුකූලව



සිතන්න. "මෙවා ඇත්ත, අරයට මෙහෙම වුණා, මෙයාට අරහෙම වුණා" යනුවෙන් ඔබේ සිත තර්ක කරාවි. ඒවා ඇත්ත. මන් ද ඒ අයගේ හිතට ඇතුළුවුණ සිතිවිලි ක්‍රියාත්මක වූ නිසා ඒ අනාවැකි ඉටු වුණා විය හැකිය. නමුත් ඒ අයත් සිත ප්‍රබල කරගෙන ඒ ප්‍රකාශ ප්‍රතික්ෂේප කළා නම් ඒ කිසිදු අනාවැකියක් ඉටු නොවේ. ඔබ සෘජු සිතක් ඇති මිනිසෙක් ද? යන්න තර්කානුකූලව සිතන්න.

**මතකයෙන් මැකී යාමට පෙර**

- විශ්වයේ විස්මිත බව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වන්න.

- විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.

- **ඔබ, ඔබේ සිත හසුරුවන්න. පාලනය කරන්න. මෙහෙයවන්න. ඔබට ඔබ විශ්වාස නම්, ඔබට ඔබේ සිත විශ්වාස නම් කළ නොහැක්කක් නොමැති බව ද මතක තබා ගන්න.**

මහජන පුස්තකාලය
20 MAR 2019
කටුගස්තොට

4 පරිච්ඡේදය

# ඔබ වෙනස් වන්න

විශ්වයේ සිටින සුපිරිම ජීවියා මිනිසායි. විශ්ව බුද්ධිය විසින් මිනිසාට, වෙනත් කිසිදු විශ්ව නිර්මාණයකට වඩා හැකියාවන් හා වරප්‍රසාද ලබා දී තිබේ. මෙයින් අදහස් වන්නේ විශ්ව බුද්ධිය වඩාත්ම කැමති විශ්ව නිර්මාණය වන්නේ මිනිසා බවයි. විශ්ව බුද්ධිය ගැන මෙසේ කථාකිරීමට හැකි වෙනත් කිසිදු ජීවියෙකු මිහිපිට නොමැත. විශ්වයට ආදරය කළ හැකි, එකම ජීවියා ද මිනිසායි. විශ්වයේ ඇති සුපිරිම ග්‍රහ වස්තුවක් වන පෘථිවියේ එනම්, මිහි මත සිටින මිනිසා පෘථිවිය සුරපුරයක් ලෙස අලංකාර කර ගනිමින් නොයෙක් විශ්ව සොයාගැනීම් සිදු කරයි. ගින්දර සොයා ගැනීමේ සිට අති දියුණු නැනෝ තාක්ෂණය දක්වා විවිධ සොයා ගැනීම් මගින් මිනිසා සිය සතුට සහ පහසුව ළඟා කරගෙන සිටින්නේ ඔහුගේ සිතේ බලය නිසා නොවේ ද? අහස උසට නැගෙන ගොඩනැගිලි, ශබ්දයේ වේගය අභිබවා යන ගුවන් යානා ආදී මේ මහා පුදුම නිර්මාණ කරන්නේ බඹයක් පමණ වූ ශරීරයක් සහිත

සුපිරි මනසක් ඇති මිනිසා නොවේ ද? මිනිසාට මේ ස
නිර්මාණ කිරීමට දායක වන්නේ ඔහුගේ සි

මෙලොවට බිහිවන සියලු මිනිස්සු මවගේ කු
මාස 9ක් ගත කරති. මවගේ කුසේ මිනිස් කළලය වැඩෙන්
තරලයක් තුළයි. එනම් මිනිසාගේ මුල්ම අවස්ථාව තරල
තුළ ගත කරයි. ඉන් පසු මෙලොව දකින දරුවා පොළො
සමාන්තරව කාලයක් ගත කරයි. බඩ ගාමින් එහා මෙහා
දරුවා ගත කරන්නේ උරග අවධියකි. මාස කිහිපයක්
වනවිට දණගාමින් ඇවිදින දරුවා සිව්පා අවධිය සිහි
කරවයි. අනතුරුව ක්‍රමයෙන් නැගිටීමට හුරුවන දරුවා දෙ
පයින් ඇවිදීම සිදු කරයි. ඇත් පෘථිවියට ලම්බකව මිනිසාගේ
කශේරුව (කොඳු ඇට පෙළ) පවතී. පෘථිවියට ලම්බක
කශේරුවක් ඇති එකම ජීවියා මිනිසා පමණි. මේ පෘථි
බිහි වූ දා සිට මේ දක්වා ආ අවුරුදු කෝටි ගණනක කාලය
තුළ ජලජ, උරග, සිව්පා සහ දෙපා ලෙස ජීවීන් විකාශන
වී ඇත. මේ යුග හතර ගත කරමින් මෙලොවට බිහිවන
සියලු මිනිසුන් මවගේ කුසේ සිට ජලජ, බඩ ගෑමෙන් උරග,
දණ ගෑමෙන් සිව්පා සහ දෙපා යන යුග හතරම ගත කරන්නේ
කළගුණ දන්නා සහ අතීතය මතක එකම ජීවියා මිනිසා බව
තහවුරු කරමිනි.

එමෙන්ම මෙලොවට බිහිවන සියලුම මිනිස්සු සම
තත්ත්වයක් යටතේ මෙලොව එළිය දකිති. ශරීරය පමණක්



ඇතිව මෙලොවට බිහිවන මිනිසා උපතින් සතයක්වත්, ඇඳුමක්වත් රැගෙන එන්නේ නැත. නමුත් මෙලොවෙන් සමුගන්නාවිට සමහර අයෙකුට කෝටි ගණනක දේපල සහිතව ද තවත් සමහර අය ඉන්න හිටින්නට තැනක් නැතිව ණය බරින් යුක්තව ද සමු ගන්නේ මෙලොවට පැමිණි තත්ත්වයටත් වඩා අඩු තත්ත්වයකිනි. මේ තත්ත්ව දෙක සඳහාම හේතු වන්නේ ජීවත්ව සිටින කාලය තුළ අප විසින් සිදු කරන ලද කාර්ය භාරයයි. සෑම කාර්යයක්ම සිදුකිරීමට බලපාන්නේ මිනිසාගේ සිතයි. සිතිවිලිවල ස්වභාවය ක්‍රියාකාරීත්වයට බලපායි. බොහෝ මිනිසුන් ජීවත් වන්නේ වෙස් මුහුණු පැළඳගෙනයි. ඔවුනු චරිත දෙකක් හෝ වැඩි ගණනක් රඟපාති. පිටට පෙන්වන චරිතය බොහෝ සෙයින් සුන්දර, සත්‍යවාදී සහ සමාජවාදී වුවත් සත්‍ය චරිතය බොරුවලින් පිරුණු, විශ්වාසය බිඳගත්, චරිතවත් නොවූ, අතීතයක් නැති නටබුන් වැනි චරිතයකි. අද සමාජයේ හැසිරෙන බොහෝ මහා චරිතවල ද සත්‍ය එයයි. මේ සියලු රඟපෑම් කළ හැක්කේ ටික කාලයකට පමණක් බව ඔවුන් අවබෝධ කරගෙන නැත. ඕනෑම බොරුවකට හෝ මවා පෑමකට ඇත්තේ කෙටි ආයුෂයි. ඉන් පසු සැබෑ මුහුණ එළි දකින අතර එවිට සියල්ල සිදු වී හමාරය. ඔබ සැම විටම සත්‍යවාදී අයෙකු විය යුතු ය. නිතරම විශ්වාසය රැක ගත යුතු ය. තම පවුලට, හිතවතුන්ට, ගනුදෙනුකාර භවතුන්ට, සේවය ලබන්නන්ට, සේවය ලබා දෙන්නන් හට තම විශ්වාසය තහවුරු වන ආකාරයට කටයුතු කළ යුතු ය. ඔබව හඳුනා

ගැනීමට ඇත්තේ ඔබේ නමයි. නමට වටිනාකමක් ලැබෙන ආකාරයට ඔබ කටයුතු කරන්න. ඔබේ හැසිරීම, ක්‍රියා අවසානයේ එහි ප්‍රතිඵලය ඔබේ නමට එක්වන බව නිතරම සිතන්න. නිතරම සත්‍යවාදී ලෙස කටයුතු කරන්න. සද් තීරණ ගැනීම ඔබේ පෞරුෂය ඉහළ නැංවීමට හේතු වේ. ඔබේ මුවෙන් පිටවන සෑම වචනයකටම වටිනාකමක් තිබිය යුතු ය. ඔබේ වචන අසන අනෙක් පාර්ශවය ඒ වචන කෙරෙහි ඉහළ විශ්වාසයක් ඇති කරගන්නා ලෙස ක්‍රියාකළ යුතු ය. සමාජයේ වෙසෙන සමහර මිනිසුන් කියන වචන ගැන 'තව දොයිතුවක විශ්වාසයක් නෑ' යනුවෙන් පවසන බොහෝ දෙනෙකු ඔබ සමාජයේ දී අත්දැක ඇත. තවත් සමහර අයගේ වචනයකට ඇති වටිනාකම රුපියල් බිලියන ගණනකි. ඔබගේ නමට ඇති වටිනාකම ඔබව ශක්තිමත් කරයි. ඔබ ශක්තිමත් යනු ඔබේ සිත ශක්තිමත් බවයි. සිත ශක්තිමත්ව ස්ථාවරව පවතී නම් ඔබට ඉලක්ක හඹා යෑම පහසු කරවයි. නිතරම වේලාවට වැඩකරන්න පුරුදු වන්න. වේලාවට වැඩ කිරීම ඔබේ නමට වැඩි වටිනාකමක් එක් කරයි. ඕනෑම කාර්යයක් අදාළ වේලාවට පෙර අවසන් කරන්න. එක් තත්පරයක්වත් ප්‍රමාද නොවන්න. ප්‍රමාදය පසුතැවිල්ලට හේතු වන බව ඔබ අසා ඇත. අප සෑම දෙනාටම ඇත්තේ දිනකට පැය 24කි. එනම් තත්පර 86400කි. මිහිපිට ජීවත්වන සෑම මිනිසෙකුගේම ගිණුමට තත්පර 86400ක් බැගින් සෑම දිනකම බැර කරන්නේ විශ්වය සෑම දෙනාටම සම ලෙස කටයුතු කරන බව සනිටුහන් කරමිනි. නමුත් සෑම දිනකම ඔබට ලැබෙන මෙ තත්පර



86400 ඔබ කෙසේ පරිහරණය කරනවා ද යන්න මත ඔබේ ජීවිතයේ සාර්ථකත්වය තීරණය වේ. කාලය අපතේ හැරීම මහා අපරාධයකි. සෑම තත්පරයක්ම නිසි ලෙස සැලසුම් කර ප්‍රයෝජනයට ගන්න. ඔබ නින්දට යාමට පෙර එදා දිනය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ නැවත මෙනෙහි කිරීමක් කළ යුතු ය. එමෙන්ම හෙට දිනය සැලසුම් කරන්න. දිනය සැලසුම් කිරීමට කුඩා කොළයක් භාවිත කරන්න. ඔබ අදාළ කාර්යය නිම කළ පසු ඒ බව ඒ කොළයේ සඳහන් කරන්න. නින්දට පෙර ඒ කොළය ගෙන ඒ පිළිබඳ බැලූවිට සියලු කාර්යයන් නිම කර තිබේනම් ඔබට ලැබෙන සතුට අති මහත්ය. ඔබට ඔබ ආදරය කරන්න. **මෙලොවට ඔබ බිහි වූයේ දුක් විඳින්න නොව සතුටින් සිටීමටයි. සැප සහ සතුට විඳීම ඔබට අයිති වරප්‍රසාදයකි. ඒ වරප්‍රසාදය භුක්ති විඳීම කළ යුත්තේ ඔබ විසින්ම ය. නිසි වේලාවට වැඩ කිරීම, කාලය සැලසුම් කිරීම, කාලය ප්‍රයෝජනයට ගැනීම යන කාරණා සියල්ල ඔබේ ජීවිතයේ සාර්ථකත්වය කරා යන ගමනට අවශ්‍ය ඉන්ධන බව සිතන්න.** මේ දැන් ඔබේ ජීවිතය වෙනස් කරවන තීරණය ගන්න. කුඩා කොළයක් සහ පෑනක් ගෙන හෙට දවසේ ඔබ කරන කාර්යයන් ඒ කොළයේ සටහන් කරන්න. මුලින්ම හෙට දවසේ දිනය ඉහළින්ම සටහන් කරන්න. කාලය අපතේ නොයවා ඒ කාලයේ පොතක් කියවීමටවත් යොදවන්න. දැනුම ඔබේ ජීවිතය සැපවත් කරවයි. **'මගේ හෙට දවස අති සාර්ථක දවසකි. හෙට මට සියල්ල කළ හැකියි.**

**හොඳ සිතිවිලි හා හොඳ මිනිස්සු 'මා වෙත පැමිණෙ මම සාර්ථකව දවස ප්‍රයෝජනයට ගනිමි'** යනුවෙ නින්දට පෙර ඔබේ සිතට කියන්න. එමෙන්ම ඔබට සුව නින්දක් ලැබෙන බව ද හිතන්න. නිදි යහනේ දී බොහෝ දෙනා කල්පනා කරමින් බොහෝ වේලාවක් ගත කරති. සිතන පරිදි ඔබ ඇඳට යා යුත්තේ නිදා ගැනීමටයි. ඇඳ ගොස් විනාඩි කිහිපයක් තුළ නින්ද අපේක්ෂා කරන්න. නිද ගත යුත්තේ විශ්ව බුද්ධියට සහ තමාගේ සිතට ස්තුති කිරීමෙ අනතුරුවයි. රාත්‍රී 10.00 පෙර නින්දට යා හැකි නම් එය ඉතා හොඳ සෞඛ්‍ය පුරුද්දකි. පුළුවන් තරම් උදෑසනින් අවදිවීමට හුරුවන්න. උදෑසන 4ත් 4.30ත් අතර කාලයේ අවදිවීම සුබ දවසක ආරම්භයට හේතු වේ. **උදෑසන අවදිවීම යනු තවත් සුන්දර හිරු උදාවකි. කුරුල්ලන්ගේ නාදය මැද්දේ උදෑසන රන්වන් හිරු කිරණ මිහිමත පතිත වීමේ සුන්දර දවස මට මොන තරම් වටිනවා ද? 'අද දවස මට සාර්ථක දවසක් වෙනවා. අද දවස මට ලබා දුන් විශ්වයට ස්තුතිවන්ත වෙමි'** යනුවෙන් සිතා ඔබේ දෙපා ඇඳෙන් බිමට තබන්න. අවදි වූ සැනින් ඇඳෙන් බැසීම ඉතා හොඳ පුරුද්දකි. ඉන් පසු පිරිසිදු වතුර වීදුරුවක් ඔබේ අත් දෙකෙන්ම අල්ලාගෙන පානය කළ යුත්තේ 'මෙය ලබා දීමට උපකාරී වූ සැම දෙනාටත් මෙය නිර්මාණය කළ විශ්ව බුද්ධියටත් ස්තුතිවන්ත වෙමි' යනුවෙන් ඔබේ සිතට පැවසීමෙන් අනතුරුවයි. ඔබ වතුර පානය කරන සැම මොහොතකම වතුර භාජනය ඔබේ අත් දෙකෙන්ම අල්ලන්න.



එය ජලය හෙවත් විශ්ව පානයට අප දක්වන ගෞරවයකි. ජලය නොමැතිව මිනිසාට ජීවත්විය නොහැක. ජලය මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය වේ. අවදි වී කුස පිරෙන සේ ජලය පානය කර ඔබ පිරිසිදු වන්න. හොඳින් පිරිසිදු වීමෙන් පසු ඔබ විසින් ස්තුති පූජාවක් කළ යුත්තේ ඔබේ සිත සමග කථා කරමිනි. ඔබ ඔබේ සිත සමග කථා කරමින් විශ්ව බුද්ධියට ස්තුති කරන්න. එහි සුන්දරත්වය අත් විඳින්න. ඉන් පසු ඔබේ ශරීරයට ස්තුති කරන්න. ඔබට ලැබුණු මහා බල සම්පන්න මොළයට ස්තුති කරන්න. අනතුරුව ඔබ මෙලොවට බිහි කළ ඔබේ දෙමාපියන්ට, ඔබව හදාවඩාගත් සියලු දෙනාට, ඔබට සෙවණ දුන් සැම තැනකටම, ඔබට දැනුම දුන් ගුරු මෑණිවරුන්ට පියවරුන්ට, ඔබට උදව් උපකාර කළ සහ කරන මිනිසුන් සහ ආයතන වෙත සිතින් ස්තුති කරන්න. මේ ස්තුති පූජාව හොඳින් කරන්න. ස්තුති පූජාව මගින් ඔබේ සිත ශක්තිමත් වන අතර ඔබට ලැබෙන ශක්තිය ද අතිමහත්ය. මේ සඳහා විනාඩි 15ක් පමණ කාලයක් වෙන් කර ගන්න. මුල් කාලයේ දී ඔබ, ඔබේ සිත සමග කථා කරමින් ස්තුතිය කරන විට සිත වෙනත් පැත්තකට ගොස් තිබීමට පුළුවන. කැප කිරීමෙන් මේ කාර්යය කරන්න. ඔබේ සාර්ථකත්වය ආරම්භ වන්නේ හිරු එළිය දකිනා විට මල් පිපෙන්නා සේය. ඔබ හරියට පුහුණු කළ විට ජීවිතයට ස්තුති පූජාව අත්‍යවශ්‍ය වේ.

ස්තුති පූජාවෙන් අනතුරුව ඔබගේ ඉලක්ක (කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන) ඉතා සංක්ෂිප්තව

ඔබේ සිතට කියන්න. ඒ ඉලක්ක වෙත ඔබ ළඟා වී ඔබ ලැබූ විඳින සතුට ගැන මතක් කරන්න 'මම ඒ ඉලක්ක ජය ගනිමි' යනුවෙන් හොඳින් සිතන්න. උදෑසන අවදි වූ පසු ස්තුති පූජාව සමග ඉලක්ක ළඟා කර ගැනීමේ පූජාව අනිවාර්යයෙන්ම කළ යුතු ය. මේ සඳහා ඔබේ නිවසේ හෝ අවට පරිසරයේ ඉතා නිහඬ තැනක් තෝරා ගන්න. හැමදාම එකම තැනක එකම වේලාවට ස්තුති කිරීමට පුරුදු වන්න. ස්තුතිය කරන අවස්ථාවේ දී ඔබේ මනසේ ඒකාග්‍රතාව ඉතා අත්‍යවශ්‍යයි. දවසේ ආරම්භය සුබව ආරම්භ කළ විට මුළු දවසම ඉතා සාර්ථකව ගත කළ හැකියි. සිත සෑම දෙයකටම බලපායි. ඉහත සෑම කාර්යයකින්ම අප බලාපොරොත්තු වන්නේ සාර්ථක ජීවිතයක් ආරම්භ කිරීමට අවශ්‍ය ඔබේ සිත ප්‍රබල කර ගන්නා ආකාරයයි.

ඔබ එදිනෙදා සිදුකරන සෑම කාර්යයක්ම ඉතා අවබෝධයෙන් සිදු කළ යුතු ය. ඒ අදාල කාර්යය සිදු කරන විට ඒ බව සිත දැන ගත යුතු ය. එදිනෙදා ජීවිතයේ අනිවාර්යයෙන්ම අපි ආහාර ගන්නා අතර එය බොහෝ දෙනා කරනුයේ පුරුද්දක් ලෙසයි. නමුත් ඔබ ඊට වෙනස් ලෙස සිතට කථා කර අනතුරුව ආහාර ගන්න. ඔබේ අතට ආහාර වේලක් ලැබුණු පසු මුලින්ම සිහින් ඒ ආහාර සෑදීමට උදව් කළ සෑම දෙනාටම ස්තුති කරන්න. විශ්ව බුද්ධියට ස්තුති කරන්න. ඉන් අනතුරුව ආහාර ගන්න. ඔබ කරන සෑම ක්‍රියාවක් සමගම සිත අවදියෙන් තබා ගත යුතු ය. එවිට



ඔබ කරන කාර්යයේ ප්‍රතිඵලය ඉතා ඉහළ වේ. ඕනෑම දෙයක් මෙහෙය වන්නේ ඔබේ සිත නිසා, කරන කාර්යය පිළිබඳව සිත දැනුවත් කළ යුතු ය. මෙ සෑම අවස්ථාවකින්ම මා ඔබට කියන්නට උත්සාහ කරන්නේ ඔබ මෙහෙය වන බලවත් වස්තුව ඔබේ සිත බවයි. ඔබේ සිත සමග හොඳින් කථා කරන්න. සිතට ස්තුති කරන්න. ප්‍රශංසා කරන්න. එවිට ඔබේ සිතත් ඔබව සාර්ථක අයෙකු බවට පත් කිරීමට අවශ්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කරයි.

තවද ඔබේ සිත ස්ථාවරව සාර්ථකව පවතින විට එහි ප්‍රබල බව වැඩිවේ. සිතට ඇතුළුවන දත්ත අනුව සිත කිලිටි විය හැකිය. **දුක, වෛරය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, තරහ වැනි සාධක මේ සඳහා බලපායි. සිත සැහැල්ලුවට පත්කරවන සිතිවිලි සහ සිත පීඩනයට පත් කරවන සිතිවිලි ලෙස සිතිවිලි වර්ග දෙකකි. ඍණ සිතිවිලි නිතර සිත පීඩනයට පත් කරවයි. ධනාත්මක සිතිවිලි සිත සැහැල්ලු කරවයි. නිතර තරහ කේන්තිය ගන්නා අයගේ සිත ඉතාමත් පීඩනයට ලක් වී තිබේ. කුඩා සිදුවීමකදී වුව කිපෙන අය අප නිතර දැක ඇත. 'හොස්ස ළඟින් මැස්ස ගියත් ඇති' යනුවෙන් අප කියන්නේ ඒ අයටයි. කේන්තිය ක්ෂණික ක්‍රියාවකි. නමුත් තරහ යනු දිගු වේලාවක් පුරා පවතින තත්ත්වයකි. ඇයි ඔබ කේන්ති ගන්නේ? කේන්තිය යනු කිසිම ප්‍රයෝජනයක් නැති නිෂ්ඵල ක්‍රියාවකි. ඔබ නිතර කේන්ති**

**ගන්නෙක් නම් මේ දැන්ම ඔබට ක්ෂාන්ති යන්නේ ඇයි යනුවෙන් සිතා ඒ ගැන අවබෝධ කර ගන්න. 'මින්පසු මම සිනා සෙමින් තැන්පත්ව කටයුතු කරනවා'** යනුවෙන් තමාගේ සිතට හොඳින් කියන්න. ක්ෂාන්තියක් හට ගැනීමට අදාළ සිදුවීමකදී මෙ ගැන සිතා සිතට ස්තුති කරන්න. ක්ෂාන්තියේ ප්‍රතිඵලය විශාල අලාභයකි. එසේ නැත්නම් සිත් තැවුලකි. අලාභ වීම හෝ සිත් තැවුල ඇති වීම යහපත් මිනිසෙකුට අදාළ නොවන කාරණා වේ. ක්ෂාන්තිය පැමිණි විගස එය මොළයේ හට ගන්නා සිතිවිලිවල වර්ධනය ක්ෂණිකව වෙනස් වේ. එහි ප්‍රතිඵලය ශරීරයේ රුධිර පද්ධතියට, පේශි පද්ධතියට, ස්නායු පද්ධතියට බලපෑම් ඇති කරයි. ඇඟ වෙව්ලා දත්මිටි හපන අය අප බොහෝවිට දැක ඇත. **සාර්ථකත්වය සඳහා සිත සන්සුන්ව තිබිය යුතු ය. සිත නිතර ව්‍යාකූල තත්ත්වයට පත් වුවහොත් සාර්ථකත්වය එම ජීවිතවලින් පැන යයි.** සමහර අය තරහ වී අවුරුදු ගණනක් ගත කරති. ඔබ හිතන්න එසේ ඔබ තරහ වන්නේ ඔබේම සිත සමග නොවේ ද? තවත් අයෙක් ඔබ සමග තරහ වුවහොත් ඔබ ඒ අය වෙතට ගොස් කථා කර විහිළුවක් කර ඔහුගෙන් සමාව ගන්න. සමහරවිට ඔබ අතින් කිසිදු වැරැද්දක් සිදු නොවුණා විය හැකි ය. නමුත් අනෙක් අයගෙන් ඔබ සමාව අයැද සිටියහොත් ඒ අයට ඔබත් සමග තරහ වී සිටිය නොහැකි ය. එක අතකින් ඔබේ සිතට දැනෙන සහනය ද අනෙක් අතට අනෙක් මිනිසාගේ සිතට දැනෙන සහනය ද කියා නිම කළ නොහැකි ය. ඔබ



ක්ෂාන්ති නොගන්නෙකු ද තරහ නොවන්නෙකු ද වේ. **සෑම විටම ඔබේ මුහුණට සිනහව එක්කර ගන්න පුරුදුවන්න. එවිට ඔබට අනෙක් මිනිසුන් ආදරය කරනු ඇත. ක්ෂාන්තිය නිසා තරහ ඇති වේ. තරහ දුරදිග ගියහොත් ඇති වන්නේ වෛරයකි. වෛරය මහා භයානක සිතිවිලි වර්ගයකි. ඔබ ආපස්සට ඇද දමා අසාර්ථකයෙකු බවට පත් කිරීමේ හැකියාව වෛර සිතිවිලිවලට තිබේ. වෛරයට ඇති එකම බෙහෙත සමාව දීමයි. සමාව දීමේ පුරුද්ද මහා උතුම් මිනිස් ගුණාංගයකි.** මේ උතුම් ගුණාංගය ඔබ පුරුදු පුහුණු කරන්න. සමාව දීම තුළින් ඔබට ලැබෙන බලය කියා නිම කළ නොහැකි ය. සමාව දීමෙන් පසු ඔබේ සිතට දැනෙන සහනය වචනවලින් විස්තර කළ නොහැකි ය. වෛරය තව දුරටත් ඉදිරියට ගියහොත් ඇතිවන්නේ පළිගැනීමයි. පළිගැනීමට පෙර වෛරය ද වෛරයට පෙර තරහ ද තරහට පෙර ක්ෂාන්තිය ද වේ. ක්ෂාන්ති ගන්නා අවස්ථාවේදීම ඔබට එය වැළැක්විය හැකිනම් එය ඔබේ සිතට කරන මහත් ගෞරවයකි. ක්ෂාන්ති නොගැනීම ඔබේ සිත සන්සුන්ව තබා ගැනීමට උපකාරී වේ. සාර්ථකත්වය කරා ගමන් කරන ඔබ ක්ෂාන්ති නොගන්නා අයෙකු විය යුතු ය. පළිගැනීම ආත්ම අතර පවා ඇති බව සමහර ජාතක කථා තුළින් අප අසා ඇත. සේරිවාණිජ ජාතක කථාවේ එන කපටි වෙළෙන්දා හොඳ වෙළෙන්දාගෙන් පළිගන්නේ, "ඉපදෙන සෑම අවස්ථාවකදීම මම සතුරෙක් වෙමි" යනුවෙනි. ඊට අදාළ සිදුවීම මුළු එකකි.

වරදත් තමා අතේම ය. රන් තැලිය කපටි ලෙස ලබා ගැනීමට කළ උත්සාහය වැරදුන විට ඔහුට කේන්ති ගියේ ය. ඉන් පසු හොඳ වෙලෙන්දා සමග තරහ විය. හොඳ වෙලෙන්දා අල්ලා ගැනීමට ඔහු දිව ගියේ සිතේ වූ වෛරය සමගිනි. නමුත් ඔහු මේ වනවිට සිටියේ ගඟ මැදයි. ඉන් පසු වැලි අහුරක් වළ කරමින් වෛරය තහවුරු කරන ලදී. කේන්තිය, තරහ, වෛරය සහ පළිගැනීම සාර්ථකත්වය අපේක්ෂා කරන ඔබගේ ජීවිතයෙන් ඈත් කරන්න.

ඊර්ෂ්‍යාව අද සමාජයේ වෙසෙන බොහෝ දෙනා අතර ඇති තවත් සෘණ සිතුවිල්ලකි. වෙනත් කෙනෙකුගේ දියුණුව හෝ හැකියාව දැක ඒ ගැන ඊර්ෂ්‍යා සහගත සිතිවිලි ඇති කර ගැනීම බොහෝ දෙනෙක් කරන කාර්යයකි. අලුත් වාහනයක් ගතහොත්, ගෙයක් හැදුවහොත්, ලස්සන ඇඳුමක් ඇන්දොත් ඒ දිහා සතුටින් බැලිය හැක්කේ සුළු දෙනෙකුට පමණි. බොහෝ දෙනා ඊර්ෂ්‍යා කරමින් පසු තැවෙති. ඊර්ෂ්‍යා කිරීම වෙනුවට සතුටු වීම ඔබේ සිතට හුරු කරන්න. ඔබට වඩා දියුණු සැම දෙනාටම ඔබ ස්තුති කරන්න. හොඳ වාහනයක් දැක ඒ වාහනයට සිතින් ස්තුති කරන්න. වාහනය අයිති අයට ද සිතින් ස්තුති කරන්න. තව තවත් දියුණුවට පත්වේවායි සිතින් සිතන්න. එවිට ඔබේ සිත ඉතා සැහැල්ලුවට පත් වේ. ඔබ වෙත විශ්ව ආසිරි ගලා ගෙන ඒ. ඔබේ අසල්වැසියෙක් ගෙයක් සෑදීමට පටන් ගතහොත් ඔහුට හෝ ඇයට සුබ පතන්න අමතක නොකරන්න. හැකි සෑම



අවස්ථාවකම ඔහුට හෝ ඇයට උදව් කරන්න. සිතින් ඔහු හෝ ඇය ගෙදර හදන විදිය, ගෙට පදිංචි වන විදිය ගැන සිතන්න. අසල්වැසියාගේ සතුට ඔබ ප්‍රාර්ථනා කරන්න.

මම මගේ වාහනයෙන් ගමන් ගන්නාවිට මා ඉදිරියෙන් මට වඩා හොඳ වාහනයක් ගමන් ගන්නේනම් මගේ සිතෙන් ඒ වාහනයට හා එහි ගමන් ගන්නා අයට ස්තුති කරමි. එමෙන්ම ඉදිරියෙන් යන වාහනය පසුකර යෑමට මට අවශ්‍ය වුවහොත් ඒ අයගෙන් සමාව ගැනීමට මගේ සිත පුරුදුව සිටී.

ඔබගේ යහළුවා ඔබට වඩා දියුණු නම් ඒ යාළුවාගේ දියුණුව තව තවත් ඔබ අපේක්ෂා කරන්න. ඒ යාළුවාගේ ඉදිරි ගමනට ඔබේ සිතිවිලි දායක කරන්න. ඔබට වඩා දියුණු යහළුවන් ආශ්‍රය කිරීමට පුරුදු වන්න. එවිට ඔබද එම යහළුවන් මෙන් දියුණුව කරා ගමන් කරයි. සෑම සාර්ථක අයෙකුගේම සිත ඉතා ප්‍රබල වේ. ඒ මිනිසුන් සාර්ථක වූයේ දැඩි කැප කිරීම තුළිනි. සෑම විටම අනෙක් මිනිසුන්ට සිතින් ආදරය කරන්න. ඔවුන්ගේ දියුණුව ප්‍රාර්ථනා කරන්න. නිතරම සිත ප්‍රීතියෙන් තබා ගැනීමට පුරුදු වන්න. එවිට ඔබ වෙත පැමිණෙන සෘණ සිතිවිලි විකර්ෂණය වේ. සෘණ සිතිවිලි ඔබේ සාර්ථකත්වයට බාධා ඇති කරයි. සඳ, තාරකා, නිල් අහස, දිය ඇලි, ගස් වැල්, මල්, කුරුල්ලන්, සතුන්, මිනිසුන් සහ ඔවුන්ගේ සාර්ථකත්වය, ඔබට සතුටු විය හැකි කාරණා වේ. නිතරම විශ්ව නිර්මාණ දෙස විශේෂිතව බැලීමට පුරුදු

වන්න. ඒවායේ අපූරු බව අත් විඳින්න. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වැනි සෘණ සිතිවිලි ඔබ ප්‍රතික්ෂේප කරන්න.

තව ද එදිනෙදා ජීවිතයේදී ඔබ කටයුතු කරන වි නොයෙකුත් මිනිසුන් මුණ ගැසේ. ඔවුහු ඔබ සමග නොයෙ දේ ගැන කථා කරති. ඕපදූප, කරපු කියපු දේ ආදී දේ අතර වේ. මේ කුණු ඔබ භාර ගතහොත් ඔබට අවශ්‍ය ඉලක්කයට යැමට එය බලපෑමක් ඇති කරයි. කවුරු මොනව කීවත් ඒවා ඔබ භාර නොගන්න. එකවර විශ්වාස නොකරන්න. වචන කීපයකින් මිනිස් ජීවිත පවා නැති වි හැකිය. ඔබ සැලෙන්නෙකු නොවිය යුතු ය. නිතරම ඒකාග්‍ර අරමුණකින් ජීවත් වන්න. සෑම මොහොතකම ඔබ ඔබේ ඉලක්කය ගැන සිතන්න. බාහිරින් ඔබේ කනට ලැබෙන වචන කීපයකින් ඔබේ ගමන වෙනස් වේ නම් ඔබ සදු අයෙකු නොවේ. හරියට මඩේ සිට වූ ඉත්තක් වැනි ය. ඔබට තවත් අයෙකු කියන ඕපදූපයක සත්‍ය බව 1%ක් බව සිතන්න. ඉතිරි 99% ම බොරු නිසා මට මෙය අදාළ නොවේ යනුවෙන් සිතන්න. ඔබ ඔහුට සවන් දුන්න ද ඉන් කිසි වචනයක්වත් මොළය තුළට ඇතුළත් කරගත යුතු නැත. පසුව ඔවුන්ගෙන් සමුගෙන ඔබ යන්නේ, "මට මගේ ඉලක්කය සියල්ලටම වඩා උතුම්" යනුවෙන් ඔබ ඔබේ සිතට කියා ගනිමිනි. බොහෝ දෙනා සිතන්නේ ඔවුන්ගේ සිත් තුළ තිබෙන දේවල් තවත් අයෙකුගේ හිතට පැවසීමය. එයින් බොහෝ දෙනා තෘප්තියක් ලබති. ගම්බද ප්‍රදේශවල



මෙය බොහෝවිට දැක ගත හැකිය. කඩ පිල්වල, නාන ළිඳ ළඟ, සවස් කාලයේ ගෙදරින් ගෙදරට යන අය මේ ඕපදූප පතුරුවති. එක් අයෙකුගේ වරදක් තවත් අයෙකුට කීමෙන් කිසිම ප්‍රතිඵලයක් නැත. අනෙක් අය කරන කියන කිසිම දෙයක් තමාට අදාළ නොවේ. නගරබද ජීවත්වන්නෝ අසල්වැසි නිවෙස්වල මිනිසුන් ගැනවත් නොදනිති. ගමට වඩා නගරය දියුණු එනිසාවෙනි. මැලේසියාව, සිංගප්පූරුව ආදී දියුණු රටවල් සමග සම්බන්ධව මගේ සමාගම් වෙළෙඳ කටයුතු සිදු කරයි. මගේ එක් සමාගමක සේවයට වෙන් කර ඇති මැලේසියාවේ සුපිරි නිවසක මම මැලේසියාවට ගිය පසු නවාතැන් ගනිමි. මා එහි ගිය වාර ගණන බොහෝ ය. එම සුපිරි නිවස පිහිටා ඇත්තේ මැලේසියාවේ අග නගරයේ සිට කිලෝ මීටර දෙකක් ඇතුළත ය. නිවාස 800කින් සමන්විත එය තට්ටු 23කින් සමන්විත සුපිරි නිවාස සංකීර්ණයකි. ආරක්ෂක භටයින් රැකවරණය සපයන එය පිහිනුම් තටාක, ක්‍රීඩාංගන ආදී පහසුකම්වලින් සමන්විතය. නමුත් කිසිදු වතාවක එහි වාසය කරන කිසිම කෙනෙකු මා සමග කථා කර නැත. ඔවුන් සියලු දෙනා තමතමන්ගේ වැඩ කර ගන්නා අතර අනෙක් අය කරන කිසිම දෙයක් දෙස බලන්නේ නැත. ඒ රටේ දියුණුවට හේතුව එයයි. ඔබත් මෙය පාඩමක් කර ගන්න. ඔබට අනෙක් පුද්ගලයන් කරන කියන කිසිවක් අදාළ නොවේ.

ඔබ කළ යුත්තේ ඔබේ අරමුණු ඉටු කර ගැනීමට අදාළ කාර්යයන් පමණි. ඔබට ඇස්, කන්, නාසය, දිව සහ සම යන පංච ඉන්ද්‍රිය ලැබී ඇත්තේ මොළයට අවශ්‍ය දත්ත ඇතුළත් කර ගැනීම සඳහා ය. ඔබේ පංච ඉන්ද්‍රියන්ගෙන් ලැබෙන දත්ත ඔබේ මොළයට ගමන් කරයි. මොළය ඒ දත්ත සැකසීම සිදුකර එය ක්‍රියාවට නංවයි. **ඔබේ මොළයේ වැඩ කරන ප්‍රධානතම වැඩ සටහන විය යුත්තේ ඔබේ අනාගතයේ ඔබ සපුරා ගන්නා ඉලක්කයයි. මොළයට ලැබෙන වෙනත් කිසිදු දත්තයකින් මේ ඉලක්කගත වැඩ සටහනට බලපෑමක් ඇති කළ නොහැකි බව ඔබ සිතන්න.** ඔබ පාරක ගමන් කරන විට වාහන දෙකක් ගැටී මහා විශාල අනතුරක් සිදුව ඇතැයි සිතන්න. ලාංකික බොහෝ අය කරන්නේ මේ අනතුර ළඟට ගොස් මේ ගැන තොරතුරු සොයා බලා ඒ ප්‍රශ්නය තමන්ගේ කර ගැනීමයි. පැය ගණනක් එහි කාලය ගත කර ඒ සියලු විස්තර සිතේ ගබඩා කර ගැනීමට අමතක නොකරයි. ඉන් පසු මුණ ගැසෙන සෑම දෙනෙකුටම ඒ ගැන කියමින් ඒ අයගේ කාලය ද නාස්ති කර ඒ මිනිසුන්ගේ සිතට එම බර පටවයි. එක දිනකින් මෙය අවසන් නොවන අතර දින ගණනක් යනතුරු මෙය ප්‍රචාරය කරයි. නමුත් මෙහි ප්‍රතිඵලය කුමක් ද? ඒ මිනිසාගේ හැසිරීම කොතරම් අනුවණ ද? ඔහුගේ වේලාව නාස්ති කරමින් අදාළ නොවන සෘණ සිතිවිලි රැසක් සිතට දමා ගෙන මේ සිදු කරන අනුවණ ක්‍රියාවෙන් ඔහුගේ ජීවිතයට කිසිම ප්‍රයෝජනයක් ඇති නොවේ. ඔබත් මෙවැනි බොහෝ දේ කර තිබෙනවා ඇති. මින් ඉදිරියට තමාට අදාළ නැති, වේලාව



නාස්ති කරන සිද්ධි හා සම්බන්ධ නොවන්න. අනුන්ගේ කුණු තමාට දමා ගැනීමෙන් වළකින්න. ඇස් දෙකෙන් දැක්ක පළියටවත්, කනට ඇහුණ පළියටවත් යමක් විශ්වාස නොකරන්න. යමක් විශ්වාස කිරීමට පෙර ඒ සිදුවීම ගැන තර්කානුකූලව සිතන්න. තීරණය නිවැරදිව ගන්න. කලබලවීම පසුතැවිල්ලට හේතු වේ. පංච ඉන්ද්‍රියන්ගෙන් ලැබෙන දත්ත මොළයට ඇතුළත් වේ. මොළය එම දත්තවලට අනුව ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. මෙම ප්‍රතිචාර පාලනය කිරීමේ හැකියාව අපට තිබිය යුතුයි. අපේ සියලු ප්‍රතිචාර හෙවත් හැසිරීම පාලනයකට යටත් විය යුතු ය. සෑම හැසිරීමක් ගැනම දෙවතාවක් හොඳින් සිතින් සිතන්න. කලබලවීමේ ප්‍රතිඵලය අති භයානකය. පාඩුව, හැර යාම, තරහ වීම, නැති වීම මෙහි ප්‍රතිඵල විය හැකි ය. මේ සියලු අවස්ථා අපව පහත් කරවන අවස්ථාවන් ය. ඔබේ මුවෙන් පිටවන වචන නැවත ආපස්සට ගත නොහැකි ය.

ඔබේ මුවෙන් පිට කරන වචනයෙන් ආදරය, සිනහව, ප්‍රීතිය, අභිමානය, විශ්වාස වැනි අවස්ථා එය සවන් දෙන්නා තුළ ඇති කළ හැකිය. එමෙන්ම තරහා, ක්‍රෝධය, වෛරය, පළිගැනීම, ඇඬීම, ආත්ම ගරුත්වය නැති කිරීම ආදි අවස්ථා ද ඇති කළ හැකිය. නිතරම අඩුවෙන් කථා කර වැඩියෙන් සවන්දීමට හුරුවන්න. සාර්ථක මිනිසා හොඳින් සවන්දෙයි. හොඳින් සවන් දීමේ පුරුද්ද මහා උතුම් ගුණාංගයකි. ඔබේ මුවෙන් පිට වන වචන ගැන දැඩි අවධානයෙන් සිටින්න. ඔබට වචනයක් භාවිතකර නවත

අයෙකු සමග තරහ විය හැක. නමුත් ඔබට ඔහුව මිත්‍ර කර ගැනීමට කොපමණ වෙහෙසක් ගත යුතු ද? කොපමණ වචන ගණනක් භාවිත කළ යුතු ද? තවද ඔබ අනෙක් අය සමග කථා කිරීමේ දී ඔහුට ගෞරවයෙන් කථා කරන්න. ඔහුට සවන් දෙන්න. ගෞරවනීය ලෙස ආමන්ත්‍රණය කරන්න. එකට එක කියවා ගැනීමෙන් වළකින්න. සමහර අවස්ථාවල දී ඔහු ඔබට පවසන විස්තරය බොරු එකක් විය හැකිය. ඒ කාරණය නිවැරදි නොවන බව ඔබ නියතවම දනී. එහෙත් මිනිසුන් ඉදිරියේ ඔහුව විවේචනය නොකරන්න. ඔබට ඔහු නිවැරදි කිරීමට අවශ්‍යනම් ඔබ එය කළ යුත්තේ පෞද්ගලිකව ඔහුව මුණ ගැසීමෙන් අනතුරුව ඉතාම සුහද ආකාරයට එය අවබෝධ කර දෙමිනි.

ඔබට මිනිසෙකු මුණ ගැසුණවිට චාම් සිනාවකින් ඔහුව පිළිගන්න. සමහරවිට ඔහුව මුණ ගැසෙන ප්‍රථම දිනය විය හැකිය. සිනහවට වෛරය, ක්‍රෝධය, තරහ යනාදිය යටත්ය. සිනහව ඉදිරියේ ඒවා යටපත් වේ. ඔබ සිනහ වන්නේ විශ්ව බුද්ධිය විසින් මවන ලද ඒ සුපිරිම මිනිසාටයි. ඔබ එය විශ්ව බුද්ධියට කරන ගරු කිරීමකි. අනෙක් අයගේ දුකට අප පිහිටවිය යුතුය. නමුත් ඒ දුක ඔබේ දුකක් නොවේ. හැකි සෑම අවස්ථාවකම මිනිසුන්ට උදව් කරන්න. දුක වේදනාව සහ කුස ගින්නට අප විශේෂයෙන් අවධානය යොමු කර පිහිට විය යුතු ය. යම් අයෙකුට පිහිටට අප ඉදිරිපත් විය යුත්තේ පෙරළා උදව් බලාපොරොත්තුවෙන් නොවේ. උදව් කිරීම



පමණක් සිතේ සතුටට හේතු වේ. අපි සෑම දෙනාම ජීවත්වීමේ කලාව ඉගෙන ගත යුතු ය. ඔබ ආශ්‍රය කරන අය ගැන හොඳ අවබෝධයක් තිබිය යුතු ය. ඔවුන්ගේ සිතුම් - පැතුම්, හැසිරීම ආදී විස්තර අවබෝධ කරගැනීමේ හොඳ විශ්වසනීය මිත්‍රත්වයක් ගොඩනගා ගත හැකි ය. මිනිසුන් සමග තරහ නොවන්න. ඕනෑම තරාතිරමක පිරිස් ආශ්‍රය කිරීමේ හැකියාව ද තිබිය යුතු ය. ඔබ වටා ඉන්නා මිනිසුන්ගේ ආදරය ඔබට ලැබිය යුතු ය. ඒ අයගේ ආසිරි ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට මහත් සේ උපකාරී වේ.

මා මේ පරිච්ඡේදයෙන් උත්සාහ කරන්නේ ඔබට දැන් සිටිනවාට වඩා වැඩි වටිනාකමක් එක් කිරීමටයි. මේ පොත කියවන ඔබේ අරමුණ වන්නේ මුදල් ඔබ වෙතට ආකර්ෂණය කර ගැනීමයි. එනම්, ධනවතෙකු බවට පත් වීමයි. ඔබට මුදල් ආකර්ෂණය වීමට නම් ඔබ තුළ අදාළ ආකර්ෂණ ශක්තිය තිබිය යුතු ය. ආකර්ෂණ ශක්තිය ලැබෙන්නේ සිත හරහාය. ඔබේ සිතිවිලි ඔබ වෙත මුදල් ආකර්ෂණය කර දෙනු ඇත. සිත නිතරම ප්‍රභාශ්වරව, ධනාත්මකව පැවතිය යුතු ය. එය සෑම මොහොතකම එකම රිද්මයෙන් පවත්වා ගත යුතු ය. බොහෝ දෙනා ධනාත්මක චින්තන පොත් කියවා සඟරා කියවා දේශනවලට සවන් දී ඒ මොහොතේ වෙනස් වී ප්‍රතිඵල අත්කර ගනිති. විවිධ කතෘවරු, විවිධ දේශකවරු මිනිසාගේ සාර්ථකත්වය උදෙසා විවිධ පොත්පත්, විවිධ දේශන විවිධාකාරයෙන් ඉදිරිපත් කර

තිබේ. ඒ සියල්ල සිදු වන්නේ මිනිසාගේ සාර්ථකත්වය උදෙසා බව අමතක නොකරන්න. ඒ සියලු දෙනා හරහා මෙලොවට දායාද වූ සෑම දේකටම අප ස්තූති කළ යුතු ය. නමුත් ඔබ ඒ මොහොතට වෙනස් වී ටික කලකින් ඒ ශිල්පීය ක්‍රම බැහැර කර යළිත් සාමාන්‍ය ලෙස කාලය ගත කරයි. නමුත් මා මේ පොත හරහා ඔබ වෙත ගෙන එන කරුණු ඔබේ ජීවිතයේ පුරුදු ලෙස භාවිත කරන්න. එකම ක්‍රියාවක් එකම වේලාවට එක දිගට දින 14ක් (දින ගණන පුද්ගලයා මත වෙනස් වේ) කළහොත් එය පුරුද්දක් බවට පත් වේ. ඔබ උදෑසන 4ට දින 14ක් එක දිගට අවදි වන්න. 15 වන දිනයේ ඒ වේලාවට ඉබේම ඔබ අවදි වන්නේ එය පුරුද්දක් බවට පත් වෙමිනි. ඕනෑම ක්‍රියාවක් පුරුද්දක් බවට පත් කර ගත හැකි ය. මෙහි සඳහන් කරන කරුණු ඔබ ක්‍රියාවක් ලෙස ආරම්භ කරන්න. එය එක දිගට දින 14ක් කරන්න. මෙය නොවරදවාම එක දිගට කිරීමට අවශ්‍ය දැඩි තීරණය ඔබ විසින් ගත යුතු ය. ඔබේ සිතට මේ ගැන හොඳින් කියන්න. 'මේ ක්‍රියාව මට පුරුද්දක් බවට පත් කරන්න' යනුවෙන් සිතට කියා ස්ථිර අධිෂ්ඨානය ඇතිව දින 14ක් කරන්න. එවිට ඔබේ සිත එය පුරුද්දක් ලෙස භාර ගෙන 15වන දිනයේ සිට ස්වයංක්‍රීයව මේ ක්‍රියාව සිදු කරයි. ඔබ කරන පුරුදු ගැන ඔබ කල්පනා කරන්න. ඒ පුරුදු ඔබට පුරුදු වූයේ කෙසේදැයි සිතන්න. මෙතෙක් ඔබට මුදල් ආකර්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රම කිසිවක් ඉදිරිපත් කර නැත. එයට හේතුව ඔබ මුදල් ආකර්ෂණය කරන ශිල්පීය ක්‍රම හසුරුවන්නට පෙර එයට අදාළ පසුබිම



ඔබ සහ ඔබේ සිත තුළ තිබිය යුතු ය. මෙහි ඇති කරුණු පුරුදු ලෙස එක් කර ගනිමින් ධනවතකු වීමේ මූලික සූදානම සපුරා ගන්න. ධනවතෙකු වන ඔබ, සුපිරි සහ සතුටු ජීවිතයකට හිමිකම් කියයි. ඒ නිසා අදම ක්‍රියාත්මක වන්න.

දැන් ඔබ ඔබට ආදරය කිරීමට පුරුදු වන්න. ඔබට මේ සුන්දර විශ්වය දකින්න, අත් විඳින්න අවස්ථාවක් ලැබී තිබේ. මිහිපිට ඉන්න විශිෂ්ටතම ජීවි කොට්ඨාසයේ සාමාජිකත්වය ලැබී තිබේ. මේ අවස්ථාව ඔබට ලැබීම පිළිබඳ සතුටුවන්න. ඔබ නිතරම ඔබ ගැන ස්තූති කරන්න. **"මගේ සුපිරි මොළයට මම ස්තූතිවන්ත වෙනවා. ඇස්, කන්, නාසය, දිව, සමට මම ආදරෙයි. ස්තූතියි. මගේ අත්, මගේ දෙපා මට උදව් කරනවා ස්තූතියි. මගේ හදවත මගේ පිරිසිදු රුධිරය ශරීරය පුරාම ගමන් කරවනවා. මගේ හදවතට ස්තූතියි. මගේ පෙනහළු, ආමාශය, වකුගඩු, මුත්‍රාශය මාව ජීවත් කරවනවා. මගේ ශරීරයේ ඇති සියලු අවයව සුපිරියි. ස්තූතියි. මගේ ශරීරයට මම ආදරය කරනවා. මා වෙත සතුට සාර්ථකත්වය ආකර්ෂණය වෙනවා. ලැබෙන සෑම තත්පරයක්ම මට සුබයි. මම සාර්ථකයි. ස්තූතියි"** යනුවෙන් ඔබේ සිතට දිනකට අවම වශයෙන් පස් වතාවක්වත් කියන්න පුරුදුවන්න. එවිට ඔබේ ජීවිතය අවදි වී සරුබව සොයා ගමන් කරන්නේ ඔබට සතුට හිමි කරමිනි.

ඔබට ඔබ ආදරය කරයි නම් ඔබේ ශරීරය හොඳින් පිරිසිදුව තබා ගන්න. ඔබ ගැන සමාජය දකින්නේ ඔබේ බාහිර ස්වරූපයෙනි. ඔබේ බාහිර ස්වරූපය ද ඔබට වටිනාකමක් එක් කරයි. ඔබට හොඳටම ගැලපෙන ආකාරයට ඔබේ කොණ්ඩය පීරන්න. කිසිම විටකවත් එය අවුල්ව තබා නොගන්න. කොණ්ඩය නියෝජනය කරන්නේ ඔබේ හිසයි. හිස තුළ ඔබේ මොළය පිහිටයි. ඔබ මෙහෙයවන්නේ ඔබේ මොළයයි. මේ නිසා ඔබේ හිසට ඔබ විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු ය. මේ නිසා කොණ්ඩය ඉතාම පිළිවෙලට තබා ගැනීම ඔබ ඔබේ මොළයට කරන ගරු කිරීමකි. පිරිමි ළමයින්ගේ කනට කරාබු උචිත නොවේ යයි මට හැඟේ. සෑම විටම පිරිසිදුව ඔබේ ශරීරය තබා ගන්න. නිය පොත්තේ සිට සෑම කොටසක්ම පිරිසිදුව තබා ගන්න. ඔබේ ශරීරය පිරිසිදු නම්, පිළිවෙල නම් ඔබේ සිතත් පිරිසිදුය, පිළිවෙලය. සිතට නැවුම් බව ලබා දිය හැක්කේ ඔබට පමණයි.

ඔබේ ශරීරයට ඔබ අන්දවන ඇඳුමින් ඔබ තවත් අලංකාර කරවයි. ඒ නිසා ඉතා පිරිසිදු, ලස්සන, මැදපු ඇඳුම් ඔබට ඔබ අන්දවන්න. ඒ වගේම ඔබේ දෙපාවලට ගැලපෙන පාවහන් පළඳවන්න. ඔබට වටිනාකමක් ලැබෙන සේ අලංකාර ලෙස ඔබේ ශරීරය නිතරම සරසා තබන්න. සුවඳ ආලේප කිරීම ඔබට තවත් වටිනාකමක් එක් කරයි. ඔබ සමාජයට ප්‍රිය විය යුතු ය. ඔබගෙන් හමන සුවඳට සමාජය ප්‍රිය කළ යුතු ය. ඔබ ගමන් කරන මාර්ගයෙනුත් ඔබේ සුවඳ



හැමිය යුතු ය. ඔබේ පිළිවෙල ඔබේ වටිනාකමෙ එක් ආභරණයකි. තව ද ශරීරයට හානිදායක කිසිවක් ඔබ පාවිච්චියට නොගන්න. ඔබ දුම් පානය කරයි නම් ඒ ගැන මඳම කල්පනා කරන්න. ඔබ දුම් වැටිය උරා එහි ඇති දුම් ඔබේ මුවෙන් ඔබේ පෙනහලු තුළට ඇතුළු කරවයි. ආපසු ඒ දුම් නැවත ඔබේ නාසයෙන් සහ කටින් පිට කරයි. මෙයින් ඇත්තටම ඔබට ඇති ආස්වාදය කුමක් ද? ඔබේ සුපිරි පෙනහලු දුමෙන් පිරෙන විට පෙනහල්ලට ඇති වන බලපෑම කෙතරම් ද? හරියට කෙසෙල් කැනකට දුම් ගසන විට ඉදෙනවා සේ ඔබේ පෙනහල්ලට දුම් ඇතුළු කිරීම කෙතරම් නරක ක්‍රියාවක් ද? ඔබ මේ ගැන හොඳින් කල්පනා කරන්න. මත්ද්‍රව්‍ය ද එසේමය. මත්ද්‍රව්‍ය ශරීරයේ ආමාශයට ගිය පසු ඒවා ඔබේ රුධිරයට ද එක් වේ. ඒ රුධිරය සෑම රුධිර නාලිකාවක් හරහාම ගමන් කරයි. ඔබේ හදවත, මොළය ඇතුළු සියලු අවයව හරහා මෙම මත්ද්‍රව්‍ය මිශ්‍ර වූ රුධිරය ගමන් කරයි. මේ මත්ද්‍රව්‍යවල ඇති විෂ රසායනික ද්‍රව්‍ය නිසා ඔබේ මොළයේ ක්‍රියාකාරීත්වය වෙනස් වී ඔබේ පියවි සිහිය විකෘති වේ. ඔබත් මේ ගැන කල්පනා කර මේ දැන්ම තීරණය ගන්න.

සමහර අය සූදුවට හුරු වී සිටිති. සූදුව යනු ඔබ උපයන මුදල් ඔට්ටුවකට තැබීමයි. ඔබ මුදල් උපයන්නේ සතුටින් ජීවත් වීමටයි. මුදල් ඔබ ළඟට ගෙන්වාගත යුත්තේ යහපත් මාර්ග හරහායි. සූදුවෙන් ඔබට ලැබෙන මුදල් සාධාරණ

මුදල් නොවේ. සාධාරණ මුදල් ඔබව සතුටින් තබයි. ඔබව හැර නොයයි. මුදල් වට්ටු ඇල්ලීම යනු ඔබ මුදල්වලට කරන නින්දාවක් බව සිතන්න. මෙසේ සමාජයේ මිනිස් ජීවිතයට උචිත නොවන විවිධ වූ පුරුදුවලට ඔබ ඇබ්බැහි වී සිටී නම් ඒ ගැන හොඳින් සිතන්න. ඔබේ හැගීම්වලට නිතරම දෙවැනි තැන දෙන්න. පළමුව ඔබේ ශරීරයට ආදරය කරන්න. නරක පුරුදු සියල්ල මේ දැන්ම අත හරින්න. එම දැඩි තීරණය මේ දැන්ම තීන්දු කරන්න.

ඔබ ආශ්‍රය කරන ඔබේ මිතුරන්ගෙන් ද ඔබේ ජීවිතයට බලපෑම් ඇති වේ. හොඳ මිතුරන් පමණක් ළඟින්ම ආශ්‍රය කරන්න. ඔබේ හොඳම මිතුරා හෝ මිතුරන් පිළිබඳ දැන්ම ඔබ විමසිලිමත් වන්න. ඔබ ආශ්‍රය කරන ළඟම යහළුවා විවාහක නම් ඔහුගේ හෝ ඇයගේ පවුල් ජීවිතය ඉතා සාර්ථක එකක් විය යුතු ය. ඔහුගේ හෝ ඇයගේ ලෝකයේ අංක එක ඔවුන්ගේ පවුල් ජීවිතය විය යුතු ය. ඔබගේ යහළුවා ඔහුගේ පවුලට දැඩිව ආදරය කරන්නෙකු විය යුතු ය. සිය බිරිඳ හෝ ස්වාමියා ඇතුළු තමන්ගේ පවුල් ජීවිතයට ආදරය නොකරන කිසිදු යාළුවෙක් ඔබේ ළඟම යහළුවෙක් බවට පත් කර නොගන්න. තම පවුලට ආදරය නැති කිසිවෙක් තමන්ට ද ආදරය නැති බව සිතන්න. ඔබේ යාළුවා තවම විවාහ වී නැත්නම් ඔහුගේ හෝ ඇයගේ ලෝකයේ අංක එක විය යුත්තේ දෙමාපියන් ය. සිය දෙමාපියන්ට ද ආදරය නැති යහළුවා ළඟම යාළුවෙක් නොකරගන්න. මේ ගුණාංග ඇති යහළුවෙකු නොමැතිනම් හුදෙකලාව වෙසෙන්න.



මා මෙතෙක් ඔබට ඉදිරිපත් කරන ලද්දේ ඔබ විශ්වයට ගැලපෙන හොඳ මිනිසෙකු බවට පත් වීමට අවශ්‍ය කරුණු ය. ලොව දියුණු කළේ මිනිසා ය. කුඩා සිදුවීමකින් මහා පෙරළියක් කරන මිනිසුන් ගැන ඔබ අසා ඇත. මිනිසකුට තම ජීවිතය වෙනස් කර ගැනීමට ගත වන්නේ සුළු මොහොතකි. ඒ සඳහා බලපාන තීරණ ප්‍රමාදයකින් තොරව ස්ථිර අධිෂ්ඨානයකින් ගන්න. විශ්වයේ ඇති මහා බල සම්පන්න විශ්ව බුද්ධි බලය ගැන අවබෝධ කරගෙන මහත් ගෞරවයෙන් විශ්ව බුද්ධි බලය පිළිබඳ විශ්වාසය තබන්න. ඔබේ සිත විශ්ව බුද්ධි බලයෙන් එක් උප අංශුවකි. විශ්ව බුද්ධි බලය තුළ මිනිස් සිත් කෝටි ගණනක් පවතී. ඊට අමතරව ගස්වැල්, සතුන්, ගංගා, සාගර, පර්වත ආදී මහා නිර්මාණ ද මේ විශ්ව බුද්ධි බලය තුළ අන්තර්ගත වේ. විශ්ව සැලසුම් බුද්ධි බලය නිසායි, අඹ ගසකින් අඹම ලැබෙන්නේත් කොස් ගසකින් කොස්ම ලැබෙන්නේත්. කොස් ගෙඩිය තුළ කොස් මදුලු එහි ඉරි අතර හිර කර සුරක්ෂිතව තැන්පත් කර එය වටා කටු සහිත තද පොත්තකින් ආවරණය කර තිබේ. මේ නිර්මාණය සැලසුම් කළේ කවු ද? මේ සියල්ල විශ්ව බුද්ධි බලයේ මහිමයෙන් බිහි වී ඇති නිර්මාණයි. විශ්ව බුද්ධි බලය අප ජීවත්වන පෘථිවියේ පමණක් නොව සූර්ය ග්‍රහ මණ්ඩල, චක්‍රාවාට, මන්දාකිනි ඇතුළු මුළු විශ්වය පුරාම විසිරී පැතිරී ඇති අසීමිත ශක්තියකි. සූර්යා වටා අපේ පෘථිවියට එක් වටයක් ගමන් කිරීමට දින 365ක් සහ පැය 6ක් ගත වන්නේ එනිසාවෙනි. මෙය කවදත් එකම අගයකි.

පෘථිවිය තමා වටාම එක් වටයක් යාමට පැය විසි හතරක් ගනී. මේ සැලැස්ම විශ්ව බුද්ධි බලයේ සැලැස්මකි. ඔබ ජීවත් වන්නේ විශ්ව බුද්ධි බලය තුළයි. ඔබට විශ්ව බුද්ධි බලයෙන් සැඟවී කිසිවක් කළ නොහැකි ය. ඔබ හුස්ම ගන්නේ විශ්ව බුද්ධි බලයේ නිර්මාණයක් වන ප්‍රාණ වායුව හෙවත් ඔක්සිජන් වායුවයි. ඔබ හුස්ම ගන්නා වාරයක් පාසා, ඔබේ හදවත ස්පන්දනය වන වාරයක් පාසා ඔබ හා විශ්ව බුද්ධිය අතර සම්බන්ධයක් ගොඩනැගේ. ඔබ විශ්ව බුද්ධි බලයෙන් මිදීමට නම් ඔබේ හදවතේ ස්පන්දනය නැවතිය යුතු ය. මේ නිසා ඔබටත් හොරා ඔබ ගැන සොයන මහා විශ්ව බුද්ධිය බලය ක්‍රියාත්මක බව හොඳින් මතක තබා ගන්න. විශ්ව බුද්ධියේ අවධානය ඔබ වෙතට ලබා ගැනීමට අවශ්‍යනම් ඔබ යහපත් මිනිසෙකු විය යුතු ය. ඔබ යහපත් නම් විශ්ව බුද්ධි බලයට ගෞරව කරයි නම් විශ්ව බුද්ධි බලයේ නිර්මාණවලට ආදරය කරයි නම් විශ්ව බුද්ධි බලය ඔබට ද ආසිරි ලබා දේ. ඔබ ගසක කොළයක්වත් කැඩීම නොකළ යුතු ය. ගස්වැල්, ඒවායේ ඵලදාවට ආදරය කරන්න. ඒවා ස්පර්ශ කරමින් ස්තුති කරන්න. මන්ද ගස් හා විශ්ව බුද්ධිය අතර සම්බන්ධය ඉතා ඉහළ සම්බන්ධයක් බැවිනි. මිනිසා විශ්ව බුද්ධි බලය ඉදිරියේ වැරදි කර විශ්වාසය බිඳ ගත්තත් කිසිදු දිනක ගස්වැල් විශ්ව බුද්ධිය ඉදිරියේ එලෙස විශ්වාසය බිඳගෙන නැත. මේ නිසා ඔබ ගස්වැල් සඳහා විශේෂ ගෞරවයක් ලබා දිය යුතු ය. අප ඔක්සිජන් වායුව ආශ්වාස කර අනතුරුව ප්‍රශ්වාස කරන කාබන්ඩයොක්සයිඩ් නැමති



විෂ වායුව ගස්වැල් ආශ්වාස කරයි. හිරු එළිය සමඟ එක් වී අපට අවශ්‍ය ආහාර නිපදවයි. බලන්න, විශ්ව බුද්ධි බලය ගස්වැල් සාදා තිබෙන්නේ පරිසරයට අහිතකර කාබන්ඩයොක්සයිඩ් විනාශ කිරීමටයි. එමෙන්ම මිනිසාට අවශ්‍ය කරන ඔක්සිජන් සහ ආහාර නිපදවීමටයි. සත්‍ය ලෙසම ශරීරය යනු මහා සුපිරි කර්මාන්තශාලාවකට එහා ගිය සුපිරිම නිර්මාණයක් වේ. තවද විශ්ව බුද්ධියේ ඇති සියලු අවයව එකට සම්බන්ධව ක්‍රියාත්මක වේ. මේවා එකිනෙකට සම්බන්ධ වී ජාලයක් ඇති වේ. මේ පිළිබඳව ඉදිරියේ දී දීර්ඝව සාකච්ඡා කරනු ලැබේ. මා මෙයින් අදහස් කරන්නේ ඔබ ජීවත් වන්නේ විශ්වය පුරා විහිදුනු මහා බලසම්පන්න විශ්ව බුද්ධි බලයට යටත්ව බවයි. විශ්ව බුද්ධි බලයට අප සියලු දෙනා යටත් වන, අධීක්ෂණය වන අතර මහා සුපිරි විශ්ව ජාලයක් ද අප සම්බන්ධව ක්‍රියාත්මක වේ. මා හට මේ පොත ලිවීමට අවශ්‍ය කරන සිතිවිලි තරංග විශ්ව ජාලයෙන් ලැබෙන බව මම විශ්වාස කරමි. මිනිස්සු නින්දේ දී මහා පුදුමාකාර සිහින දකිති. නින්දේ දීත් අප මේ ජාලයට සම්බන්ධ නිසා නොයෙක් සිතිවිලි තරංග අප සිතට පැමිණ මහා පුදුමාකාර දර්ශන අපට සිහින වශයෙන් පෙන්වයි. එකම මොහොතක දී පෘථිවියේ මිනිසුන් මිලියන ගණනක් නිදා ගන්නා අතර ඔවුන්ට පෙනෙන සිහින විවිධාකාරයේ ඒවා වේ. ඔබ ගසක් සමග කතා කිරීම ආරම්භ කළහොත් ගස ඔබටත් කතා කරන්න පටන් ගන්නේ එයට ආවේණික භාෂාවෙනි. ඔබ සමග එය මිත්‍ර වී ඔබට ඊළඟට

වන යහපත හෝ කරදරය පිළිබඳව එය ඉඟි පහළ කරයි. වැස්සක් වසින්න කලින් වැහි ලිහිණියන් පියාඹන්නේ විශ්ව බුද්ධි බලය හරහා එම කුරුල්ලන්ට අදාළ පණිවිඩය ලැබෙන නිසාවෙනි. විශ්වයේ පවතින සෑම නිර්මාණයක් දෙසම විශ්ව බුද්ධි බලය බලා සිටී.

**ඔබට හැකි සෑම විටම විශ්ව බුද්ධි බලයට ස්තුති කිරීම ඔබේ ජීවිතයට එක්කර ගන්න. උදෑසනින්ම අවදි වී හොඳින් පිරිසිදු වී විශ්ව බුද්ධි බලය සමග කථා කරන්න. අවම වශයෙන් පැයක්වත් විශ්ව බුද්ධි බලය සමග හොඳින් සම්බන්ධව කථා කරන්න. ඔබේ රුධිරය හදවත හරහා ගමන් කරන වාරයක් පාසාම රුධිරයට සාර්ථකත්වය එකතු වන බව සිතන්න. හදවත ඔබේ රුධිරයට සාර්ථකත්වය මිශ්‍ර කරන උපකරණයක් බව සිතන්න. ඔබ තබන පියවරක් පියවරක් පාසා සාර්ථකත්වයේ සත් පියුම් පිපෙන බව සිතන්න. ඔබේ සුපිරි අතින් සිදුකරන සෑම කාර්යයක්ම සාර්ථකයි, ඔබේ මුවින් නිතරම පිටවන්නේ සාර්ථකත්වයේ වචනයි, යනුවෙන් සිතන්න. මගේ සිත ප්‍රබෝධමත්, මගේ සිත ප්‍රභාශ්වරයි, සෑම මිනිසෙකුම සාර්ථක වේවා, දියුණු වේවා, සෑම දෙනෙකුගේම බලාපොරොත්තු ඉටු වේවා** යනුවෙන් සිතන්න. ඉදිරියේ දී මුදල් ආකර්ෂණය වන ක්‍රම විස්තර කරන අතර විශ්වය සමග කථා කරන ආකාරය පැහැදිලි කර දෙමි.



ඔබ ඊළඟ පරිච්ඡේදය කියවීමට පෙර මෙතෙක් ලියා ඇති කරුණු තව වතාවක්වත් කියවන්න. ඉදිරි පරිච්ඡේදයට පෙර ඔබ වෙනස් වී සිටිය යුතුමය. ඔබ නැවුම් විය යුතුමය. නිතරම සිනහව ඔබේ මුහුණට එක්කර ගන්න. අනෙක් මිනිසුන්ගේ ආදරය, කැමැත්ත ඔබට හිමි බව සිතන්න. ඔබේ සිත යහපත් පුරුදුවලින් පුරවා ගත යුතුය. අනෙක් අයගේ දියුණුව දැක සතුටු විය යුතුය. දියුණුවන අයට තව තවත් සැප සම්පත් ආකර්ෂණය වේවායි, සිතින් ප්‍රාර්ථනා කරන්න. වෙනත් අයගේ වචනවලට හෝ ක්‍රියාවලට ඔබ නතු නොවන්න. කේන්තිය, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ඔබට තහනම් වන අතර ඔබට නොගැළපෙන ස්ථානවලින් වහාම ඉවත් වන්න. නොගැළපෙන අය සමග අදහස් හුවමාරු නොකරන්න. ප්‍රතිපත්ති ගරුකව වැඩ කරන්න. විවේචනවලට හොඳින් සවන් දීමට පුරුදුවන්න. තීරණ ගැනීමට පෙර කීප වරක් ඒ ගැන සිතන්න. කේලාම් කීම මහා භයානක අපරාධයකි. ඔබට එල්ලවන අභියෝග ජයග්‍රහණය කරා යොදවා ගන්න. ඔබේ සිත ගැන දැඩිව විශ්වාස කරන්න. සිතට සියල්ල කළ හැකිය. ඔබේ අනාගතය සරු සාරව සාර්ථක වන බව දැඩිව විශ්වාස කරන්න. ඔබේ අනාගතය අදම සැලසුම් කරන්න. දිනකට පස් වතාවක්වත් ඔබේ සිත සමග කථා කරන්න. විශ්ව බුද්ධි බලයට ස්තුති කරන්න. ඔබ ඔබේ ශරීරයට ආදරය කරන්න. ශරීරයේ ඇති සෑම අංගයකටම ස්තුති කරන්න. ඔබ ඉතා පිරිසිදුව ඉන්න. පිරිසිදු ඇඳුම් පිළිවෙලට අඳින්න. සිනාව ඔබේ මුහුණට බද්ද කරන්න.

දවසම ප්‍රීතියෙන් ගත කරන්න. දවස පුරාම ඔබ ඔබේ සිත සමග අවබෝධයෙන් කටයුතු කරන්න. දවස ආරම්භ කළ යුත්තේ ඉතාම සතුටිනි. ඔබට තව දවසක් උදාකර දුන් විශ්ව බුද්ධියට ස්තුති කරන්න. ඔබ නින්දට යා යුත්තේ ඉතාමත් සතුටු සිතිනි. දවස සාර්ථක කර ගැනීමට උදව් වූ සිත ඇතුළු සියලු දෙනාට සිතින් ස්තුති කරමින් හෙට අදටත් වඩා සුබ දවසක් ලබා දෙන මෙන් ඔබේ සිතින් ඉල්ලන්න. ඔබ මේ දක්වා පැවසූ කරුණු වඩා හොඳින් සිතේ තැන්පත් කරගෙන ඒ අනුව ජීවිතය මෙහෙය වන්න.



**මතකයෙන් මැකී යාමට පෙර**

- විශ්වයේ විස්මිත බව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වන්න.

- විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.

- ඔබ, ඔබේ සිත හසුරුවන්න. පාලනය කරන්න. මෙහෙයවන්න. ඔබට ඔබ විශ්වාස නම්, ඔබට ඔබේ සිත විශ්වාස නම් කළ නොහැක්කක් නොමැති බව ද මතක තබා ගන්න.

- **ඔබ වෙනස්වන්න. ඔබ ලැබූ මිනිස් ජීවිතයට ගරු කරන්න. ඔබ සාර්ථක මිනිසෙකු වීම ලැබූ ජීවිතයට ගරු කිරීමකි.**

5 පරිච්ඡේදය

# ආකර්ෂණ බලය

ආකර්ෂණ බලය යනු ඇද ගැනීමේ බලයයි. එක් වස්තුවක් මගින් අනෙක් වස්තුව ඇද තබා ගනී නම් එතැන ආකර්ෂණ ශක්තිය ක්‍රියාත්මක වේ. විශ්වයේ ඇති සෑම වස්තුවක්ම ආකර්ෂණ ශක්තියට යටත්ව පවතී. විශ්වයේ සැරිසරන සෑම ග්‍රහ වස්තුවක්ම එකිනෙකට ආකර්ෂණය වෙමින් ගමන් කරයි. අප සූර්යග්‍රහ මණ්ඩලය ගැන සිතන්න. සූර්යයා වටා ගමන් කරන ග්‍රහවස්තු ඒවාට අදාළ පථවල ගමන් කරන්නේ සූර්යයාට ආකර්ෂණය වෙමිනි. සූර්යයා මගින් ඒ වටා ගමන් කරන සියලුම ග්‍රහ වස්තු ඇද තබා ගනී. මෙලෙස විශ්වයේ ඇති කෝටි ගණනක් වන සූර්යග්‍රහ මණ්ඩල විවිධාකාරයේ ආකර්ෂණ බල යොදාගෙන සැරිසරයි. අප සූර්යයා වටා ගමන් කරන පෘථිවිය ද මේ ආකර්ෂණ බලයට යටත් වී ඇත. පෘථිවිය මත තිබෙන සෑම වස්තුවක්ම ආකර්ෂණ බලයට හසු වී ඇති අතර ආකර්ෂණ බලයෙන් මිදී සැරිසැරීම කිසිම අයෙකුට කළ නොහැකි ය.

පෘථිවියේ ජීවත්වන අප සැම දෙනාම පෘථිවියේ ගුරුත්වාකර්ෂණ බලයට යටත්ව ජීවත් වේ. පෘථිවියේ ඇති අනෙක් සියලුම වස්තූන්ද ගුරුත්වාකර්ෂණ බලයට යටත් වේ. එනම්, ආකර්ෂණය යනු ඇදී යෑමයි. ගසකින් ගෙඩියක් ගැලවුණු පසු එය පොළව මතට පතිත වන්නේ එම ගෙඩිය පොළව මගින් ඇදගන්නා නිසාවෙනි. මේ නිසා එම ගෙඩිය පෘථිවියට ආකර්ෂණය වේ.

අප උඩ පැන්නොත් බිම වැටේ. ඒ පෘථිවිය මගින් අපව ඇද තබාගන්නා නිසයි. මේ ආකර්ෂණ බලය මිනිසා තුළ ද ක්‍රියාත්මක වේ. මේ ආකර්ෂණ බලය මිනිසා තුළ හැසිරෙන්නේ මහා පුදුමාකාර ආකාරයටයි. ඔබේ සාර්ථකත්වයට ආකර්ෂණ බලය යොදා ගත හැකිය. මෙතැන් සිට ඉදිරියට මා සාකච්ඡා කරන්නේ ඔබ තුළ ඇති මේ මහා ආකර්ෂණ ශක්තිය ගැනයි. මෙය මෙතෙක් ඔබ හඳුනා නොගත් ඔබ තුළ ඇති මහා බල ශක්තියකි. මේ මහා විශිෂ්ට බල ශක්තිය ඔබ හොඳින් හඳුනා ගන්න. මේ මහා ආකර්ෂණ බල ශක්තිය යොදවා ඔබට සිතන දේ කළ හැකිය. සාර්ථකත්වයේ රහස වන්නේ ඔබ තුළ ඇති මේ මහා බල ශක්තිය අවුලවා එය නිසි ආකාරයට යෙදවීමයි. බොර තෙල් යනු, පොළව අභ්‍යන්තරයේ ගබඩා වී ඇති ඛනිජ ද්‍රව්‍යයකි. මෙය ගොඩට ගෙන නිකම්ම තැබුවහොත් එයින් කිසිම ප්‍රයෝජනයක් නොමැත. නමුත් මේ බොර තෙල් පිරිසිදු කර



ලබා ගන්නා ඩීසල්, පෙට්‍රල්, ගෑස් යනාදිය මොනතරම් කාර්යයක් සිදු කරයි ද? තට්ටු සිය ගණනක් උසට වොත් දහස් ගණනක් ඔසවා දෙන දොඹකරවලට ශක්තිය දෙන්නේ ඒ ඩීසල් නොවේ ද? වාහන දහස් ගණනක් ඔසවාගෙන මහා මුහුදේ ගමන් කරන නැව්, මිනිසුන් දහස් ගණනක් ඔසවාගෙන ගමන්කරන දුම්රිය, මිනිසුන් සිය ගණනක් ඔසවාගෙන ශබ්දයේ වේගයෙන් ගමන් කරන ගුවන් යානා, මහා පස්කඳු පෙරලන ඩෝසර්, විදුලි බුබුළු ලක්ෂ ගණනක් දල්වන විදුලි ජනක යන්ත්‍ර ආදි විවිධ වූ යන්ත්‍ර සඳහා අවශ්‍ය ශක්තිය ලබා දීමේ මූලිකයා වූයේ පොළව යට තැන්පත්ව තිබූ බොරතෙල් නොවේ ද? නමුත් බොර තෙල් මේ කිසිවක් සඳහා භාවිත කළ නොහැක. බොර තෙල් පිරිපහදු කිරීමෙන් මේ මහා යන්ත්‍රවලට අවශ්‍ය ඉන්ධන ලබා දේ. මිනිසා සතුව ඇති ආකර්ෂණ ශක්තියත් බොරතෙල් හා සමාන ය. මේ ආකර්ෂණ ශක්තිය ඔප දැමීමෙන් ලැබෙන බලය උපයෝගී කරගෙන මුදල්, ගොඩනැගිලි, යාන වාහන ආදී ඔබට අවශ්‍ය දේ ඔබ වෙතට ආකර්ෂණය කර ගත හැකි ය.

පෘථිවියේ ඇති සැම වස්තුවකම එම ආකර්ෂණ බලය ක්‍රියාත්මක වේ. පෘථිවියේ ඇති ඕනෑම වස්තුවක් නිර්මාණය වන්නේ මූල ද්‍රව්‍ය එක්වීමෙනි. පෘථිවියේ ඇති මූල ද්‍රව්‍ය ගණන 113ක් වේ. අප දකින සැම දෙයක්ම සෑදෙන්නේ මේ මූල ද්‍රව්‍ය 113හි යම් ආකාරයක සංයෝග වීමකිනි. මේ සැම මූල ද්‍රව්‍යයක්ම සෑදෙන්නේ පරමාණු එක්වීමෙනි. මේ නිසා

මිනිසා ඇතුළු විශ්වයේ මෙතැම නිර්මාණයක් පරමාණු මිලියන ගණනක එකතුවක් ලෙස හැඳින්විය හැකි ය.

මෙතැම පරමාණුවකට න්‍යෂ්ටියක් තිබේ. මෙ න්‍යෂ්ටිය ධන ආරෝපිත ය. එම න්‍යෂ්ටිය වටා සෘණ ආරෝපිත ඉලෙක්ට්‍රෝන භ්‍රමණය වේ. භ්‍රමණය වන ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන මගින් ඇදගෙන තිබේ. එනම්, ඉලෙක්ට්‍රෝන සහ ප්‍රෝටෝන අතර ද ආකර්ෂණ බලයක් ක්‍රියාත්මක වේ. මේ අනුව සූර්යග්‍රහ මණ්ඩලයේ සිට ඇසට නොපෙනෙන පරමාණුව දක්වා ඇති සෑම වස්තුවකම ආකර්ෂණ බලය ක්‍රියාත්මක වේ.

ඔබ ඉගෙන ගත යුත්තේ ඔබ සතුව ඇති ආකර්ෂණ බලය ඔබේ අවශ්‍යතා වෙත යොමු කර ඔබේ අවශ්‍යතා සපුරාගන්නා ආකාරය පිළිබඳ කලාව ය. **සෑම මිනිසෙකුම උපතින්ම ආකර්ෂණ බලයකට හිමිකම් කියයි. මේ ආකර්ෂණ බලය මිනිසාගෙන් මිනිසාට වෙනස් වේ. ඔබේ අවශ්‍යතාව මත ඔබේ ආකර්ෂණ බලය අඩු හෝ වැඩි තත්ත්වයට පත් කර ගත හැකි ය.** ඔබගේ ආකර්ෂණ බලය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය උපදෙස් මේ පොතෙහි අන්තර්ගත වේ. ඔබේ ආකර්ෂණ ශක්තිය වැඩි කිරීම තුළින් ඔබ වෙතට මුදල් ආකර්ෂණ කර ගැනීමේ හැකියාව පවතී. එනම්, මුදල් ඔබ වෙත ආකර්ෂණය කර ගැනීමට නම් ඔබේ ආකර්ෂණ බලය අනිවාර්යයෙන්ම වැඩි කර ගත යුතු ය. ඔබ



...ෂිත කරන පනාවක් හෝ පෑනක් ගෙන රෙදි කැබැල්ලකින් ...කම දිශාවට හොඳින් පිරිමදින්න. දැන් ඒ පෑන හෝ පනාව ...නා කුඩා කඩදාසි කැබලි කීපයක් දෙසට යොමු කරන්න. ඒ ...කඩදාසි කැබලි සියල්ල පෑන හෝ පනාව වෙතට ආකර්ෂණය ...වේ. මෙය කුඩා කාලයේ දී අප කර ඇති ක්‍රියාකාරකමකි. ...නමුත් පිරිනොමදින ලද පෑනක් හෝ පනාවකට මේ ඇදගැනීමේ ගුණාංගය නොමැත. මිනිසාගේ සිතත් නිසි ආකාරයකට සකස් කිරීමෙන් මෙම මහා බල සම්පන්න ආකර්ෂණ බලය ආරෝපනය කර ගත හැකි ය. මේ ආකර්ෂණ බලයට මුදල්, නිවාස, වාහන ආදී දේ ආකර්ෂණය වේ. ඒ පෑන හෝ පනාව ක්‍රමවත් නොවන සේ පිරිමැද්දහොත් අදාළ ආකර්ෂණ බලය ඒ පෑනට හෝ පනාවට නොලැබේ. මෙලෙස අපගේ සිත ක්‍රමවත් ආකාරයට පිළියෙල නොවුණහොත් ඔබට අවශ්‍ය ආකර්ෂණ ශක්තිය නොලැබේ. ඔබට පිපාසය දැනෙනවිට කොහෙන් හෝ වතුර ඔබ සොයා ඇවිණේ. වතුර සොයා ඔබේ අත සහ දෙපා මෙහෙය වන්නේ ඔබේ මොළයයි. කුසගිනි දැනෙන විට ආහාර වෙත අප හෝ ආහාර අප වෙත ආකර්ෂණය වේ. මේ ගැන ඔබ තර්කානුකූලව සිතා බලන්න. ඔබ ඉපදුන දා සිට මේ දක්වා ඔබට පිපාසය දැනෙන හැම මොහොතකම වතුර පානය කිරීමේ අවස්ථාව ඔබට උදා වී ඇත. කිසිම දිනක පිපාසයේ දී වතුර නොමැති වී නැත. මෙයින් මා ඔබට පැවසීමට උත්සාහ කරන්නේ ඔබ වටා මේ මහා ආකර්ෂණ බලය ක්‍රියාත්මකව පවතින බවයි. මේ ශක්තිය ඔබ තුළ ගැබ්ව

පවතී. මෙතෙක් ඔබ මේ ශක්තිය හඳුනාගෙන නොමැති නමුත් ඔබ නොදැනුවත්වම ඔබ සතුව ඇති මේ මහා බල ශක්තිය ඔබට උපකාර කර ඇත. ඔබේ අතීතය ගැන කල්පනා කර බැලුවහොත් මේ ගැන තවත් අවබෝධ වේවි. මා උදාහරණ ලෙස ගත්තේ සෑම මිනිසෙකුටම දැනෙන පිපාසය හා බඩගින්නට මේ මහා බල ශක්තිය පිහිට වන ආකාරයයි. ඔබ ආශා කළ, ආදරය කළ දේවල් ඔබ වෙතට ආකර්ෂණය වී තිබේ ද? මේ ගැන සිතන්න. ඔබ සතුව ද මේ මහා ආකර්ෂණ බලය ක්‍රියාත්මකවනවා නේද? මේ මහා බල ශක්තිය ඔබ තුළ අඩංගුව තිබේ. දැන් ඔබ සූදානම් විය යුත්තේ මේ මහා ආකර්ෂණ ශක්තිය හඳුනාගෙන ඔබට අවශ්‍ය ආකාරයට එය මෙහෙයවා ඔබට අවශ්‍ය දේ ඔබ වෙතට ආකර්ෂණය කරවා ගැනීමටයි. දැන් ඔබට සිදු කිරීමට එක් කාර්යයක් තිබේ. **එනම්, ඔබ ඔබේ අතීතය ගැන හොඳින් කල්පනා කරන්න. ඔබේ ජීවිතයට මේ ආකර්ෂණ ශක්තිය උදව් කර තිබේදැයි තර්කානුකූලව සිතා බලන්න. ඔබ තුළ මේ මහා බල ශක්තිය තිබේදැයි හඳුනාගන්න. මේ ආකර්ෂණ බල ශක්තිය ඔබ තුළ අන්තර්ගතව පවතින්නේ ද යන්න සොයා ගැනීම ඔබ විසින්ම කළ යුතුය. මෙය හොඳින් තම සිතට තහවුරු කළ යුතු ය. ආකර්ෂණ බලය ගැන හොඳ විශ්වාසයක් ඔබේ සිත තුළට ඇතුළත් කළ යුතු ය. ඔබේ දෑස් හොඳින් පියවා ''අද මා හඳුනාගත් මා සතුව තිබූ මේ මහා බල ශක්තියට මම ස්තුති වන්ත වෙමි. අද සිට මා මගේ**



**සාර්ථකත්වය සොයා යන ගමනට මගේ ආකර්ෂණ ශක්තිය මහත් සේ පිහිටවනු ඇත. මේ ශක්තිය මම සොදා ගනිමි. මේ ශක්තිය මම වර්ධනය කරමි'' යනුවෙන් දැන්ම තම සිතට කියන්න. දැඩි භක්තියකින්, ගෞරවයකින් හා ඕනෑකමකින් මෙය ඔබේ සිතට කියන්න. අද ඔබේ ජීවිතයේ තවත් එක් සුවිශේෂී දිනයක් බව සිතන්න. අද සිට ඔබේ සහායට ඔබට හොඳ මිතුරෙකු සිටින බව සිතන්න.**

**ආකර්ෂණ ශක්තිය සමග අවශ්‍යතාවය එක් වූ විට ප්‍රතික්‍රියාව ආරම්භ වේ.** එනම්, ඔබේ අවශ්‍යතාව ඔබ වෙතට ළඟා කරදීමේ වැඩ සටහන ආරම්භ වේ. මෙය ක්‍රමයෙන් සිදු වී බොහෝ අවශ්‍යතාවන් ඉටුවනවා ඇත. ඔබ සතුව ඇති ආකර්ෂණ ශක්තියේ ප්‍රමාණය සහ ඔබේ අවශ්‍යතාවය ගැන ඔබේ සිතට පැවසූ ආකාරය අනුව ප්‍රතිඵලය ළඟාවීම හෝ නොවීම, ළඟා වීමෙහි කාලය රඳා පවතී. ඔබ සාමාන්‍ය තත්ත්වයක සිට (සාමාන්‍ය තත්ත්වයෙන් මා අදහස් කරන්නේ ඔබේ ආකර්ෂණ ශක්තිය වර්ධනය කර ගැනීමට අවශ්‍ය කිසිදු ක්‍රියාකාරකමක් නොකර ඔබ පැවත ආ ලෙසට සිටීම. එනම්, මූලික පැවත ආ ආකර්ෂණ ශක්තිය) ඔබට නවීන කාර් රථයක් ගැනීමට අවශ්‍යයයි සිතුවත් ඒ අවශ්‍යතාව ඔබ වෙත ළඟා නොවේ. නමුත් ඔබ මේ පොතෙහි මුල් පරිච්ඡේදවලට අනුව ඔබේ ජීවිතය වෙනස් කරගෙන බලවත් තත්ත්වයට පත්වී තම ආකර්ෂණ ශක්තිය වර්ධනය

තර ගෙන (ආකර්ෂණ ශක්තිය වර්ධනය කරගන්නා ආකාරය ඉදිරියේදී සාකච්ඡා කෙරේ) ඉතාමත් හොඳින් ඔබට නවීන කාර් රථයක් අවශ්‍ය බව පවසන්න. ඔබ බලාපොරොත්තු වන කාර් රථයේ වර්ගය, වර්ණය ආදී සියලු විස්තර ඔබ සොයාගෙන ඒවායේ පින්තූර ද ඔබ ළඟ තබාගන්න. ඔබ වාහනයේ දොර විවෘත කරන ආකාරය, වාහනය පණ ගන්වන ආකාරය, වාහනයේ ඔබ ගමන් කරන ආකාරය, ඔබ වාහනය සෝදන ආකාරය වැනි චිත්ත රූප ඔබේ සිතේ මවන්න. ඔබේ අවශ්‍යතාවයට හැඟීම් එක් කරන්න. අවශ්‍යතාවය ඉතා හොඳින් සිතට කියන්න. ඔබ සතුව ඇති මහා ආකර්ෂණ බලයට මේ මහා හැඟීම්බර අවශ්‍යතාව එක් වූ සැනින් ප්‍රතික්‍රියාව ආරම්භ වී ඔබට වාහනයක් හිමි කරදීමේ වැඩ සටහන විශ්ව බුද්ධි බලය භාරගෙන එය ක්‍රියාත්මක කරවයි. ඔබේ සිත අදාළ වැඩ සටහනට අනුව ක්‍රියාත්මක වේ. ඔබේ සිතට අනුව ඔබේ මොළය ක්‍රියාත්මක වේ. ඔබේ ඇස්, අතපය අවදි වී ඔබ ක්‍රියාත්මක වේ. වාහනය ගැනීමට අවශ්‍ය මුදල් ලැබීමේ ක්‍රම ඔබ තුළ දැන් ආරම්භ වේ. ඔබට අවශ්‍ය මිනිසුන් ඔබට ආකර්ෂණය වේ. ටික දිනකින් ඔබට වාහනයක් ලබා ගැනීමේ හැකියාව උදා වන්නේ මහා පුදුමාකාර ලෙසටයි. ඔබට අවශ්‍ය සියලු දේ ඔබ වෙතට ආකර්ෂණය කරවා ගත හැකි ය. ඔබ, ඔබ ගැන දැඩිව විශ්වාස කරන්න. ඔබ සතුව ඇති මහා බල සම්පන්න ආකර්ෂණ බලශක්තිය ඔබට උපකාර කරන බව දැඩිව විශ්වාස කරන්න.



## මතකයෙන් මැකී යාමට පෙර

- විශ්වයේ විස්මිත බව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වන්න.

- විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.

- ඔබ, ඔබේ සිත හසුරුවන්න. පාලනය කරන්න. මෙහෙයවන්න. ඔබට ඔබ විශ්වාස නම්, ඔබට ඔබේ සිත විශ්වාස නම් කළ නොහැක්කක් නොමැති බව ද මතක තබා ගන්න.

- ඔබ වෙනස්වන්න. ඔබ ලැබූ මිනිස් ජීවිතයට ගරු කරන්න.

ඔබ සාර්ථක මිනිසෙකු වීම ලැබූ ජීවිතයට ගරු කිරීමකි.

- **විශ්වයේ පවත්නා සෑම දෙයක්ම ආකර්ෂණ බලය මත ගොඩනැගී ඇත.**

6 පරිච්ඡේදය

# ධනාත්මක සිත

ඔබ සතුව ඇති ආකර්ෂණ බලය රඳා පවතින්නේ ඔබේ සිත සහ ඔබේ පුරුදුවලට අනුව ය. ඔබ අවදියෙන් ජීවිත සෑම මොහොතකම ඔබේ සිත ක්‍රියාත්මක වේ. විවිධ වූ සිතිවිලි නිතරම ජනිත වේ. සමහර සිතිවිලිවලට ඇති ආයු කාලය තත්පර කිහිපයකි. සමහර සිතිවිලි ඉතා දිගු කාලයක් පවතී. මෙහි දී ඔබට ඉතා සරල ක්‍රියාකාරකම් මගින් මුදල් ආකර්ෂණය කර ගන්නා ආකාරය ගැන සාකච්ඡා කෙරේ. මෙය පොදුවේ සෑම දෙනාටම අවබෝධ කරගත හැකි සරල ඉදිරිපත් කිරීමකි.

මේ ගැන හොඳින් සිතන්න. මිනිසාගේ සිත බොහෝ වේලාවක් තමන්ගේ පාලනයෙන් මිදී ඉතා ස්වාධීනව ක්‍රියාත්මක වේ. සිත අයාලේ සැරිසරන අතර ඉබේ සිතිවිලි පහළ වන්නේ ඒ ඒ තැනට අනුරූපවන ආකාරයට ය. මිනිසා තමන්ට සිතක් තිබෙන්නේ ද යන්න වත් නොදනී! තුන්වන

ලෝකයේ දුප්පත් රටවල බොහෝ මිනිසුන් මෙ වර්ගයට අයත් වේ. ඔබත් දුප්පත්නම්, ආදායම් මාර්ග නොමැතිනම්, අනුන්ගෙන් යැපේනම් ඔබත් මේ කාණ්ඩයට අයිති බව කණගාටුවෙන් වුව ද කිව යුතු ය. නමුත් ඔබ සතුටු වන්න. මේ වනවිට ඔබ එයින් මිදීමේ ක්‍රියාවලියේ නියුතුව සිටින බැවිනි. එනම්, මේ පොත කියවන ඔබ වහා වෙනස් වී ඒ කාණ්ඩයෙන් ඉවත් වී සාර්ථක කාණ්ඩයට පැමිණිය යුතු ය. දැන් ඔබේ සිත සරු සිතක් බවට පත් කර ගැනීමේ අවස්ථාව උදා වී ඇත.

මුලින්ම ඔබ කළ යුත්තේ ඔබේ සිත හඳුනාගැනීමයි. ඔබට ඇත්තේ ධනාත්මක වර්ගයට අයත් සිතක් ද? එසේ නොමැතිනම් ඍණාත්මක වර්ගයේ සිතක් ද? ධනාත්මක සිතේ ආකර්ෂණ බලය වැඩි අතර ඍණාත්මක සිතේ විකර්ෂණ බලය වැඩි ය. ''ධන'' යනු, එකතුවීමයි. එනම්, අගය වැඩි වීමකි. ''ඍණ'' යනු, අඩු කිරීමයි. එනම්, අගය අඩු වීමයි. ඔබේ සිත තුළ ධනාත්මක සිතිවිලි උපදින වාරයක් වාරයක් පාසා ඔබේ අගය වැඩි වේ. එනම්, ඔබේ ආකර්ෂණ බලය වැඩි වේ. ඔබේ සිත තුළ ඍණ සිතිවිලි උපදින විට ඔබේ අගය අඩු වේ. එනම්, ඔබගේ ආකර්ෂණ බලය අඩු වේ. ඔබ පුරුදු විය යුත්තේ ධනාත්මකව සිතීමටයි. ඔබ ධනාත්මක චින්තකයෙකු විය යුතු ය. ධනාත්මකව සිතන්නේ කෙසේ ද? ඔබ මුලින්ම ඔබ සහ සිත අතර හොඳ සම්බන්ධතාවක් ගොඩනගා ගත යුතු ය. ඔබ නිතරම අවබෝධයෙන් ඕනෑකමින්



සිතන්න පුරුදු වන්න. සිත සමග නිතර කථාකරන්න. ඔබේ සිතට ස්තුති කරන්න. **''මාව සාර්ථකත්වයට පත් කරවන මගේ සුපිරි සිතට මම ස්තුතිවන්ත වෙමි'' යනුවෙන් නිතර සිතන්න. ඔබ තනිවන සෑම මොහොතකම ඔබේ සිත සමග සම්බන්ධ වන්න. සිත සමග කථා කරන්න. ඔබේ අනාගතය සාර්ථක කරවන මෙන් ඔබේ සිතට කියන්න. ''මගේ සිත තුළට පැමිණිය හැක්කේ ධනාත්මක සහ මාව සරු කරවන සිතිවිලි පමණි'' යනුවෙන් ද සිතන්න.**

සුබවාදී සිතිවිලි සියල්ල ධනාත්මක වර්ගයට අයත් වේ. සෑම දෙයකම හොඳ පැත්ත දකින්න. පුළුවන්, ඔව්, හැකියි, පහසුයි, කරනවා, දිනනවා, වැනි වචන නිතර භාවිත කරන්න. බැහැ, නැහැ, පස්සේ කරමු, කම්මැලියි, අපහසුයි ආදී ඍණ සිතිවිලි ඔබේ ජීවිතයෙන් බැහැර කරන්න. ඔබට ලැබෙන අභියෝග ආසිරි ලෙස පිළිගන්න. ඔබට සිදුවන මොනයම් හෝ කරදරයක් පසු පසම දියුණුවක් ඇතිබව සිතන්න. සෑම පරාජයක් පසු පසම ජයග්‍රහණයක් ඇතිබව සිතන්න. ඔබේ මනස නිතරම ස්ථාවරව තබා ගන්න. බොහෝ මිනිසුන් ප්‍රශ්න ඉදිරියේ මානසිකව ඉතා පහළ තත්ත්වයට ඇද වැටේ. මානසික මට්ටම පහළ තත්ත්වයක තිබීම යනු, හොඳ සිතිවිලි උත්පාදනය නොවීමයි. ලෝකයේ සිදුවන සෑම ප්‍රශ්නයකටම උත්තරයක් තිබේ. නිවැරදි උත්තරය සෙවිය යුත්තේ ඔබ විසින්ම ය. ඔබට ලැබෙන උත්තරය නිවැරදිනම්

ඔබට ප්‍රශ්නය ඉදිරියේ ජයග්‍රහණය ලැබෙයි. පහළ මානසික මට්ටමේ දී ඔබේ සිතීමේ හැකියාව ද පහළ යනු ඇත. මේ නිසා ප්‍රශ්න ඉදිරියේ වෙනදාටත් වඩා ධෛර්යවත් සිතක් ඇති කරගත යුතු ය. "මේ ප්‍රශ්නයෙන් මම ජයග්‍රහණය කරමි" යනුවෙන් සිත ශක්තිමත් කර ගන්න. සිතට ස්තුති කරන්න. ප්‍රශ්න ඉදිරියේ සිනාසෙමින් අවශ්‍ය විසඳුම සොයන්න. ප්‍රශ්නයක් ආ සැනින් කේන්දර බැලීමට, ජේන බැලීමට, පූද පූජා පැවැත්වීම ආදී බොහෝ දේ සඳහා යොමු වන්නේ ඔවුන්ගේ සිත ශක්තිමත් නොවන නිසයි. අපට නොපෙනෙන බලවේග සඳහා මුදල් වියදම් කර තවත් ප්‍රශ්නවලට මුහුණපායි. මානසික මට්ටම් දුර්වල වූ විට වෙනත් බලවේග කරා යොමු වේ නම් ඔබ තව දුරටත් මේ පොත කිහිප වතාවක් කියවා සිතේ බලය හඳුනාගන්න. **"මට සියල්ල කළ හැකියි. මම ජයග්‍රහණය ලබනවා. මම සාර්ථක වෙනවා. මගේ ඉලක්ක මම දිනනවා", යනුවෙන් සෑම මොහොතකම ධනාත්මකව සිතන්න. "මගේ සිත ධනාත්මක සිතක්, මගේ සිත සියල්ලටම වඩා බලවත් බව මම දන්නවා", යනුවෙන් නිතර සිතන්න. "අපෝ මට බෑ, ඒක මම දන්නේ නෑ, ඒක හරිම අමාරුයි, පහසු වෙන්නේ නෑ, ඉන්නවා ද දන්නේ නෑ, හෙට කරමු, කම්මැලියි, පස්සේ බලමු, දුප්පත්කමට බෙහෙත් නෑ, අපි දුප්පත්නේ, අපිට කොහෙන්ද සල්ලි, එපා වෙනවා, අපොයි බෑ, බයත් හිතෙනවා, පැරදෙයි ද දන්නේ නෑ".** ආදී ලෙස ඔබ සිතන්නේ නම් මේ දැන්ම ඔබ වෙනස් විය යුතු ය. මේ



ආකාරයේ සිතක් සෘණ වර්ගයට අයත් එකකි. සෘණ වර්ගයේ සිතක් මගින් ඔබේ අගය දවසින් දවස තත්පරයෙන් තත්පරය අඩු වේ. ඔබෙන් සාර්ථකත්වය පැන ගොස් ඒ වෙනුවට අසාර්ථකත්වය ඔබ වෙතට පැමිණේ. නිතරම කරදරවලින් පිරුණු ඔබේ සිත සතුට වෙනුවට ආකර්ෂණය කරගන්නේ දුකයි. අසනීප ඉතා පහසුවෙන් ඔබව වැළඳ ගනී. මන්ද, සෘණ වර්ගයේ සිතක අගය අඩුවන බැවින් අගය අඩු කරවන සිතිවිලි සහ සිදුවීම් ඒ සිත්වලට එකතු වේ. **ඔබට අවශ්‍යනම් මේ මොහොතේදීම ඔබට වෙනස් විය හැකිය. ඔබ කළ යුත්තේ ඔබේ සිතට පැමිණෙන සෘණ සිතිවිලි හඳුනා ගැනීමයි. සෘණ සිතිවිල්ලක් පැමිණි විගස එය ප්‍රතික්ෂේප කරන තවත් ධන සිතිවිල්ලක් ඒ මොහොතේදීම සිතින් කියන්න. කලින් සෘණ සිතුවිල්ලක් ඔබේ සිතට පැමිණීම ගැන සිතින් සමාව ගන්න. උදාහරණයකින් එය පැහැදිලි කරගත හැක. මේ පොත කියවන ඔබ ඔබව හඳුනා ගන්නේ සෘණ සිතක් ඇති අයෙකු ලෙසයි. දැන් ඔබට අවශ්‍ය වන්නේ ධනාත්මක බවට පරිවර්තනය වීමටයි. නමුත් ඔබේ සිතේ 'නෑ මේ පොත කියවලා පස්සේ එහෙම කරන්න බලමු' යනුවෙන් සිතුවිල්ලක් ඇති වේ. දැන් අවසානයට පැමිණි සිතුවිල්ල මහා සෘණ සිතුවිල්ලකි. දැන් ඔබ 'සමාවෙන්න මම දැන්ම වෙනස් වෙනවා මගේ සිත කැමති ධනාත්මක සිතිවිලි වලටයි. මම සාර්ථකත්වයට කැමතියි මම සාර්ථක වෙනවා යනුවෙන් ධනාත්මක**

සිතිවිල්ලක් සිතන්න. පෙර පැමිණි සෘණ සිතිවිල්ල පැමිණීම ගැන සමාව ගන්න. සෘණ සිතිවිල්ලට විරුද්ධව ධනාත්මක සිතිවිල්ල සිතින් කියන්න. මෙසේ දින කිහිපයක් සිදු කරනවිට ඔබේ සිතට සෘණ සිතිවිලි පැමිණ එය ක්‍රියාත්මක වීමට ඇති ඉඩකඩ නැති වී යයි. එවිට සෘණ සිතිවිලි සිතට පැමිණීම නැවති සිත ධනාත්මක බවට පත් වේ. සෘණ සිතිවිල්ල ඉවත් කළ හැක්කේ ධන සිතිවිල්ලකට පමණි. ධන සිතිවිලි ඔබේ අගය වැඩි කරවමින් ඔබ සියල්ල දිනන අයෙකු බවට පත් කරයි.

ඔබේ සිත ධනාත්මක නම් ඔබේ ආකර්ෂණ බලය වැඩි ය. ඔබට අවශ්‍ය සුපිරි සිතිවිලි, හොඳ මිනිසුන්, වැඩිපුර මුදල්, සුවපත්බව ආකර්ෂණය වන්නේ ඔබේ සිත ධනාත්මක නම් පමණි. හඳට ගියෙත් අපි වගේම මිනිසුන් ය. හඳට ගිය යානය හැදුවෙත් අපි වගේ මිනිසුන්ය. ඔවුන්ට හඳට යන්න අවශ්‍යතාවය දැනුණ පසු එය ඉවත් කළ නොහැකි විය. හඳ කොච්චර දුරයි ද කියා සිතුවානම් අද වනතුරුවත් හඳට යන්න පුළුවන්කමක් නොමැත. ඒ වේලාවේ ඒ ශ්‍රේෂ්ඨ මිනිසුන් 'හඳට යා හැකියි' යනුවෙන් සිතපු නිසා එය සාර්ථක විය. ඒ ව්‍යාපෘතියට සම්බන්ධ වූ සියලු දෙනාම දැඩි ආත්ම ශක්තියෙන්, ධනාත්මකව, "එය කළ හැකියි", යනුවෙන් සිතා කටයුතු කළ අය වෙති. ධනාත්මකව සිතන සියලු දෙනා ලොව දිනුවෝ වෙති. ඔවුහු ඉතා ප්‍රීතියෙන් ජීවත්වන්නෝ



වෙති. ඔබේ වර්තමාන තත්ත්වය පොහොසත් කමට කිසිදු බාධාවක් නොවේ. ඔබේ අතේ දැන් සතයක්වත් නැතිව වුව ද අනාගතයේ මහා ධනවතෙකු විය හැකි ය. ලොව බිහි වූ සෑම ධනවතෙකුම තම ජීවිතය ආරම්භ කර ඇත්තේ ඉතාම පහත් මට්ටමක සිටයි. සෑම මොහොතක්ම ධෛර්යයෙන් සැලසුමකට අනුව ධනාත්මකව සිතා කටයුතු කිරීමෙන් ඔවුන් ධනවතුන් බවට පත් වී ඇත. ධනවතෙකු වීමට අවශ්‍යවන්නේ ප්‍රබල ධනාත්මක සිතක් පමණි. ධනාත්මක සිතට සියල්ල කළ හැකි ය.

ලොව මෙතරම් වේගයෙන් දියුණුවූයේ ධනාත්මකව සිතන මිනිසුන් නිසා ය. විදුලි බල්බය සොයාගත් තෝමස් අල්වා එඩිසන් මහතා සාර්ථක විදුලි බල්බය සෙවීමට පෙර අසාර්ථක පරීක්ෂණ දහසකට ආසන්න ප්‍රමාණයක් සිදු කර ඇත. ඒ කිසිදු උත්සහායකින් අධෛර්යවත් නොවූ ඒ ශ්‍රේෂ්ඨ මිනිසා තම ඉලක්කය සපුරා ගන්නේ ඒකායන ධනාත්මක සිතිවිල්ල නිසා නොවේ ද? ඔහුගේ අසාර්ථක උත්සහායන් ද ඔහු දුටුවේ පුදුමකාර ධනාත්මක ආකාරයටයි. ඔහු බල්බය සොයා ගැනීමෙන් පසුව පැවසුවේ විදුලි බුබුලක් නිපදවීමෙ දී අසාර්ථකවන අවස්ථා 999ක් ද සොයාගත් බවයි. සියලු දේ ධනාත්මකව සිතන මෙවන් සුපිරි මිනිස්සු පෘථිවිය සුන්දර නවාතැනක් බවට පත් කරති. ලෝකය එළිය කළ මෙවන් ශ්‍රේෂ්ඨ මිනිසුන්ට අප ස්තුති කළ යුතු ය.

ඔබ උදැසන අවදි වූ මොහොතේ සිට නින්දට යන තෙක් ඔබ සිතට ළඟා කරගත යුත්තේ ධනාත්මක සිතිවිලි පමණි. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, තරහව, පළිගැනීම වැනි සිතිවිලි මහා සෘණ සිතිවිලි වේ. එවැනි සිතිවිලි සිත තුළට පැමිණීමට ඉඩ නොදෙන්න. එම සිතිවිලි සිත වෙතට ආ විගස සිහින් සමාව ගෙන එයට විරුද්ධ ධන සිතිවිලි සිහින් සිතන්න. දවස පුරාම ඔබේ සිත ධන සිතිවිලි වලින් පුරවාගෙන ප්‍රීතියෙන් කාලය ගත කරන්න. එවිට ඔබ ධනව ආරෝපණය වේ. එහි ප්‍රතිඵලය ඔබේ සිතිවිලි ඉටු කරවන වැඩ සටහන් ක්‍රියාත්මක වී ඔබේ අරමුණු ඉටු වීමයි. කුමන අවස්ථාවක හෝ ඔබේ සිත වෙතට සෘණ සිතිවිලිවලට පැමිණීමට ඉඩ නොදෙන්න. සෘණ සිතිවිලි ඔබව ආපස්සට ගෙන යන සාර්ථකත්වය වෙනුවට අසාර්ථකත්වය ළඟා කරන විරුද්ධ බලවේගයකි. ඔබට තිබුණේ සෘණ සිතක් නම් දැන් ඔබ ධනාත්මක තත්ත්වයට පත්වන විට සෘණ සිතිවිලි දැඩි ලෙස බාධා කරනු ඇත. මන්ද, ඔබේ සිත අයිතිව තිබුණේ සෘණ සිතිවිලි වලටයි. නමුත් ඔබ ධෛර්යයෙන් ධන සිතිවිලි පවත්වාගෙන යනවිට ඔබෙන් සෘණ සිතිවිලි ඉවත්ව යන්නේ සාර්ථකත්වයට ඉඩ දෙමිනි.

සිතේ තිබෙන බලය හැල්ලුවට ලක්කරන වෙනත් බලවේග සඳහා ඔබ යොමු නොවන්න. මුළු විශ්වයම එකිනෙකට බැඳී පවතින්නේ ආකර්ෂණ බලය නිසාවෙනි. විශ්ව බුද්ධි බලයෙන් බිහිවන සෑම නිර්මාණයක්ම ආකර්ෂණ



බලය. එනම්, ඇද තබා ගැනීමේ බලය. එහෙමත් නැත්නම් එකතු කිරීමේ බලය හෙවත් ධන බලය මත ක්‍රියාත්මක වේ. විශ්ව බුද්ධිය ධනාත්මක ය.

එම නිසා ඔබ ද ධනාත්මක බව වැළඳගත යුතු ය. ඔබේ සිතට පැමිණෙන සියලු සිතිවිලි ඔබ විසින්ම පරීක්ෂාවට ලක් කළ යුතු ය. සිත තුළට පැමිණෙන සෘණ සිතිවිලි ඒ මොහොතේදීම ඉවත් කරන්න. සෘණ සිතිවිලි ළඟා නොවීමේ වැඩ සටහන මගින් ඔබේ සිත ධනාත්මකව තබා ගනී. ධනාත්මක සිත ඔබට ආකර්ෂණ බලය ගෙන දේ. ඔබව සාර්ථක අයෙකු බවට පත්කරයි.

ඔබේ පුරුදු ඔබේ ආකර්ෂණයට සෘජුවම බලපායි. ඔබ නිතරම සිනාසෙමින් වැඩ කරයි නම් ඔබ වටා විශාල ලෙස මිනිසුන් ආකර්ෂණය වේ. ඔබ කා සමගවත් සිනා නොවෙමින් අහංකාර ලෙස ජීවත් වේ නම් මිනිසුන් ඔබෙන් විකර්ෂණය වේ. යහපත් පුරුදු සඳහා ආකර්ෂණ බලයක් ද අයහපත් පුරුදු සඳහා විකර්ෂණ බලයක් ද ක්‍රියාත්මක වේ. උදැසනින් අවදි වී, පිරිසිදු වී විශ්ව බුද්ධිය සඳහා සිහින් ස්තුති පූජාවක් පවත්වා ඔබේ සිතට, ඔබට උදව් කළ, උදව් කරන සෑම දෙනාට ස්තුති කර ඔබේ ඉලක්ක ජය ගන්නා ආකාරයට අදාළ චිත්ත රූප මැවීම ඉතා හොඳ ක්‍රියාවකි. මේ ක්‍රියාව පුරුද්දක් බවට පත් කරගත හැකි ය. මෙම හොඳ පුරුද්ද ඔබේ ජීවිතයට එක්කර ගන්න. එවිට ඔබේ ආකර්ෂණ

බලය වැඩි වේ. දහවල තෙක් නිදාගෙන පසුව අවදි වී අරමුණක් නැතිව දවස අරඹන අය ද බොහෝ ය. මේ අයට උරුම වන්නේ විකර්ෂණ බලයයි. ඔබ නිතරම හොඳ පුරුදු වැළඳ ගන්න. හොඳ පුරුදු ඔබ සාර්ථක කරනු ඇත. ඔබේ ආකර්ෂණ බලය වැඩි වී ඔබ සැම දෙනාගේම ආදර ගෞරවයට පාත්‍ර වේ. ඔබ සිතන දේ ලඟා කර ගැනීමට ආකර්ෂණය බලය අවශ්‍ය වේ. මේ පිළිබඳ මීට පෙර අප සාකච්ඡා කර ඇත. ඔබ යම් වැරදි පුරුද්දකට ඇබ්බැහි වී සිටිනම් ඒ වැරදි පුරුදු ඔබ මුලින් හඳුනා ගන්න. ඒ වැරදි පුරුද්ද නිසා ඔබ සතුව ඇති ආකර්ෂණ බලය වෙනුවට විකර්ෂණ බලය ගොඩනැගෙන බව සිතන්න. දුම්පානය, මත්පැන් පානය, සූදුව, අනවශ්‍ය ස්ත්‍රී පුරුෂ ඇසුර, වෙලාවට වැඩ නොකිරීම, විශ්වාසය බිඳීම ආදිය ඔබව පහත් කරන ක්‍රියා වේ. මේවාට ඔබ පෙළඹී ඇත්නම් මේ දැන්ම දැඩි තීරණයකට එළඹෙන්න. ඔබ ඔබට ආදරය කරයි නම් මේ මොහොතේ දී ම එය නැවැත්වීමට අදාළ තීරණය ගන්න. පුරුද්ද මග හැරීමට ඔබේ ප්‍රබල සිතට පුළුවන් බව තරයේ විශ්වාස කරන්න. පුරුද්ද අත් හැරිය විට සිත එය යළි ඉල්ලයි. ඒ අවස්ථාවේ දී සිතට ඒ පුරුද්දට විරුද්ධව කථා කරන්න. දිගටම මෙසේ සිදුකරනවිට ඕනෑම පුරුද්දක් පහසුවෙන් අත් හැරිය හැකිය.

මීට පෙර පරිච්ඡේද නැවත කියවන්න. එහි සඳහන්ව තිබෙන්නේ ඔබේ අගය වැඩි කරවන ක්‍රියාකාරකම් වේ. ඔබ



මෙලොව දකින්නේ මිනිසෙකු ලෙසයි. මිනිසෙකු ලෙස ඔබට සියලු පහසුකම් හා සැප උරුම බව අමතක නොකරන්න. සුපිරි නිවසක වාසය කරන්න, සුපිරි සැප වාහනයක් පාවිච්චි කරන්න, හිතෙන දේ කන්න, ලෝකය වටා ඇවිදින්න ආදී සියල්ල ඔබට ද හිමිය. නමුත් මේවා අත්විඳින්නේ කීයෙන් කී දෙනා ද? ඔබට ද මේ සියල්ල උරුම බව දැඩිව සිතන්න. වර්තමානයේ ඔබට මේ කිසිවක් නැතත් අනාගතයේ මේ සියල්ලම ඔබ වෙතට ආකර්ෂණය කරගත හැකි ය. ඔබ කළ යුත්තේ ඔබේ ආකර්ෂණ ශක්තිය වැඩිකරවා ගැනීමයි. ආකර්ෂණ ශක්තිය රඳා පවතින්නේ ඔබේ සිතිවිලි සහ පුරුදු මතයි. සිත පුහුණු කිරීම හා පුරුදු ඇති කර ගැනීම යන කාරණා දෙකම ඔබට කළ හැකි ය. ඔබ වෙනස්වන තුරු සතුට ඔබ සොයා නො එයි. ඔබට අවශ්‍යතාව දැඩිව දැනිය යුතු ය. අවශ්‍යතාව දැඩිව දැනෙන විට ඔබට ඔබේ සිත වෙනස් කර ගැනීමට අවශ්‍ය වේ. පුරුදු වෙනස් කර ගැනීමට අවශ්‍ය වේ. මේ නිසා ඔබට සතුට හා සැප අවශ්‍ය බව සිතන්න. දැඩි හැඟීම් බරව ඔබේ සිත සමග කථා කරන්න. මෙතෙක් මා ඉදිරිපත් කළ කරුණු හොඳින් සිතට ගන්න. ඒවා අනුගමනය කරන්න. මේ වනවිට ඔබ සාර්ථකත්වය අපේක්ෂාවෙන් වෙනස් වීමට තීරණය කර තිබේ ද? ඊ ළඟට මා මෙහි දී සාකච්ජා කරන්නේ මුදල් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය ශිල්පීය ක්‍රම ගැනයි. ඔබ වෙතට මුදල් ආකර්ෂණය කරවා ගැනීමට පෙර ඔබ ඒ සඳහා සුදුසුකම් සපුරා තිබිය යුතු ය. ඔබේ ශරීරය පුරා ධන ආකර්ෂණයක් ආරෝපණය

කරගත යුතු ය. ඔබ ගනකරන සෑම තත්පරයක්ම අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතු ය. නිතරම ධන සිතිවිලි වලින් ඔබේ සිත පුරවා ගන්න. සතුටින්, සිනාසෙමින් සිටින්න. බාහිර බලපෑම් සඳහා අනවශ්‍ය ලෙස ප්‍රතිචාර දැක්වීමට නොයන්න. බාහිර කරුණු නිසා ඔබේ ධන රිද්මය වෙනස් නොකරන්න. ඔබ ස්ථාවරව දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරන්න.

**මතකයෙන් මැකී යාමට පෙර**

- විශ්වයේ විස්මිතබව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තූතිවන්ත වන්න.

- විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.

- ඔබ, ඔබේ සිත හසුරුවන්න. පාලනය කරන්න. මෙහෙයවන්න. ඔබට ඔබ විශ්වාස නම්, ඔබට ඔබේ සිත විශ්වාස නම් කළ නොහැක්කක් නොමැති බව ද මතක තබා ගන්න.



- ඔබ වෙනස් වන්න. ඔබ ලැබූ මිනිස් ජීවිතයට ගරු කරන්න. ඔබ සාර්ථක මිනිසෙකු වීම ලැබූ ජීවිතයට ගරු කිරීමකි.

- විශ්වයේ පවත්නා සෑම දෙයක්ම ආකර්ෂණ බලය මත ගොඩනැගී ඇත.

- **මුලින්ම ඔබේ සිත හඳුනා ගන්න. ඔබේ සිත සෘණාත්මක නම් එය ධනාත්මක කිරීම ද ධනාත්මක නම් එය වඩාත් දියුණු තියුණු කිරීම ද ඔබ කළ යුතු ය.**

මහජන පුස්තකාලය

7 පරිච්ඡේදය

# මුදල් ආකර්ෂණයට උපක්‍රම

ඔබ දැන් කියවීම ආරම්භ කරන මේ පරිච්ඡේදය මෙ පොතෙහි ඇති වැදගත්ම සහ ඔබේ අපේක්ෂාව ඉෂ්ඨ කිරීමට සමත් පරිච්ඡේදයයි. මේ පරිච්ඡේදයේ දී මා සාකච්ඡා කරනුයේ මුදල් ඔබ වෙතට ආකර්ෂණය කර ගන්නා ආකාරයයි. මුදල් ඔබ වෙතට ආකර්ෂණය කරවා ගැනීමට අවශ්‍ය බොහෝ ශිල්පීය ක්‍රම මෙහි අන්තර්ගත වේ. ඒ සියලු ශිල්පීය ක්‍රම මා ප්‍රායෝගිකව අත්හදා බලා ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා ඇත. මේ සියලු කරුණු මාගේ වර්තමාන සාර්ථකත්වය පිටුපස ඇති රහස් වේ. වඩා යහපත් සුන්දර ලෝකයක් දැකීමේ පරම චේතනාවෙන් ඔබේ සාර්ථකත්වය

උදෙසා මෙය එළිදරව් කරන්නෙමි. ඔබ ද පොහොසතෙකු බවට පත් කිරීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන සුපිරිසිදු සිතිවිල්ල ම මෙයට මුල් වී ඇත. එමෙන්ම මා තෝරාගත් ධනවත් වීමට කැමති කිහිප දෙනෙකුට ද මේ ශිල්පීය ක්‍රම හොඳින්

තිසාදුන් අතර ඔවුන් ද මේ ක්‍රම අනුගමනය කිරීමෙන් මුදල් ආකර්ෂණ ශක්තිය ළඟා කරගෙන ඇත. එය මාගේ මෙකී රහස්වල නිවැරදිතාව නැවත නැවතත් තහවුරු කරනා සාක්ෂ්‍ය වේ.

මට මුදල් ලැබී නොතිබිණි. මම මුදල් ලබා ගත්තෙමි. මුදල් ආකර්ෂණය කරවා ගැනීමට මා දැරූ වෙහෙස අප්‍රමාණ වේ. මා අනුගමනය කළ විවිධාකාර ශිල්ප ක්‍රම ද බොහෝ ය. මුදල් මාගේ හිතාදර මිතුරෙකු බවට පත් කර ගැනීමට මා කළ කැපකිරීම අද මට මහත් ආඩම්බරයකි.

මුදල් සමග මා කළ සාකච්ඡා වාර ගණන අපමණ ය. මුදල්වලට මා ආදරය කළේ මහත් ගෞරවයෙනි. මුදල්වල සුවඳ මා සිතේ සැරිසරමින් සිටින්නේ මට ආස්වාදයක් ගෙන දෙමිනි. මා ඇස් පියාගත් විට පන්දහසේ අලුත් නෝට්ටු මාගේ දෙනෙත් ඉදිරියට එන්නේ මට සතුට ගෙන දෙමිනි. පන්දහසේ නෝට්ටු එකට එක්වෙමින් මුදල් මිටි සකස් වී මුදල් මිටි මිටි මා දෙනෙත් ඉදිරියේ සිට ගන්නේ මා වටකරගත් මාගේ මිතුරන් ලෙස ය. ඊළඟට මා එක් එක් පන්දහසේ නෝට්ටු මිටි අතට ගෙන එකම දිශාවට සිටින සේ සකස් කර එය මුදල් නෝට්ටු ගණන් කරන යන්ත්‍රයට දමා ගණන් කර පිළිවෙළට තබා එය තදවන සේ රබර් පටියකින් ගැට ගසා පැත්තකින් තබන්නේ දරුවෙකු නහවා පිරිසිදු කරන ආකාරයට ය. මුදල් ගණන් කරන යන්ත්‍රයේ ශබ්දය, ඒ ඇති



අතර ගමන් කරන මුදල් නෝට්ටුවල දර්ශන, මගේ සිතේ මැවෙන අතර පන්දහසේ මුදල් නෝට්ටු මිටිය යන්ත්‍රය උඩින් තබා මගේ දකුණු අත ඒ මුදල් නෝට්ටු මිටිය උඩින් තබාගෙන සිටින විට ක්‍රමයෙන් අත පහළ යන ආකාරය මට දැනේ. සෑම මුදල් නෝට්ටුවකම ජීවයක් තිබේ යැයි මට සිතේ. තැනින් තැන තිබෙන මුදල් නෝට්ටු මා සොයා ගමන් කරන බව මට සිතේ. ඒ මා වෙතට එන මුදල් නෝට්ටුවලට මා ආදරයෙන් සළකන බැවිනි. මුදල් යම් කාර්යයක් සඳහා වෙනත් අයෙකුට ලබා දුන්න ද ඒ මුදල් පැටවුන් සමග මා කරා පැමිණෙන බව මම දනිමි. පන්දහසේ නෝට්ටුව මා හොඳින් හඳුනමි. එහි ඇති සෑම චිත්‍රයක්ම සෑම අකුරක්ම මාගේ සිතෙහි තැන්පත්ව සිටින්නේ ගලක කෙටූ අකුරු සේ ය. අලුත් පන්දහසේ නෝට්ටුවක් අතින් ස්පර්ශ කරනවිට අතේ ඇඟිලි තුඩුවලට දැනෙන සනීපය මා මෙය ලියන විට ද අතට දැනේ. දැන් පන්දහසේ නෝට්ටු සේ ම ඇමෙරිකානු ඩොලර් සියයේ නෝට්ටු ද මා සොයා පැමිණේ. ඒ මුදල්වලට අවශ්‍ය ආදරය, ගෞරවය මා සතුව තිබෙන බැවිනි. ලොව ඇති බලවත්ම මුදල් නෝට්ටුව වන ඩොලර් සියය සමග මට ගනුදෙනු කිරීමට හැකිවීම පිළිබඳ මම මහත් සේ ආඩම්බර වෙමි. මා අත්හදා බැලූ නොයෙක් ශිල්පීය ක්‍රම හරහා මුදල් මා වෙත ආකරශණය කරවා ගැනීමට මම සමත් වුණෙමි. **මා මේ පොතෙන් ඉදිරිපත් කරන සියලු කරුණු මා ප්‍රයෝගිකව කරන ක්‍රියාකාරකම් වේ. මීට පෙර ඇති සියලු පරිච්ඡේදවල ඇති කරුණු හොඳින් ක්‍රියාවට**

**නගන්න. මගේ ජීවිතය මා බින්දුවෙන් ආරම්භ කළ අතර මාගේ සහයට සිටියේ මගේ සිතයි. වර්තමානයේ මට හිමි සරු බව මම එදා දැඩිව විශ්වාස කළෙමි. එදා මම මතුයම් දිනෙක ධනවතෙකු වන බව දැන සිටියෙමි. මා අද, වර්තමානයේ ජීවත් වුවත් මගේ සිත ජීවත් වන්නේ අනාගතයේ මා සිටින තැන ය. ඔබට ද බින්දුවෙන් ආරම්භ කළ හැකි ය. ඔබට දියුණු වීමට කාත් කවුරුවත් අවශ්‍ය නොවේ. ඔබේ සිත ගැන විශ්වාස කරන්න.** ඔබට සියල්ල කිරීමට අවශය බලය තිබෙන බව දැන ගන්න. ඔබ ජීවත් වන්නේ විශ්වයේ මහා බුද්ධි සාගරයක බව අමතක නොකරන්න. ඔබේ හදවත ස්පන්දනය වන වාරයක් වාරයක් පාසා විශ්ව බුද්ධිය ඔබ ගැන සොයා බලයි. ඔබ විශ්ව බුද්ධියට ආදරය කරයි නම් විශ්ව බුද්ධිය ද ඔබ පිළිබඳ ව හොඳින් සොයා බලයි. ඔබ, ඔබට ආදරය කරමින් සරු බව හොඳින් ප්‍රාර්ථනය කරමින් ඔබේ සිත සමග කටයුතු කරන විට ඔබ ඉල්ලන දේ ඔබ වෙතට ආකර්ෂණය කර දීමට විශ්ව බුද්ධිය කටයුතු කරන බව විශ්වාස කරන්න. මේ පොතෙන් ඉදිරිපත් කරන සියලු කරුණු කෙරෙහි ඔබේ සිත යොමු කරන්න. මා සරුසාර කළ කරුණු ඔබේ සරු බව ද අපේක්ෂාවෙන් ඉදිරිපත් කරමි. ඔබේ සරු බව මේ විශ්වයේ සුන්දරත්වයට හේතු වේ.



## 7.1 මුදල්වල ඇති බලය

"සල්ලි කියන්නේ දෙවියන්ගේ මල්ලි" යනුවෙන් බොහෝ දෙනා කියති. දෙවියන්ට සියල්ල කළ හැකියි, යනුවෙන් අපි විශ්වාස කරමු. සල්ලි දෙවියන්ගේ මල්ලි යනුවෙන් හැඳින්වෙන්නේ සල්ලිවලට ද සියල්ල කළ හැකියි යන්න සනාථ කිරීමටයි. ඒ කථාව බොහෝ සෙයින් සත්‍ය වේ. සල්ලි එකතුවන තැනට සතුට සහ බලය ද එකතු වේ. සල්ලි සමග යහපත් බව ද එක්වීම එහි බලය තවත් වැඩි කරවන්නකි. සල්ලි ලැබුණ පලියට සතුට නොලැබේ. බොහෝ මිනිස්සු මුදල් වලින් ධනවත් වුව ද සතුට අතින් ධනවත්තු නොවෙති. එයට හේතුව වන්නේ සතුටට අවශ්‍ය සිතිවිලි සහ පුරුදු තමන් වෙතින් පලවා හැර තිබෙන නිසයි. මුදල් තමා වෙත ආකර්ෂණය කර ගත හැකි ක්‍රම දෙකකි. එකක් වන්නේ සාධාරණ ක්‍රම හරහා මුදල් ඉපයීමයි. අනෙක වන්නේ අසාධාරණ ක්‍රම හරහා මුදල් ඉපයීමයි. අසාධාරණ ක්‍රම හරහා මුදල් රැස් කිරීම නිසා සමාජයට මහත් බලපෑමක් සිදුවේ. මේ නිසා බොහෝ දෙනා පීඩාවට පත් වෙති. එබැවින් අසාධාරණව උපයන මුදල් සමග සතුට නොපැමිණේ. ඔබ රැස්කරන මුදල් සාධාරණ ක්‍රම හරහා ඔබ වෙතට ළඟා කර ගත යුතු ය. ඔබ සතුටින් සිටින ධනවතෙකු විය යුතු ය. මුදල් යනු මහා පුදුමාකාර දෙයකි.

අද මිනිසාට නොමිලයේ ලැබෙනුයේ හුස්ම ගැනීමට අවශ්‍ය වාතය පමණි. අප ජීවත් වන්නේ අනෙකුත් සියලුම

දේ ලබා ගැනීමට මුදල් අවශ්‍ය වී තිබෙන කාලයක ය. අද මිනිසාගේ මූලික අවශ්‍යතාවක් වන ජලය පවා ලබා ගැනීමට බොහෝ දෙනාට මුදල් ගෙවීමට සිදු වේ. ආහාර, ඇඳුම්, විදුලිය ආදි සියලු අවශ්‍යතා තමා වෙත ළඟා කර ගැනීමට මුදල් ගෙවීමට ඔබට සිදු වේ. එමනිසා මිනිසාට වර්තමානයේ මෙ මිහිමත ජීවත් වීමට නම් මුදල් තමා වෙත ළඟා වන්නා වූ ආදායම් මාර්ග තිබිය යුතු ය. ලෝකයේ මුදල් නිෂ්පාදනය කරනුයේ සීමිත මට්ටමකට අනුවයි. හිතුමතේ මුදල් නිෂ්පාදනය නොකරයි. අප රටේ ද මුදල් සීමිත ප්‍රමාණයක් පමණක් තිබේ. රජයට අවශ්‍ය ආකාරයට එය නිපදවිය නොහැක. අප රටේ ඇති පන්දහසේ නෝට්ටු ගැන මහ බැංකුව ස්ථිරවම දනී. එබැවින් වෙනත් අයෙකු ළඟ තිබෙන පන්දහසේ නෝට්ටු තමා වෙත ගෙන්වා ගැනීමට විවිධ වූ උපක්‍රම භාවිත කළ යුතු ය. මන්ද, අපට මුදල් ආකර්ෂණය වනුයේ අප ලබා දෙන සේවාවන් හෝ භාණ්ඩ සඳහායි. මෙ ලෝකයේ භාණ්ඩ හා සේවාවන් හුවමාරු කර ගැනීමට යොදා ගන්නේ මුදල් ය. සෑම භාණ්ඩයකටම හෝ සෑම සේවාවකටම යම් වටිනාකමක් තිබේ. මේ වටිනාකමට අදාළ මුදල් ගෙවූ සැනින් අදාළ භාණ්ඩය හෝ සේවාව තමාට හිමි වේ. මෙ නිසා ඔබ අවබෝධ කරගත යුතු කරුණක් තිබේ. එනම්, මුදල් තමා වෙත ගෙන්වා ගැනීමට නැතහොත් මුදල් ආකර්ෂණය කරගැනීමට අවශ්‍ය බලය අප ප්‍රගුණ කළ යුතුය යන්නයි. **මුදල් මේ ලෝකයේ සෑම තැනකම සැරි සරයි. අද මගේ අතේ ඇති මුදල් හෙට වෙනත් අයෙකු අතට**



**ගමන් කරයි. මෙය මුදල්වල ස්වභාවයයි. වැඩියෙන් බලවත් අය ළඟට යෑමේ පුරුද්ද ඇති මුදල් ඔබ බලවත් නැත්නම් ඔබගෙන් පැන ගොස් ඔබට වඩා බලවත් අයෙකු ළඟට යයි. ඒ අයත් බලවත් නැත්නම් ඒ මුදල් ඔහුගෙන් ද ඉවත් වී වෙනත් අයෙකු වෙතට පත් වේ. මුදල්වල ඇති මේ සුපිරි හැකියාව ඔබ හොඳින් අවබෝධ කර ගත යුතු ය. ඔබ ඉගෙන ගත යුතු කාරණා දෙකක් තිබේ. පළමුවැන්න, නම් ඔබ වෙතට මුදල් ආකර්ෂණය කරවා ගැනීමේ ක්‍රමයයි. දෙවැන්න, ආකර්ෂණය කරගත් මුදල් තමා ළඟ රඳවා ගැනීමේ ක්‍රමයයි.** අද සමාජයේ ජීවත්වන බොහෝ දෙනා මුදල් හම්බ කිරීම ගැන හොඳින් දනිති. නමුත් මුදල් වියදම් කිරීම ගැන කිසිවක් නොදනිති. මුදල් හම්බ කිරීම පහසු ය. නමුත් මුදල් වියදම් කිරීම අසීරු ය. ඔබ මෙලොව බිහි වන්නේ මුදල් කිසිවක් නොමැතිව ය. ඔබ අතට මුදල් ලැබුණ ප්‍රථම දිනය ඔබට මතක ද? ඒ මුදල් ඔබට ලැබුණේ ඔබ ලබා දුන් සේවාවකට ද? එහෙමත් නැතිනම් ඔබ යම් භාණ්ඩයක් විකුණා එම මුදල් ඔබට ලැබුණ ද? එහෙමත් නැතිනම් තෑග්ගක් ලෙස ඔබට මුදල ලැබුණ ද? එදා සිට මේ දක්වා ඔබ වෙතට මුදල් කොපමණ ප්‍රමාණයක් ලැබී ඇත් ද? ඔබේ අත් දෙකෙන් කොපමණ ප්‍රමාණයක් මුදල් ගනුදෙනු කර ඇත් ද? ඒත් දැන් ඔබේ අතේ ඉතිරි වී ඇති මුදල් ප්‍රමාණය කොපමණ ද? ඔබ විසින් ගෙවන සෑම තත්පරයකදීම ඔබ වෙතට මුදල් ගලා එන මාර්ග නිර්මාණය කර ගැනීමට

අධිෂ්ඨාන කර ගන්න. **විශ්වයෙන් ඔබට ලැබෙනුයේ කාලයයි. කාලය මුදල් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය සමීකරණය ඔබ සොයා ගත යුතු ය. එම සමීකරණය සොයා ගැනීමට අවශ්‍ය බලය ඔබට ලැබී තිබේ. ඔබේ සිත එය ඔබට ඉටු කරවා දෙයි.** නමුත් ඔබ ඔබේ සිත සමග මේ ගැන සාකච්ඡා කර තිබිය යුතු ය. සිත සමග එක් වී ඔබට ලැබෙන කාලය මුදල් බවට පරිවර්තනය කර ගත යුතු ය. ඔබේ කාලය නිකරුණේ වැය වේ නම් මේ ගැන ඔබ වහාම සැලකිල්ලට ගන්න. මුලින්ම ඔබ කළ යුත්තේ ඔබ අවදිව සිටින කාලය තුළ ලැබෙන සෑම තත්පරයක්ම වෙනත් ඵලදායී කාර්යයක් වෙනුවෙන් යෙදවීමයි. කාලය අපතේ යන කිසිවක් සඳහා යොමු නොවන්න. ඔබට අවශ්‍ය පොත්පත් එකතු කර ගන්න. ඔබට ලැබෙන අමතර කාලය පොත්පත් කියවීමට හෝ යොමු කරන්න. ඔබ මේ වන විටත් ව්‍යාපාරයක නියැළී සිටී නම් ඔබේ සම්පූර්ණ කාලය ඔබේ ව්‍යාපාරය වෙනුවෙන් වෙන් කරන්න. ව්‍යාපාරය දියුණු කිරීමට අවශ්‍ය දැනුම එක් කර ගන්න. ඔබේ ව්‍යාපාරය දියුණුව කරා මෙහෙයවන ආකාරය ඉදිරියේ දී සාකච්ඡා කෙරේ. ඔබ මේ වන විටත් වෙනත් ආයතනයක සේවය කරයි නම් ඔබ ඒ ආයතනයේ දියුණුව වෙනුවෙන් ආදරයෙන් සේවය කරන්න. මේ පිළිබඳව ද ඉදිරියේ දී සාකච්ඡා කෙරේ. අපේ ජීවිතය තීරණය කිරීමේ බලය අද මුදල්වලට ලැබී තිබේ. නමුත් එය සත්‍යයක් නොවේ. අපේ ජීවිතය ගැන තීරණය කෙරෙනුයේ අපේ සිතයි. සිතිවිලි සහ කාලය එකට නිසි පරිදි යොදවා



මුදල් අප වෙත ළඟා කර ගත හැකි ය. ඒ සඳහා ඔබට අවශ්‍ය වන්නේ 'මුදල් ලබා ගැනීමේ' දැඩි ආශාවයි. අපේ අවශ්‍යතාවයට වඩා මුදල් ලැබෙන විට සිතට දැනෙන සුවය කියා නිම කළ නොහැකි ය. ජීවිතයේ සුන්දර බව අත්විඳීමට මුදල් අවශ්‍ය වේ. ඔබේ ජීවිතයට සුන්දරත්වය සහ සැප එක් කරනුයේ මුදල් ය. **මුදල්, විශ්ව බුද්ධියේ සෘජු නිර්මාණයක් නොවේ. මිනිසා විසින් නිර්මාණය කර ගත් මහා අපූරු නිර්මාණයකි. මේ "මුදල්" නමැති මහා නිර්මාණය මිනිසා තරගකාරී ලෝකයට යොමු කර තිබේ. එකිනෙකා පරදවන තරගකාරී ලෝකය නිසා මේ පෘථිවිය තව තවත් සුන්දර තැනක් වනු ඇත. විශ්ව බුද්ධියේ මහා නිර්මාණයක් වන මේ මිහිතලය දියුණු කිරීමේ බලය විශ්ව බුද්ධියේ සුපිරි නිර්මාණයක් වන මිනිසාට පවරා ඇත. මිනිසාට මේ පෘථිවිය දියුණු කිරීමට අවශ්‍ය බලය ලැබුණේ මිනිසා විසින්ම සොයාගත් මුදල් හරහා ය. මුදල් නිසා මිනිසුන් අතර තරගයක් ඇති විය. මේ තරගය පෘථිවිය දියුණු කෙරිණි. එක් අයෙක් ළඟ ඇති මුදල් තවත් අයෙකු ළඟට ගෙන්වා ගැනීමේ තරගය නිසා මිනිසුන් අතර ඉදිරියට ඒමේ තරගයක් පැවතුණි. නිතරම බලවත් බව ජය ගනියි.** බලවත් වීමට සිත උපකාරී වේ. මුදල් අවශ්‍ය වන්නේ මිහිමත සිටින එකම ජීවියාට ය. ඒ මිනිසාට පමණි. වෙනත් කිසිම ජීවියෙකුට මුදල්වල අවශ්‍යතාවක් නොමැත. ඔවුන් මුදල් හඳුනන්නේවත් නැත. මේ නිසා මුදල් ගැන නොහඳුනන ඒ සියලු ජීවීහු එදා සිටි

තත්ත්වයෙන්ම අදත් ජීවත් වෙති. අව්වට වේලෙමින් වැස්සට තෙමෙමින් තිබෙන ආහාරයක් ගනිමින් ඇඳුමක්වත් නැතිව කිසිදු අරමුණක් නැතිව ඔවුන් ජීවත් වුව ද මිනිසා සුපිරි ගෙවල්වල විවිධ ආකාරයේ ආහාර ගනිමින් ලස්සනට අඳිමින් අරමුණක් සහිතව ජීවත් වේ. මිනිසාට අනෙක් ජීවීන් අතරත් ඉතාමත් ඉදිරියෙන් සිටීමට අවශ්‍ය බලය ලබා දෙන්නේත් ඔහුගේ බලවත් සිතයි. මේ සිතට අවශ්‍ය තරඟකාරී බව මැව්වේ මුදල් බව අපට අවබෝධ වේ. **මුදල් යනු, බලවතා වෙත ආකර්ෂණය වන මහා පුදුම මිනිස් නිර්මාණයකි. මුදල් ආකර්ෂණය වන්නේ මිනිසුන් වෙත පමණි.** වෙනත් කිසිදු වස්තුවකට මුදල් ආකර්ෂණය කරවා ගත නොහැක. ඔබ හොඳින් මුදල් හඳුනා ගත යුතු ය. සාමාන්‍ය ජීවිතයේ දී පවා මිතුරෙකු ආශ්‍රය කිරීමට පෙර ඔහු හොඳින් හඳුනා ගත යුතු ය. ඔබ යමෙකු ඉතා හොඳින් අවබෝධ කර ගැනීමෙන් හඳුනා ගතහොත් ඉතා ප්‍රබල බැඳීමක් ඔහු සමග ඇති කර ගත හැකි ය. ඔබ මෙලෙසම මුදල් ද ඉතා හොඳින් හඳුනා ගන්න. මුදල්වල ඇති ස්වභාවය අවබෝධ කර ගන්න. මිනිසා සහ මුදල් අතර ඇති සම්බන්ධය, මුදල් සහ විශ්ව බුද්ධිය අතර ඇති සම්බන්ධය, මුදල්වල ඇති විශේෂ ගුණාංග ආදී තොරතුරු හොඳින් අවබෝධ කර ගන්න. මුදල්වල හැසිරීම ගැන දැඩිව පරීක්ෂාකාරී වන්න. හොඳ බලවත් මිනිස්සු තමන් අතට මුදල් පත්කර ගැනීමට මහත් ආශාවෙන් සිටිති. ඔබ මෙතෙක් මේ පොත කියවා ඔබගේ තත්ත්වය වෙනස් කර ගත් අයෙක් නම් එසේත් නැත්නම් පොත කියවීමට පෙර



පිටම මෙ කරුණු කාරණා පිළිපැද ඇත්නම් ඔබ තුළ සිදු කරන සුළු වෙනස් කිරීමකින් ඔබ වෙතට මුදල් ගලා ඒමේ මාර්ගය විවෘත කළ හැකිය. මේ බව දැඩිව විශ්වාස කරන්න. මීට පෙර පරිච්ඡේද තුළින් ඔබ තුළ මුදල් ආකර්ෂණය කර ගැනීමට අදාළ පරිසරය ඇති කළ අතර මේ පරිච්ඡේදය මගින් මා අදහස් කළේ මුදල්වල ඇති විශේෂ ගුණාංග ගැන ඔබව දැනුම්වත් කිරීමයි. දැන් ඔබ මුදල්වල හැසිරීම සහ එහි ඇති ගුණාංග ගැන හොඳින් අවබෝධ කරගෙන තිබෙන බවට සහතික වන්න. මුදල් ගැන යම් වැටහීමක් ලබා ගත්තා නම් ඊළඟ අදියර ඔබව කෝටිපතියෙකු බවට පත් කර වන අදියරයි. මුදල් ඔබ වෙත ආකර්ෂණය කරවා ගැනීමට අවශ්‍ය ශිල්පීය ක්‍රම මෙහිදී ඔබට කියා දෙනු ඇත. මේ වනවිට ඔබේ තත්ත්වය පිළිබඳ ඔබ විසින්ම අවබෝධ කර ගන්න. ඔබ මෙතෙක් කියවා එම කරුණු හොඳින් අවබෝධ කරගෙන නැත්නම් ඊළඟ පරිච්ඡේදයට කියවීමට පෙර නැවත හොඳින් පසුගිය පරිච්ඡේද කියවා තේරුම් ගෙන වෙනස් වීම ආරම්භ කරන්න. ඔබේ ධනවත් බවට සෘජුවම බලපාන්නේ ඔබේ සිතයි. බලවත් සිතට සියල්ල කළ හැකියි. බලවත් සිතකට යම් ඉලක්කයක් ලබා දුන් විට එය හඹායන්නේ ඇවිළුණු රොකට්ටුවක් ඉලක්කය හඹා යන්නා සේ ය. කම්මැලි සිතකට ඉලක්කයක් ලබා දුන් විට ඒ මොහොතේදීම එය එම ඉලක්කයෙන් බැහැර වේ. ඉලක්ක හඹා යෑම කෙසේ වෙතත් අවදියෙන් සිටීමටත් ඔවුහු කම්මැලි වෙති. මේ නිසා ඔබ, ඔබේ සිත අවුළුවා ගන්න. සිතට කථා කරන්න. ඔබ ඔබට

ආදරය කරන්න. සතුට සහ සැප ඔබට අත්‍යවශ්‍ය බව සිතන්න. ඔබ ධනවත් විය යුතු ය. ඔබ වෙතට මුදල් නොකඩවා ගලා ආ යුතු ය. මෙ සියල්ල ඔබට ඉතා පහසුවෙන් කළ හැකි බව විශ්වාස කරන්න. ඔබේ සිත ඒකායන අරමුණක පිහිටුවා ගත යුතු ය. ඔබ තනිවන සෑම විටම ඔබේ සිත සමග කථා කරන්න. ඉලක්ක ඉටු වන ආකාරය සිතින් දකින්න. ඔබට සියල්ල කිරීමට අවශ්‍ය ශක්තිය තිබේ.

## 7.2.1. සිතට මුදල් හඳුන්වා දීම - පළමු පියවර

මුදල් සඳහා ඉව කිරීමට ඔබේ සිතට කියා දිය යුතු ය. මෙ සඳහා මුදල් පිළිබඳ දත්ත ඔබේ සිතට බද්ධ කළ යුතු ය. මුදල්වල තොරතුරු ඔබේ සිතට බද්ධ වූ විට සිත මුදල් සෙවීමට පටන් ගනී. සිත මුදල් සඳහා පුරුදු කිරීම අමාරු කාර්යයක් නොවේ. දඩයම් බල්ලෙකුට යමක ඉව පුරුදු කළ විට දඩයමක් සොයා ගන්නා සේ සිතට ද මුදල් පිළිබඳ ඉව පුරුදු කළ විට සිත මුදල් සොයා ගනී. මුදල් හොඳින් හඳුනා ගත් සිත වෙත මුදල් ආකර්ෂණය වන්නේ කාන්දම් කැබැල්ලක් වෙත යකඩ කැබලි ආකර්ෂණය වන්නා සේ ය. ඔබේ සිතට මුදල් පිළිබඳ හඳුන්වා දීම කළ යුත්තේ ඉතාමත් පිළිවෙලකට හා ඕනෑකමකින් යුක්තව ය. ඔබ දැඩිව ඔබේ සිත ශක්තිමත් කර ගත යුතු ය. ඔබේ සිත ඒකායන අරමුණක පිහිටුවා සිත තැන්පත් කර සැහැල්ලුවෙන් දෑස් පියවා **'මගේ සිත මුදල් පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමට සූදානම්. දැන් මම**



**මුදල්වල සුවඳ, මුදල්වල ස්පර්ශය හොඳින් හඳුනා ගනිමි. මගේ සිතට මේ සියල්ල හොඳින් තැන්පත් වේ'** යනුවෙන් සිතන්න. මෙ පොත සමග ඔබ නැවුම් මුදල් නෝට්ටුවක් ලබාගත යුතුය. ඉහත කාර්යය සිදු කිරීමට පෙර ඒ නැවුම් මුදල් නෝට්ටුව ඔබේ අතට ගන්න. එය සෙමින් දෑස් පියවා පිරිමදින්න. මුදල් නෝට්ටුවේ ඇති අකුරු සහ රූප අතේ ඇඟිලිවලට දැනෙන ආකාරය අත්විඳින්න. ඇඟිලි තුඩු අතරට දැනෙන ඒ ස්පර්ශය හොඳින් ඔබේ මොළයේ තැන්පත් කර ගන්න. ඒ ස්පර්ශයට ඔබ ආශා කරන්න. ඔබේ සිත ඒ ස්පර්ශයට පුරුදු කරන්න. ඔබේ සිතට ඒ ස්පර්ශයට අදාළ ඉව ලබා දෙන්න. ඔබේ අත් දෙකෙන්ම ඇඟිලි අතරින් ඉතා සියුම්ව නැවුම් මුදල් නොට්ටුවේ මැදින් අල්ලාගෙන දෙපසට පිරි මදින්න. එහි මතුපිටෙහි ස්වභාවය හඳුනා ගන්න. මුදල් නෝට්ටුව ස්පර්ශ කරන විට අතට දැනෙන සනීපය අත් විඳ එය ඔබේ මොළයේ ස්ථිර ලෙස තැන්පත් කර ගන්න. ඒ වගේම ඒ මුදල් නෝට්ටුව හොඳින් සිඹ එහි සුවඳ හඳුනා ගන්න. එම සුවඳ හොඳින් ඔබේ මොළයේ තැන්පත් කර ගන්න. මෙම සුවඳ හොඳට මොළයට හුරු කරවන්න. මෙ සුවඳ ඔබේ සිතට මහත් ආස්වාදයක් ගෙන දෙන තත්ත්වයට පත් කර ගන්න. මා මේ සමග ඔබට ලබා දුන් නැවුම් මුදල් නෝට්ටුවේ වටිනාකම අඩු වුව ද සෑම මුදල් නෝට්ටුවකම සුවඳ සහ ස්පර්ශය එකම වනු ඇත. මා මේ පොත සමග මුදල් නෝට්ටුව ලබා දුන්නේ මෙ මොහොතේදීම එය ප්‍රායෝගිකව අත් විඳීමේ අවස්ථාව ලබා

දීම සඳහා ය. මෙම පුහුණුවීම සඳහා අලුත්ම පන්දහසේ නෝට්ටුවක් භාවිත කිරීමට හැකි නම් වඩාත් යෝග්‍ය වේ. නමුත් ඔබට ප්‍රායෝගිකව ආරම්භ කිරීමට මෙය ප්‍රමාණවත් වේ. මෙතැන් සිට එක දිගට දිනකට අවම වශයෙන් පස් වතාවක්වත් මෙය සිදු කරන්න. මුදල් නෝට්ටුවල ස්පර්ශය හා සුවඳ හොඳින් අත් විඳින්න. දින කිහිපයක් ඔබ මුදල් නෝට්ටුව සමග මෙය ප්‍රායෝගිකව කරන අතර ඔබේ දෑස් පියාගෙන මුදල් නෝට්ටුව අතේ නොමැතිව මෙම ස්පර්ශය හා සුවඳ අත්විඳින්න. දෑස් පියාගෙන මුදල් නෝට්ටුව සිතින් මැවූ විගස එහි ස්පර්ශය සහ සුවඳ සිතින් මතක් කර ගැනීමට ඔබට හැකිවන තෙක් මුදල් නෝට්ටුව සමග ප්‍රායෝගිකව මේ කාර්ය සිදු කරන්න. දැන් සිතින් මේ ස්පර්ශය හා සුවඳ විඳිමින් **'මට පන්දහසේ මුදල් නෝට්ටුවක් අවශ්‍යයි, මා වෙත එය ආකර්ෂණය වන බව මම දනිමි, මගේ සිතට ස්තුතියි'** යනුවෙන් ද කියන්න ආරම්භ කරන්න. ඔබ ටික දිනක් ඉතාම වුවමනාවෙන් මෙය සිදු කරන විට ඔබ වෙතට නැවුම් පන්දහසේ නෝට්ටුවක් ආකර්ෂණය වනු ඇත. මන්ද, ඊළඟ පුහුණුව සිදු කිරීමට ඔබට පන්දහසේ නෝට්ටුවක් අවශ්‍ය වන බැවිනි. ඔබ තනිවන සෑම මොහොතකම මෙම ප්‍රායෝගික ක්‍රියාකාරකම කරන්න. **සිතිවිලි නාස්ති නොකරන්න. ඔබේ නාසය සොයන්නේ මුදල්වල සුවඳයි. ඔබේ ඇඟිලි තුඩු සොයන්නේ මුදල්වල පහසයි. ඔබේ දෑස් පියවාගත් සැනින් ඔබේ නාසය සහ ඇඟිලි තුඩු සොයන්නේ මුදල්වල සුවඳ සහ ස්පර්ශයයි. පළමු**



**පුහුණුව මෙය වන අතර මෙම පුහුණුව හොඳින් කැප කිරීමෙන් කරන්න. දැඩි වුවමනාව ඔබව ඉක්මනින් පුරුදු කරවයි. නිදා ගැනීමට පෙර මේ ක්‍රියාකාරකම අනිවාර්යයෙන්ම කළ යුතු ය. ඔබේ දෑස් පියාගෙන සෙමින් හුස්ම ගන්න. ඒ සමගම මුදල් නෝට්ටුවක් පිරිමදින්නා සේ ඔබේ ඇඟිලි ක්‍රියාත්මක කරන්න. දැන් නාසයෙන් ගන්නා හුස්ම සමග මුදල් නෝට්ටුවල සුවඳ ඔබට දැනෙනු ඇත. ඒ සමගම ඇඟිලි තුඩු අතර මුදල් ස්පර්ශ වන බව ඔබට දැනෙනු ඇත. ඔබට මෙසේ දැනෙන තෙක් ඔබ පුහුණුව කරන්න. මෙය ඔබට අත් විඳීමට හැකි නම් ඔබට නියත වශයෙන්ම මුදල් ආකර්ෂණය වනු ඇත.** දැන් ඔබේ සිත මුදල් සෙවීමේ ඉලක්කය ආරම්භ කර තිබේ. මුදල් සහ සිත අතර ප්‍රථම බැඳීම සම්පූර්ණ වූ අතර එය තවත් ප්‍රබල කිරීම ඊළඟ පියවරෙන් සිදු කරයි. මෙය කියවන අවස්ථාවේදී ද ඔබට කිසිදු ආදායම් මාර්ගයක් නැතිව ඇති නමුත් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව මේවා පිළිපදින්න. **ඔබට ආදායම් මාර්ග පහළ වී ඔබව සරු දිශාවකට යොමුකර වන්නේ ඔබේ සිත සහ විශ්ව බුද්ධිය එක්වයි.** මේ නිසා ඔබ දැකිය යුත්තේ ඔබේ අනාගතයයි. අතීතයවත්, වර්තමානයවත් ගැන කල්පනා නොකරන්න. නිතරම ඔබ ඔබේ අනාගතයේ සාර්ථකත්වයට පත්ව නිහතමානී ලෙස සතුටින් ගෙවන සුපිරි ජීවිතය ගැන චිත්‍ර සිතේ මවන්න. ඔබට ආදායම් මාර්ග ලැබෙන ක්‍රමවලට අදාළ වැඩ සටහන් විශ්ව බුද්ධිය මගින් සිදුකර එනම්, සිත

හරහා ඔබ වෙත දැනුම දී ඔබව ඒ මාර්ගය වෙත යොමු කරවයි. මෙසේ අවදිවන සිතිවිලි, ක්‍රියාවට නැංවීම තුළින් ඔබට අවශ්‍ය ආදායම් මාර්ග විවෘත වේ. ඒ හරහා ඔබ වෙත මුදල් ගලාගෙන එන්නේ මහා පුදුමාකාර ලෙසට ය. මේ නිසා ඔබ කළ යුත්තේ සිත සමග කථා කරමින් එයට හිමි ගෞරවනීය ස්ථානය ලබා දීම ය.

## 7.2.2. සිතට මුදල් හඳුන්වා දීම - දෙවන පියවර

දෙවන පියවරට ඔබ පැමිණිය යුත්තේ පළමු පියවර සම්පූර්ණයෙන්ම කිරීමෙන් අනතුරුව ය. දෙවන පියවර ආරම්භ කිරීමට පෙර ඔබේ අතේ අලුත්ම පන්දහසේ නෝට්ටුවක් තිබිය යුතු ය. මෙම පන්දහසේ මුදල් නෝට්ටුවේ සුවඳ සහ ස්පර්ශය ඔබ හොඳින් අත්විඳිය යුත්තේ පළමු පියවර අනුගමනය කළ ආකාරයටම ය. පන්දහසේ නෝට්ටුව ඔබ හොඳින් අත් දෙකෙන් අල්ලාගෙන ඇස් දෙක ඒ දෙසට හොඳින් යොමු කරමින් එහි අඩංගු රූප සහ අකුරු දෙසට හොඳින් අවධානය යොමු කරන්න. එහි ඇති සෑම දෙයක්ම සියුම් ලෙස පරීක්ෂාවට ලක් කරමින් එහි රූප සිතේ ගබඩා කර ගන්න. මුදල් නෝට්ටුවේ දෙපැත්තටම හොඳින් අවධානය යොමු කරන්න. එහි දක්නට ඇති වර්ණ රූප සහ අකුරු හොඳින් මතක තබා ගන්න. දැන් ඔබේ අතේ ඇත්තේ ලංකාවේ ඇති වටිනාකමින් වැඩිම නෝට්ටුවයි. නිතරම වටිනාකමින් වැඩි නෝට්ටුව ඔබ මේ සඳහා භාවිත කරන්න.



ඔබේ ආදායම් මාර්ග වැඩි වී ඉහළ ආදායම් ස්ථිර ලෙසම ලැබෙන විට ඇමෙරිකන් ඩොලර් සියයේ නෝට්ටුවක් ගෙන මේ ක්‍රමය අනුගමනය කරන්න. මුල් අදියරේ දී ඔබ භාවිත කළ යුත්තේ පන්දහසේ නෝට්ටුවකි. මිලිමීටර 153×67 ප්‍රමාණයේ පන්දහසේ නෝට්ටුවේ ඇති මහා පුදුම රන්වන් පැහැය. එහි ඇති වෙහෙරගල ජලාශයේ දර්ශනය ඇතුළත් අලංකාර චිත්‍රයත් ඊට පසුබිමින් ඇති කැන්යොන් වේල්ලේ දර්ශනයත් අලංකාර කහ කණ කොණ්ඩයා නමැති කුරුල්ලාගේ රූපය, වමත් පස පහළ කෙළවරෙහි ඇති දෙහි පැරියා නමැති සමනළයාගේ රූපය, දකුණත් පස ඉහළ කෙළවරෙහි ඇති සිංහ රුව, මහා ගම්භීර ලෙස සටහන් කර ඇති පන්දහසේ ඉලක්කම, මේ මුදල් නෝට්ටුවට මහා අලංකාරයක් ලබා දී ඇත. මුදල් නෝට්ටුවේ අනෙක් පස දක්නට ඇත්තේ ලාංකේය අනන්‍යතාව ලොවට හඬ ගා කියනා අලංකාර ගුරුළු රාක්ෂ සහ නාග රාක්ෂ නර්තන රූ දෙකකි. එම රූපය පිටුපස ශ්‍රී ලංකාවේ සිතියම සටහන් කර ඇත. මුදල් නෝට්ටුව වම් පස ඉහළ කෙළවරේ අලංකාර රත්න ප්‍රාසාද මුරගලෙහි සේයා රුවකි. පන්දහසේ නෝට්ටුවට පසුබිම් අලංකාරය එකතු කරන්නේ කල්ප වෘක්ෂ ලියවැල් මෝස්තරයයි. මේ ආකාරයට පන්දහසේ මුදල් නෝට්ටුව හොඳින් හඳුනා ගන්න. එහි ඇති සෑම තැනක්ම හොඳින් මතක තබා ගන්න. ඔබේ දෙනෙත් පියාගත් සැනින් ඔබේ සිතේ පන්දහසේ නෝට්ටුව මවා ගැනීමට පුහුණු වන්න. පන්දහසේ නෝට්ටුව හොඳින් සිතේ ඇඳ ගැනීමට හැකිවන

තුරුම මෙය පුහුණුවන්න. පන්දහසේ නෝට්ටුවේ දෙපසම ඇති පසුබිම සිතේ ඇඳ ගැනීමට පුහුණුවන්න. හොඳින් පුහුණුව ලැබූ ඔබේ සිත මුදල් ඔබ වෙතට ආකර්ෂණය කර දීමට ක්‍රියා කරයි. බොහෝ දෙනා මුදල් නෝට්ටුවල ඇති රූප මතක තබා නොගනිති. මුදල් නෝට්ටුව දුටු විගස එය හඳුනා ගත්ත ද ඒ ගැන වැඩිදුර යමක් පැවසීම කළ නොහැක. මුදල් නෝට්ටුවල දෙපස ඇති රූප බැලීමේ දී ඒවායේ ඇති වර්ණ, මුදල් නෝට්ටුවල ඇති විශේෂ රූප ආදි දේ පිළිබඳ කිසිවක් බොහෝ දෙනාගේ සිතේ ලියවී නැත. මේ පොත කියවන තුරු බොහෝ දෙනා ඒ පිළිබඳ අවධානය යොමු කර නොමැති වූවෝ වෙති. ඔබ මුදල් කොපමණ අතගා තිබුණ ද ඔබ ළඟ මුදල් රැඳෙන්නේ ඔබ හොඳින් මුදල් හඳුනනවා නම් පමණි. ඔබ මුදල්වලට හොඳින් ආදරය කරයි නම්, මුදල් හොඳින් හඳුනනවා නම් ඔබ ළඟට පැමිණෙන මුදල් ඔබ හැරදා නොයයි. ඔබ සුදු කඩදාසියක් හා පැනක් අතට ගන්න. දැන් පන්දහසේ නෝට්ටුව මතකයෙන් සරලව අඳින්න. එහි දිග සහ පළල කොපමණ ද? මෙය හොඳින් පුහුණු වන්න. ඔබ චිත්‍ර ඇඳීමේ හැකියාව නැති අයෙකු විය හැකිය. නමුත් සාමාන්‍ය ආකාරයට මතකයෙන් අදාළ රූප සටහන් කිරීම පමණක් සෑහේ. ඔබේ මතකය කඩදාසියට ගැනීම යනු සිතට එය තවත් ගැඹුරින් තැන්පත් කිරීමකි. ඔබ විසින් අඳින ලද චිත්‍රය සහ රුපියල් පන්දහසේ නෝට්ටුව නැවත පරීක්ෂා කරමින් අඩුපාඩු සම්පූර්ණ කරන්න. ඔබ විසින් අඳින ලද පන්දහසේ නෝට්ටුව ඔබට හොඳින් පෙනෙන තැනක



අලවන්න. එහෙම නැත්නම ඔබට නිතර පෙනෙන තැනක තබාගන්න. ඒ දෙස බලා දැස් පියවා නැවත පන්දහසේ නෝට්ටුව සිතේ අඳින්න. අතින් අඳින ලද කළු සුදු රූපයට සිතෙන් වර්ණ එකතු කරන්න. දැන් ඔබේ සිතේ ඇඳගත් පන්දහසේ නෝට්ටුවට ඔබේ සිතින් සුවඳ සහ ස්පර්ශය එක් කරන්න. සිතේ අඳින පන්දහසේ නෝට්ටුවට ජීවමාන බව ද ලබා දෙන්න. සිතින් පන්දහසේ නෝට්ටු අඳිමින් එයට වර්ණ එක් කරමින් සුවඳ සහ ස්පර්ශය ලබා දෙමින් ඔබ පුහුණුවන්න. ඔබේ සිත සමග නාසයෙන් ගන්නා සුවඳ, ඇඟිලි තුඩුවලින් ගන්නා ස්පර්ශය එක් කර සජීවී බව අත් විඳින්න. සිතින් කරන්නා වූ මේ සජීවී අත් විඳීම මුදල් ආකර්ෂණයට අවශ්‍ය ශක්තිය ඔබ වෙත ළඟා කරවයි. මුදල් නෝට්ටුවේ දෙපැත්ත වෙන වෙගයෙන් සිත යොමු කරමින් රූප මවමින් පන්දහසේ නෝට්ටුව සිතට හොඳින් පුරුදු කරන්න. ඔබේ සිත අතර පන්දහසේ නෝට්ටුව හොඳින් තැන්පත් වී ඇත්නම් ඔබට ඊළඟ පියවර වෙත ළඟා විය හැක. නොමැතිනම් මේ පියවර හොඳින් පුරුදු වන්න. පන්දහසේ නෝට්ටුවේ ඡායාපිටපතක් ගෙන එය නිතර පෙනෙන සේ තබාගන්න. දැන් ඒ රූප බලමින් එයට සිතින් වර්ණ එකතු කරන්න. මේ ක්‍රියාකාරකම සිදුකිරීම කල් නොදමන්න. මේ පොත කියවා නිම කිරීම නොව කියවන අතර එය ප්‍රායෝගිකව අත්විඳීම වඩා වැදගත් බව සිතන්න. එක පිටුවක් කියවීමට ඔබට දින කිහිපයක් ගත වුව ද කම් නැත. එය අත් විඳිමින් ඉදිරියට යන්න.

## 7.2.3. සිතට මුදල් හඳුන්වා දීම - තුන්වන පියවර

ඔබ මෙ වන විට පන්දහසේ මුදල් නෝට්ටුවේ රූපය සමග එහි සුවඳ සහ ස්පර්ශය සිතින් අත් විඳීමට සමත් වෙනැ'යි මම සිතමි. ඔබේ සිතින් සජීවීකරණයට පත් කරන මුදල් නෝට්ටුවට දැන් ඔබේ ආදරය ද එක්කළ යුතු ය. ඔබ සතෙකුට වුව ද ආදරයෙන් සැලකුවහොත් එම සතා ද ඔබට ආදරය දක්වයි. මිනිසාට ආදරය අත්‍යවශ්‍ය වේ. එමෙන්ම මුදල්වලට ද අප ආදරය කළ යුතු ය. මුදල්වලට ඔබ ආදරය කරන විට මුදල් ද ඔබ වෙත ආදරයෙන් ආකර්ෂණය වන බව විශ්වාස කරන්න. පන්දහසේ නෝට්ටුව අතට ගෙන එහි චිත්‍ර සිතේ මවනවාත් සමගම එය ඉතා ආදරයෙන් සිප ගන්න. එය ඔබේ පපුවට තුරුල් කරගන්න. නිදා ගැනීමට පෙර තද හුස්මක් ගෙන පන්දහසේ නෝට්ටුව සිපගන්න. පන්දහසේ නෝට්ටුව ඔබ හිස තබන කොට්ටය යට තබාගන්න. මෙය ඔබ පුරුදු වන තෙක් දින කිහිපයක් පමණක් කරන්න. ඔබ පන්දහසේ නෝට්ටුවට ඉතා භක්තියෙන්, ගෞරවයෙන් ආදරය කරන්න. ඔබ පන්දහසේ නෝට්ටුවලට දක්වන ආදරයට සමානවම පන්දහසේ නෝට්ටු ද ඔබට ආදරය කරන බව විශ්වාස කරන්න. දැන් ඔබේ සිතින් පන්දහසේ නෝට්ටු මවමින්, එයට සුවඳ සහ ස්පර්ශය එක් කරමින් හොඳින් ආදරය කරන්න. ඔබ වෙතට පන්දහසේ නෝට්ටු වේගයෙන් ආකර්ෂණය වන බව විශ්වාස කරමින් දැනෙන්නට සලස්වන්න. ඔබේ දෙනෙත් පියාගෙන ඔබ වෙතට පන්දහසේ



නෝට්ටු වේගයෙන් පාවී එන ආකාරය සිතින් මවමින් සතුටින් ආදරයෙන් අත්විඳින්න. ඔබ වෙතට පැමිණෙන සෑම මුදල් නෝට්ටුවකම පහස සහ සුවඳ අත්විඳින්න. ඒ මුදල් නෝට්ටු ඔබ විසින් එක්රැස් කරගන්නා අයුරු සිතින් මවන්න. මෙය ඔබ ඉතා වුවමනාවෙන් හා ආශාවෙන් පුරුදුවන්න. ඔබේ දෙනෙත් පියාගත් සැනින් ඔබ වෙතට ආකර්ෂණය වන පන්දහසේ මුදල් නෝට්ටු ඔබේ අත් දෙකෙන් අල්ලා එහි සුවඳ ස්පර්ශ කර පිළිවෙලට තබාගන්නා ආකාරයට අදාළ රූප රාමු ඔබේ සිතේ මවාගෙන එය සජීවීකරණය කර ගැනීමට පුරුදු පුහුණු වන්න. මුල්ම කාලයේ දී ඔබ වැඩි වේලාවක් මෙ සඳහා කැප කළ යුතු ය. කැප කිරීමෙන් මෙ කාර්ය කළහොත් ඔබට දින කිහිපයක් තුළ සිත මෙ සඳහා පුහුණු කර ගත හැක. පුහුණු වූ ඔබේ සිතට ඉන් පසු ඕනෑම මොහොත තත්පර කිහිපයකින් ඉහත දර්ශන පෙළ සිතින් මවා ගැනීමේ හැකියාව ලැබේ. දෙනෙත් පියාගත් සැනින් ස්වයංක්‍රීයව කිසිදු ආයාසයකින් තොරව මුදල් මැවීම සහ ආකර්ෂණය කිරීමේ හැකියාව ඔබට ලැබෙන්නේ මුලින් කළ කැප කිරීම මතයි. සත්‍ය වශයෙන්ම ඔබේ අතට ලැබෙන මුදල්වලට ද මෙ ආදරයම දක්වන්න. ඔබේ අතට මුදල් ලැබුණ විගස එය පිළිවෙලකට එක දිශාවකට තබා ඉතා ආදරයෙන් පාවිච්චි කරන්න. මුදල් සඳහා ලබා දිය යුතු ආදරය ඉතා භක්තියෙන් යුතුව දක්වන්න. මුදල් තමා ළඟ රැඳෙන බව ආදරයෙන් මුදල්වලටම කියන්න. ඔබ බස් රථයේ ගමන් කරන විට වටපිට බලනවා වෙනුවට දෑස් පියාගෙන සිතින්

මුදල් මැවීමේ සිහිනය දකින්න. ඔබ තනිවන සෑම මොහොතකම, සෑම දිනකම නිදා ගැනීමට පෙර සහ අවදි වූ සැනින් මේ මුදල් මැවීමේ සිහිනය සිතේ ධාවනය කරන්න. මෙය ටික දිනක් සිදු කරන විට එය ඔබේ ජීවිතයේ පුරුද්දක් වනු ඇත.

පළමු පියවර - මුදල්වල ඇති සුවඳ සහ එහි ස්පර්ශය හොඳින් හඳුනා ගැනීම සහ සිතේ තැන්පත් කර ගැනීම.

දෙවන පියවර - විශාලතම මුදල් නෝට්ටුවේ සඳහන් රූප පිළිබඳ අවධානය යොමු කර එහි චිත්‍ර රූප මවා ගැනීම.

තෙවන පියවර - ඔබේ සිතෙන් මවාගත් මුදල් සඳහා අවශ්‍ය ආදරය දැක්වීම. සිතින් මුදල් සිපගන්න. මුදල් එක දිගටම තමා වෙත ගලා එන බවත් ඒවා එක්රැස් කර ගනිමින් පිළිවෙලකට තබා ගන්නා අයුරුත් සිතින් මවාගන්න. මෙම දර්ශන පෙළ තත්පර කිහිපයක් තුළ සිතේ මවාගැනීමට ඔබ පුහුණුවන්න.



මෙම පියවර තුන ඔබට මුදල් ආකර්ෂණය කරවා ගැනීමට ඇති පළමු ව්‍යායාමය යි. මෙය හොඳින් ඔබේ සිතින් සිදු කරන විට ඔබ වෙතට සැබෑ ලෙසම මුදල් ආකර්ෂණය වීමේ ක්‍රියාව ආරම්භ වන බව පැහැදිලිවම විශ්වාස කරන්න. ඔබ එක දිගටම එකම ආයාසයකින් විශ්වාසයක් ඇතිව මෙය සිදු කරන්න. ටික දිනක් මෙය සිදුකර නැවත අතහැර පරණ [illegible] ජීවත් වන අය බොහෝ ය. ඒ අය සෑම දිනකම පරණ තත්ත්වයෙන්ම කාලය ගෙවනු ඇත. නමුත් ඔබ ඉතා විශ්වාසයෙන් යුතුව එක දිගටම මේ කාර්ය සිදු කරන්න. වසරකට රුපියල් කෝටි ගණනක් උපයන මිනිස්සු බොහෝ ප්‍රමාණයක් මිහි මත ජීවත් වෙති. නමුත් මේ සියලු දෙනාම මුලින් ආරම්භ කරන ලද්දේ බින්දුවෙන් බව අමතක නොකරන්න. ඒ මිනිස්සු මුදල්වලට දක්වන ආදරය මෙන්ම ආශාව ද නිසා අද ධනවත්තු බවට පත් වී සිටිති. මුදලින් ධනවත් වූ සෑම දෙනාම මේ සිහින ප්‍රායෝගිකව දුටු අය වෙති. ඔවුහු නොදැනුවත්වම මේ සියලු ශිල්ප ක්‍රම අනුගමනය කළ අය වෙති. මේ පොත කියවන කෝටිපති ව්‍යාපාරිකයෝ මේ වනවිටත් මෙහි සඳහන් බොහෝ දේ සිදුකරන අය වෙති. මේ පොත කියවන ඔවුන් මෙහි ලියා ඇති වැකියක් පාසාම "මෙය මා දැනටමත් කරනවා" යනුවෙන් සිතනු ඇත. දැන් ඔබ දක්ෂ මුදල් මවන්නෙකු නම් තත්පර කිහිපයක දී මේ දර්ශන පෙළ ඉතා ආශාවෙන් මවාගෙන එහි වින්දනය අත් විඳිය යුතු ය.

## 7.3. දැන් සූදානම වන්න

ඔබේ සිත මුදල් වෙත ආකර්ෂණය වනවිට මුදල් ඔබ වෙත ආකර්ෂණය වේ. ඔබේ සිත මුදල් වෙත ආකර්ෂණය කරගන්නා ආකාරය මේ වනවිට මා පෙර පරිච්ඡේදවල දී පවසා ඇත. ඔබ හොඳින් මෙය ප්‍රායෝගිකව සිදු කරනවා ඇතැයි මම විශ්වාස කරමි. මේ පරිච්ඡේදයේ දී මුදල් ඔබ වෙතට පැමිණීමට අවශ්‍ය ඉඩකඩ හෙවත් ඔබ සතුව තිබිය යුතු ගුණාංග ගැන සාකච්ඡා කෙරේ. මේ ක්‍රියාකාරකම් ඔබේ ජීවිතයේ පුරුදු බවට පත් කරගන්න. ඔබ අනාගතයේ සාර්ථක සතුටින් සිටින ධනවතෙක් බව දැඩිව විශ්වාස කරන්න. ඒ ධනවතාට ඔබ ආදරය කරන්න.

## 7.4. උදෑසනින් අවදිවන්න

උදෑසන සූර්ය උදාවට පෙර ඔබ අවදි විය යුතු ය. දියුණු වීමට කැපකරන සියලුම දෙනා උදෑසන 4.30ට අවදි වේ. මේ වනවිට මා සමග විශාල පිරිසක් උදෑසන 4.30ට අවදි වේ. ඔබත් අප සමග එක්වන ලෙස ආදරයෙන් ඉල්ලා සිටින අතර එකම මොහොතේ විශාල පිරිසක් විශ්ව සැලසුම් බුද්ධියත් සමග සම්බන්ධ වී සිටීම නිසා ඇතිවන බලය අතිවිශාල වේ. ධනවත් බව අපේක්ෂා කරන සිත් දහස් ගණනක් එකම මොහොතක විශ්ව බුද්ධිය සමග සම්බන්ධ වන විට ගොඩ නැගෙන බලය අති විශාල ය. ඔබගේ ප්‍රාර්ථනා



ඉක්මනින් ඉටු කරවා ගැනීමට මෙය ද මහත් පිටිවහලක් වනු ඇත.

උදෑසනින් ඔබ අවදි වූ විගසම ඇඳෙන් බැසීමේ පුරුද්ද ඇති කර ගන්න. අවදි වී විනාඩි කිහිපයක් කල්පනා කරමින්, කම්මැලිකමින් සිටින පිරිස් මා දැක ඇත. නමුත් එය ඉතා නරක පුරුද්දකි. දියුණුවීම බලාපොරොත්තු වන කිසිවෙක් එලෙස අවදි වී නිකරුණේ කාලය ගත නොකරති. **ඔබේ දුරකථනයෙන් හෝ ඔරලෝසුවෙන් ලබා දෙන ශබ්දය ඇසුණ විගසම ඔබ අවදිවන්න. ඔබට තවත් සුන්දර දවසක් උදා වී ඇති බව සිතා 'අද මට තවත් සුන්දර දවසක් උදාකර දුන් විශ්ව බුද්ධියට ස්තුතිවන්ත වෙමි. අද දවස මට සාර්ථක දවසක්. ගතවන සෑම තත්පරයක්ම මට සුබයි, සාර්ථකයි' යනුවෙන් සිතා ඔබේ දෙපා පොළවේ තබන්න. සෑම දිනකම ඔබ අවදි වී දෙපා මිහිමත තැබිය යුත්තේ ඉහත සුපිරි ප්‍රාර්ථනය සිතමිනි.** ඔබ සමග ඔබ සිනා සෙන්න. ඔබගේ හිසට අත් දෙකම තබමින් 'මගේ මොළයට ස්තුතියි' යනුවෙන් සිතන්න. ඉන්පසු ඔබ පිරිසිදු වතුර වීදුරු කිහිපයක් පානය කරන්න. ජලය පානය කරන සෑම අවස්ථාවකදීම අදාළ භාජනය අත් දෙකෙන්ම ඇල්ලීමට පුරුදුවන්න. ජලය යනු විශ්ව පානයයි. ජලය මිනිසාගේ මූලික අවශ්‍යතාවයි. ජලය නොමැතිව මිනිසාට ජීවත් විය නොහැකි ය. ඒ නිසා ජලයට ඔබ සිතින් ගෞරව කළ යුතු ය. අත් දෙකෙන්ම අල්ලාගත් වතුර වීදුරුව

පානය කිරීමට පෙර ජලය දෙස බලා සිතින් ස්තුති කරන්න. ඔබේ කුස පිරෙන තුරු ජලය පානය කරන්න. ඔබේ ශරීරයේ සියලු කොටස් සුවපත්ව තබා ගැනීමට ජලය අවශ්‍ය වේ. ජලය මගින් අභ්‍යන්තර සියලු කොටස් ඉතාම සුවපත්ව තබා ගනී. ඉන්පසු දත්මැද ඔබ පිරිසිදු විය යුතු ය. පසුව කොණ්ඩය පීරා ඔබ නැවුම් තත්ත්වයට පත්විය යුතු ය. හරියටම උදෑසන 5.00 සිට 6.00 දක්වා කාලය ඔබේ අනාගතය සැලසුම් කරන වටිනාම කාලයයි. සිත හොඳින් සන්සුන් කර ගැනීම මුලින්ම කළ යුතු ය. ඉතා ප්‍රබෝධයෙන් හා සතුටින් ඔබ සිටින්න. ප්‍රභාශ්වර වූ සිතට ඇත්තේ මහා පුදුම ආකර්ෂණ බලයකි. ඔබව නිර්මාණය කළ ඔබ ජීවත්වන විශ්වයට ස්තුති කරන්න. දැන් ඔබ ගැන සිතින් ස්තුති කරන්න. ඔබට ලැබුණ මේ සුපිරි ජීවිතයට, ශරීරයේ ඇති සියලුම කොටස්වලට, ඔබේ සුපිරි මොළයට හොඳින් ස්තුති කරන්න. ඔබ මෙලොවට බිහිකළ දෙමාපියන්ට, දැනුම ලබා දුන් ගුරුවරුන්ට, ඔබට උදව් කළ සියලු දෙනාටම හොඳින් ස්තුති කරන්න. ඔවුන්ගේ දියුණුව සුවපත්බව හා සතුට ප්‍රාර්ථනා කරන්න. අනතුරුව ඔබ ඔබේ සිත සමග හොඳින් කථා කරන්න ආරම්භ කරන්න. දෑස් පියාගෙන රුපියල් පන්දහසේ නෝට්ටුව සජීවීකරණය කරන්න. ඔබ වෙත විශාල වශයෙන් මුදල් ආකර්ෂණය වන බව සිතින් දකින්න. ඔබේ අනාගතය සරුවන ආකාරය සිතින් දකින්න. දැන් ඔබ කළ යුතු වැදගත්ම කාර්යයක් තිබේ. ඔබ වසර 10කින් පසු ඔබ ළඟා කරගන්නා ඉලක්කය නිශ්චිත වශයෙන් හඳුනා ගන්න. ඔබේ ඉලක්කය ස්ථිර නිශ්චිත එකක්



විය යුතු ය. මේ ඉලක්කය හොඳින් කල්පනා කර හඳුනාගත්, ඔබට ගැලපෙන එකක් විය යුතු ය. එම ඉලක්කයට ඔබ ළඟාවන තුරුම එය වෙනස් නොවිය යුතු ය. එය දීර්ඝ කාලීන තීරණයකි. සෑම විටම ඔබ ජීවත්විය යුත්තේ මෙම ඉලක්කය සමග ය. ඔබ සිහින දැකිය යුත්තේ මෙම ඉලක්කය ගැන ය. සිත සමග මේ ඉලක්කය ගැන කථා කරන විට දිනීම අවස්ථාවක කාලය ගැන කථා නොකරන්න. නමුත් මෙය ඔබේ වසර 10කට පසු ළඟාවන ඉලක්කයකි. දැන් ඔබට වසරක් තුළ ළඟා විය යුතු කෙටි කාලීන ඉලක්ක එකක් හෝ කිහිපයක් හඳුනාගන්න. දීර්ඝ කාලීන ඉලක්ක සහ කෙටි කාලීන ඉලක්ක අතර යම් සබඳතාවක් තිබීම ඉලක්ක කරා යාම පහසු කරවන්නකි. ඔබට ප්‍රථමයෙන් දීර්ඝකාලීන ඉලක්කය ගැන සිත සමග කථා කරන්න. අනතුරුව කෙටි කාලීන ඉලක්ක ගැන හොඳින් වැඩි වේලාවක් සිත සමග කථා කරන්න. අදාළ ඉලක්ක ඉටු කර දීමට ඔබේ සිතට හැකියාවක් තිබෙන බව දැඩිව විශ්වාස කරන්න. පසුව ඔබට උදව් කරන සියලු දෙනාට ස්තුති කරන්න. අද දවසේ ඔබට ලැබෙන සෑම තත්පරයක්ම ඔබට ජය ගෙනෙන තත්පරයක් බවත් ඔබේ ඉලක්ක ජය ගැනීමට අදාළ සිතිවිලි ඔබේ සිත වෙත ආකර්ෂණය වන බවත් ඔබේ සිතට කියන්න. අවම වශයෙන් විනාඩි 45ක් වත් උදෑසන ඔබේ සිත සහ විශ්වය සමග කථාකරන්න. මෙය භාවනාවක් කරනවා සේ සන්සුන් ඉතා නිදහස් පරිසරයක් තුළ සිදුකරන්න.

මෙසේ ඔබ එක දිගටම සිදුකරනවිට ඔබේ ඉලක්ක ඉටුකරවා දීමට අදාළ නොයෙක් වැඩසටහන් විශ්ව බුද්ධියෙන් සැලසුම් වී ඔබේ සිත වෙතට සිනිඳු ආකාරයෙන් පැමිණේ. එම සිතිවිලි ක්‍රියාවට නැංවීම ඔබ විසින් ඉතා ඉක්මනින් කළ යුතු ය. දවස අවසානයේ නින්දට පෙර කෙටි වේලාවක් ගෙන අද දවසේ ඔබට උදව් කළ විශ්ව බුද්ධියට, ඔබ ඔබේ සිත ඇතුළු, ඔබේ ශරීරයට සහ උදව් කළ සියලු දෙනාටම සිතින් ස්තුති කරන්න. හෙට දවස සැලසුම් කළ යුත්තේ නින්දට සුළු මොහොතකට පෙර ය. කඩදාසියක හෙට දවසේ ඔබ කරන කාර්යයන් පිළිවෙළකට ලියන්න. අද දවස පිළිබඳව ද ඔබ සමාලෝචනයක් සිදු කරන්න. කිසිවක් කල් නොදමන්න. දැන් කළ යුතු දේ මේ දැන්ම කරන්න. දැන් ඔබේ ජීවිතය ඉතා පිළිවෙළකට, සැලසුමකට අනුව ගමන් කරන බව සිතා සතුටු වන්න. ඔබ හෙට අඳින ඇඳුම පවා අද සැලසුම් කළ යුතු ය. නිසි සැලැස්මක් තුළින් උසස් ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි ය. කැප කරන්න කම්මැලි නොවන්න. උදෑසන අවදි වූ මොහොතේ සිට රාත්‍රී නින්දට යන තුරු ඉතාමත් ප්‍රබෝධයෙන් කාලය ගත කරන්න. හැකි සෑම මොහොතකම ඔබේ සිත සමග කථා කරන්න. ඔබේ ඉලක්ක සිතේ ප්‍රදර්ශනය විය යුතු ය. මුදල් ඔබ වෙත ආකර්ෂණය වන බව දැඩිව දැන ගන්න.



## 7.5 ජීවිතය පටන් ගන්න

මෙතෙක් මා විස්තර කළ කරුණු ඔබ ප්‍රායෝගිකව යෙදී සිටි නම් ඔබගේ සිත ඇවිළුණු තත්ත්වයකට පත්වේ. එනම්, සිත ප්‍රබෝධවත් ව ඉතා විශාල බලයකින් අවදි වී තිබේ. දැන් සිතට "අවශ්‍යතාව" අවශ්‍ය වී තිබේ. ඉහත ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව අත්හදා බලමින් ඒ සාර ධර්මයන්ට අනුකූලව ජීවත් වෙමින් ඔබේ ආදායම වර්ධනය කර ගැනීමේ යෝධ පියවර දැන් ඔබ තැබිය යුතුය.

මුලින්ම ඔබ කළ යුත්තේ ඔබේ දෛනික වියදම් ගණනය කිරීමයි. දෛනිකව ඔබට වියදම් වන සියලුම වියදම් මේ සඳහා ඇතුළත් කළ යුතු ය. ඔබට නොමිලයේ යම් යම් දෑ ලැබුණ ද එහි වටිනාකමත් මෙයට එකතු කරන්න. ඔබ තනිව ජීවත් වුවහොත් ඔබට වැයවන වියදම, ඔබ විවාහක නම් හෝ ඔබෙන් යැපෙන අය සිටිනම් ඒ සියලු වියදම් ඇතුළත් ඔබේ දෛනික වියදම නිවැරදිව සොයා ගන්න. ඔබේ පළමු ඉලක්කය විය යුත්තේ දෛනික වියදමට වඩා වැඩියෙන් තම ආදායම වැඩි කර ගැනීමයි. මෙම දෛනික සැලසුම ඔබ ඉක්මනින්ම ජය ගත යුතු ය. ඔබට දෛනිකව මුදල් ඉපැයිය හැකි ක්‍රම ගැන සොයා අධ්‍යයනය කරන්න.

ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න. ඉතාම ඕනෑකමකින් හා ආශාවකින් මේ සියල්ල කළ යුතු ය. ඔබේ අනාගතය

ගොඩනැගෙමින් තිබෙන බව නිතරම සිතන්න. තවද, අද ඔබ සිදු කරන ක්‍රියාකාරකම් ඔබට අත්දැකීම් වනු ඇත. ඔබේ අනාගතය, ඔබේ ජීවිතය ගොඩ නැඟෙන්නේ ඔබේ ම අත්දැකීම් මත ය. ඔබේ දෛනික ආදායම වියදමට වඩා වැඩි නම් ඔබේ සිතට ඔබ ස්තුති කරන්න. ඉන් පසු ඔබ, ඔබගේ දෛනික ආදායම් ස්ථාවරව තබා ගැනීමට කටයුතු කළ යුතු ය. නින්දට යෑමට පෙර දෛනික ආදායම් හා වියදම් පිළිබඳ විස්තර සටහන් කිරීමට පුරුදු වන්න. දෛනිකව ඔබ ලාබ ලබන තත්ත්වයට පත් විය යුතු ය. පිළිවෙළ, කැපකිරීම සහ අවශ්‍යතාව එකට එක් වූ විට ඔබේ ඉලක්ක ජය ගැනීම පහසුවෙන් කළ හැකි ය. උදෑසන අවදි වූ මොහොතේ සිට රාත්‍රී නින්දට යන තෙක් අතර ඇති කාලය නිසි ලෙස ප්‍රයෝජනයට ගන්න. ගතවන සෑම තත්පරයක්ම ඵලදායී ලෙස ගත කරන්න. ඔබට ආදායම් මාර්ග ලැබෙන ක්‍රම ගැන අධ්‍යයනය කරන්න. ඔබට ආදායම් මාර්ග ලැබෙන බව නිතරම සිතන්න. නව ආදායම් මාර්ග විවෘත වී ඒ ඔස්සේ ඔබ වෙත මුදල් ගලා එන ආකාරය සිතින් මවන්න. සිත සමග කථා කරන්න. උදෑසන අවදි වීමෙන් පසු කරන භාවනාවේ දී ඔබේ ආදායම වැඩිවන ආකාරය ගැන සිත සමග කථා කරන්න. නිතරම සිත සමග ආදායම් මාර්ග පිළිබඳව කථා කරන විට ඔබේ සිතට නව ආදායම් මාර්ග පිළිබඳව සිතිවිලි ගලා එයි. පසුව ඒවා ක්‍රියාත්මක කර නව ආදායම් මාර්ග සකසා ගන්න. ඔබ සතුව ඇති සෑම ආදායම් මාර්ගයකටම සිතින් ගරු කරන්න. සිතින් ආදරය කරන්න. එම ආදායම් මාර්ග පාලනය කිරීමට



වෙනස ක්‍රම හඳුනාගන්න. සෑම ආදායම් මාර්ගයකටම අදාළ සියලු ගනුදෙනු අනිවාර්යයෙන් ම පොතක සටහන් කරන්න. දවස අවසානයේ දී වෙන වෙනම ඒ ආදායම් මාර්ගවලට අදාළ ලාබ සොයන්න. දවසින් දවස ඒ ආදායම් වැඩි කරවා ගැනීමට උත්සාහ කරන්න. ඔබ උපයන මුදල් වියදම් කිරීමේ දී සැලකිලිමත් වන්න. වියදම් යනු, ඔබ උපයන මුදල් ඔබ හැරදා වෙනත් අයෙකු වෙත යෑමයි. ඔබ උපයන මුදල් ඔබ වෙත රැඳිය යුතු ය. ඔබගෙන් පිටවන මුදල් කිප ගුණයකින් වර්ධනය වී නැවත ඔබ වෙත පැමිණෙන බව තරයේ විශ්වාස කරන්න. ඔබේ අතින් වෙනත් අයෙකුට මුදල් ගෙවන විට හෝ ලබාදෙනවිට හෝ,

01. මුදල් අත් දෙකෙන්ම අල්ලා ලබාදෙන්න.

02. මුදල් එකම දිශාවකට සිටින සේ පිළිවෙළට තබා දිගහැර ලබාදෙන්න. මුදල් ගුලිකර හෝ නවා ලබාදීමෙන් වළකින්න.

03. "**මේ මුදලින් ඔබට යහපතක්ම වේවා**" යනුවෙන් ඔබ මුදල් ලබාදෙන අයට කියන්න පුරුදු වන්න.

04. මුදල් ලබා දීමේ දී "**මේ මුදල් කිප ගුණයකින්**

**වැඩි වී නැවත මා ළඟටම ආකර්ෂණය වේවා"** යනුවෙන් ඔබේ සිතින් සිතන්න. සිතින් සිතන මෙ වාක්‍ය හොඳින් පුහුණු වන්න.

ඔබ කරන වියදම සිතේ සතුටින් කරන්න පුරුදු වන්න.

බොහෝ වියදම ඔබේ ජීවිතයේ අනාගත ආයෝජනයි. ඔබෙන් මුදල් ලබන්නාගේ සිත සතුටුවන ආකාරයට ගනුදෙනුව කරන්න. මුදල් ලබාදෙන විට "මෙ මුදලින් ඔබට යහපතක්ම වේවා" යනුවෙන් ඔබ කියනවිට ඒ මුදල් ලබා ගන්නා අය ඔබට ද පෙරලා ස්තුති කරනු ඇත. ඔබ සහ මුදල් ලබන්නා අතර දැඩි ලෙස සිතින් සම්බන්ධතාවක් ගොඩනැගේ. ඔබ විශ්වාස කළ යුත්තේ ඔබ ලබාදෙන මුදල් කිහිප ගුණයකින් වර්ධනය වී නැවත තමා ළඟටම පැමිණෙන බවයි. කිසිම විටෙක අනවශ්‍ය ලෙස මුදල් වියදම් නොකරන්න. වියදම් කිරීම මුදල් ඉපයීමට වඩා අමාරු කාර්යයකි. මන්ද, වියදම් කිරීම ගැන ඉතා කල්පනාකාරී වියයුතු බැවිනි. ලෝකයේ බොහෝ දෙනා මුදල් ඉපැයීමට දක්ෂ වුවත් වියදම් කිරීමේ දී දක්ෂයෝ නොවෙති. වියදම් කිරීමේ දක්ෂතාව යනු, වැඩියෙන් වියදම් කිරීම නොව කළමනාකරණයක් ඇතිව වියදම් කිරීමයි.

මුදල් තමා වෙත ලැබෙන විට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තිබේ. ඔබට මුදල් ලැබෙන විට,



01. අත් දෙකෙන්ම ඒ මුදල් අල්ලා භාර ගන්න.

02. **"ස්තුතියි, ඔබට යහපතක්ම වේවා"** යනුවෙන් කියන්න පුරුදු වන්න.

03. ඔබට ලැබෙන මුදල් ගුලිකර සාක්කුවේ නොදමන්න. ඒවා එක දිශාවකට තබා පිළිවෙළට සකස් කර තබාගන්න.

ඔබ කරන සියලු ගනුදෙනු සිතේ සතුටින් සිදු කරන්න. ඔබට මුදල් ලැබෙන විට විශ්ව බුද්ධියට ස්තුති කරන්න. ඔබේ සිතට ස්තුති කරන්න. වෙනත් අයෙකු ළඟ ඇති මුදල් ඔබ ළඟට පැමිණි බව නිතර සිතන්න. ඔබ වෙත මුදල් ආකර්ෂණය වන බව හොඳින් අවබෝධකර ගන්න. මුදල්වල ලක්ෂණය වන්නේ තැනින් තැන, අතින් අත ගමන් කිරීමයි. මුදල්වල ඇති මෙ විශේෂ ලක්ෂණය අප හඳුනාගත යුතු ය. මුදල් ඔබ සමීපයට පැමිණෙන්නේ එම ලක්ෂණය සහිතවයි. ඉන්පසු එම මුදල් ම ඔබව හැර දමා වෙනත් අයෙකු වෙත යයි. නමුත් ඔබ ළඟට එන මුදල් දිගු කාලයක් ඔබ සමීපයෙහි රඳවා තබා ගැනීමට අවශ්‍ය නම් ඔබ සතු එම මුදල්වලට නිසි ගෞරවය ලබා දිය යුතු ය. මුදල් ලබා ගැනීමේ දී සහ මුදල් ලබා දීමේ දී ඉහත ක්‍රියාමාර්ග අනිවාර්යයෙන් ම පිළිපදින්න. දෙවැන්න නම්, ඔබ මුදල් රඳවා තබා ගන්නා ආකාරයයි. ඔබ මුදල් ප්‍රධාන වශයෙන්ම රඳවා තබා ගන්නේ ඔබේ පසුම්බියේ ය.

ඔබේ මුදල් පසුම්බියේ තිබිය යුත්තේ මුදල්වලට හිතකර තත්ත්වයකි.

ඔබේ මුදල් පසුම්බිය,

01. මුදල් පසුම්බිය අලුත් තත්ත්වයෙන් තිබිය යුතු ය. ඉරීගිය, කඩතොලු වූ පසුම්බි භාවිත නොකරන්න. ඔබේ මුදල් රඳවා තබා ගන්නා පසුම්බිය ගැන සැළකිලිමත් වී හොඳ වර්ගයේ මුදල් පසුම්බියක් භාවිත කරන්න.

02. ඔබේ මුදල් පසුම්බියේ තිබිය යුත්තේ මුදල් නෝට්ටු පමණි. බොහෝ පුද්ගලයන්ගේ මුදල් පසුම්බි තුළ කඩදාසි කැබලි, විසිටින් කාඩ්, මුදල් කාසි ආදී දේ දැකගත හැකිය. එය සුදුසු නොවේ. මුදල් නෝට්ටු පමණක්ම භාවිත කරන්න. හැඳුනුම්පත් හා බැංකු කාඩ්පත් ඔබට භාවිත කළ හැකි ය.

03. ඔබේ හැකියාව අනුව ස්ථාවර මුදලක් එහි තිබිය යුතු ය. එම ස්ථාවර මුදල රුපියල් පන්දහසේ (වැඩිම වටිනාකමක් ඇති) නෝට්ටුවලින් තබාගන්න. (5000,10000,15000 වශයෙන්)



04. එම ස්ථාවර මුදල කිසිවිටකත් භාවිත නොකරන්න. ඔබේ මුදල් පසුම්බිය ඔබ සමගම ඔබේ ළඟින් සිටියි. පසුම්බියේ රුපියල් පන්දහසේ මුදල් නෝට්ටු ඇතිවිට ඔබත් සමග රුපියල් පන්දහසේ මුදල් නෝට්ටු නිතරම ළඟ සිටියි. එය මුදල් ආකර්ෂණයට හේතු වේ. ඒ

පන්දහසේ නෝට්ටුවලට පන්දහසේ නෝට්ටු ආකර්ෂණය වන බැවිනි.

05. මුදල් නෝට්ටු සියල්ල එකම දිශාවකට දිගහැර තැන්පත් කරන්න.

06. නිතර මුදල් පසුම්බියෙන් මුදල් ඉවතට ගැනීම නොකළ යුතු ය. ඔබ පුරුදු විය යුත්තේ මුළු දවස පුරාම එකම වතාවක්වත් මුදල් පසුම්බිය භාවිත නොකර සිටීමට ය. පසුම්බිය නිතර සාක්කුවෙන් ඉවතට ගැනීම එතරම් හොඳ කාර්යයක් නොවේ.

07. ඔබේ මුදල් පසුම්බිය සමග ගනුදෙනු කළ යුත්තේ ඔබම පමණි. වෙනත් කිසිම අයෙකුට ඔබේ පසුම්බිය ලබා නොදිය යුතු ය. වෙනත් කිසිම අයෙකුට පසුම්බියෙන් මුදල් ඉවතට ගැනීමට ඉඩ නොදිය යුතු ය.

08. ඔබේ නිවසේ දී මුදල් පසුම්බිය තැබීමට නිශ්චිත ස්ථානයක් වෙන්කර ගන්න. ඒ ස්ථානයේ ම පිළිවෙළට ඔබේ පසුම්බිය තැබිය යුතු ය. බොහෝ දෙනා සාක්කුවෙන් පසුම්බිය ඉවතට ගෙන මේසයට හෝ ඇඳට හෝ එය විසි කරති. නමුත් එය නොකළ යුතු දෙයකි. මුදල් පසුම්බිය භාවිත කළ යුත්තේ ඉතාමත් ගෞරවයෙනි.

09. මුදල් පසුම්බියේ ස්ථාවර මුදල් ප්‍රමාණයට අමතරව හදිසි අමතර වියදම් සඳහා වෙනත් මුදල් ප්‍රමාණයක් තබා ගන්න. නිතරම වැඩි වටිනාකමක් ඇති මුදල් නෝට්ටු භාවිත කරන්න. පසුම්බියේ ඇති ස්ථිර මුදල් පන්දහසේ මුදල් නෝට්ටු විය යුතු ය. නමුත් වියදම් සඳහා ඔබට අවශ්‍ය ඉහළ අගයක් ඇති මුදල් නෝට්ටු භාවිත කරන්න.

10. යම් හේතුවකින් ඔබේ මුදල් පසුම්බියේ මුදල් වියදම් වුවහොත් හැකිතාක් ඉක්මණින් එම මුදල හෝ ඊට වැඩි ප්‍රමාණයක් පසුම්බියට එකතු කරන්න. කුමන හදිසි අවශ්‍යතාවක් මතු වුව ද මුදල් පසුම්බියේ ඇති ස්ථාවර මුදල භාවිත නොකරන්න. සෑම දිනකම, සෑම තත්පරයකම ඔබ සතුව මුදල් තිබීම අනිවාර්ය බව සලකන්න.



ඔබ මුදල් පසුම්බිය භාවිත කිරීමේ දී ඉහත කරුණු දහය අනිවාර්යයෙන්ම පිළිපදින්න. ඔබේ ධනවත් බවට මෙම පුරුදු අත්‍යවශ්‍ය වේ.

ඔබේ දෛනික වියදම් සඳහා අවශ්‍ය මුදල් කිසිවිටකත් පසුම්බියේ තබා නොගන්න. මන්ද, එවිට දිනකට කිහිප වාරයක්ම ඔබේ පසුම්බිය විවෘත කිරීමට අවශ්‍ය වන බැවිනි. එම නිසා දෛනිකව වියදම් මුදල් ඔබේ මුදල් පසුම්බියෙන් ඉවත සාක්කුවක හෝ බෑග් එකක තබා ගන්න. එවිට ඔබේ පසුම්බිය විවෘත කිරීමට අවශ්‍ය නොවේ. මුදල් වියදම් කිරීමේ දී නිතරම පාලනයකින් යුතුව එය කළ යුතු ය. එය පාලනය කිරීමට ඉහත පුරුදු අනුගමනය කරන්න. ටික දිනක් යනවිට ඔබේ මුදල් පසුම්බිය මුදල්වලින් පිරී ස්ථාවර වන අතර ඔබ ළඟ මුදල් තැන්පත් වන්නේ මහා පුදුමාකාර ලෙසින් ඔබව පුදුමයට පත් කරවමිනි.

එමෙන්ම රාත්‍රී නින්දට යෑමට පෙර ඔබ දෛනිකව සිදුකළ වියදම් සහ ඔබට ලැබුනු ආදායම් වෙනම පොතක සටහන් කරන්න. දෛනිකව සිදු වූ සෑම වියදමක්ම ඔබේ විශේෂ අවධානයට ලක් කරන්න. එම වියදම්වලින් කපා හැරිය හැකි අනවශ්‍ය වියදම් හඳුනා ගන්න. ඉදිරියේ දී එවැනි වියදම් සිදු නොකිරීමට තීරණ ගන්න. පොත්වල සටහන් කිරීමෙන් අනතුරුව ඔබ දවස තුළ ලාබ හෝ අලාබ තත්ත්වයේ සිටින්නේදැයි හඳුනාගන්න. දෛනිකව ඔබ ලාබ ලැබීම අනිවාර්යයෙන්ම කළ යුතු ය. ඔබේ මුදල් පසුම්බියේ, ඔබේ

අතේ (දෛනික වියදම්) සහ බැංකු ගිණුම්වල ඇති මුදල් ශේෂ ගණන් බලන්න. නිවැරදි ශේෂයන් ඉදිරි දිනය ආරම්භ වනවිට දැනගෙන සිටිය යුතු ය. එවිට ඔබ සතුව ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය දිනෙන් දින වැඩිකර ගැනීම නිවැරදි ක්‍රමයකට අනුව සිදුකරගත හැකි ය. දෛනිකව ශේෂ සොයාගත් පසු ඒ ශේෂ සහ ඔබ ළඟ ඇති සත්‍ය මුදල් ප්‍රමාණ ද ගණනය කර ශේෂ සන්සන්දනය කරන්න. අනතුරුව මුදල් සියල්ල පිළිවෙළකට එකම දිශාවකට දිගහැර මේසය මත තබන්න පුරුදු වන්න. මුදල් ගුලිකර හෝ නවා තැබීමෙන් වළකින්න.

එමෙන්ම දිනපතා ඔබට ඇති හැකියාව අනුව උපරිම මුදලක් ඉතුරු කරන්න. ධනවතෙකු වන ඔබ ඉතිරිකිරීමේ පුරුද්ද ප්‍රගුණ කළ යුතු ය. ඒ නිසා දෛනිකවම මුදල් ඉතිරි කරන්න. නිතරම ඔබ වැඩ කළ යුත්තේ ඔබ සතුව ඇති මුදල්වලට අනුවයි. ඉතිරි කළ මුදල් සඳහා වියදම් සැලසුම් නොකරන්න. **බොහෝදෙනා වැඩ කරන්නේ අනුන්ගේ අතේ තිබෙන මුදල්වලට ය. කිසිම දිනක ඔබ කරන කිසිදු සැලසුමක් අනුන් අත තිබෙන මුදල් සඳහා සිදු නොකරන්න. මේ මොහොතේ තමන් සතුව ඇති මුදලට අනුව සැලසුම් කරන්න. ඔබ සැලසුම් කළ යුත්තේ ඔබ සතුව ඇති මුදල් වර්ධනය කර ගැනීමට අවශ්‍ය උපක්‍රමයි. කිසිම ලෙසක තවත් කෙනෙකුගෙන් මුදල් ණයට නොගැනීමට දැඩි ලෙස තීරණය කරන්න. මිනිසුන්ගෙන් මුදල් ණයට හෝ පොළියට ගැනීම ඔබට**



**සම්පූර්ණයෙන් ම තහනම් බව තරයේ සිතට ගන්න. ඔබට වෙනත් මූල්‍ය ආයතනයකින් ව්‍යාපෘති ණයක් අවශ්‍ය නම්, ගත යුත්තේ ඔබේ මාසික ශුද්ධ වර්තමාන ආදායම මාසික ණය වාරිකය මෙන් දස ගුණයකින් වැඩි නම් පමණි.** මෙය ද ඔබේ ජීවිතයේ කිසි දිනක අමතක නොකළ යුතු නීතියකි. එනම්, ණය මුදලක් මූල්‍ය ආයතනයකින් ලබා ගනී නම් එහි මාසික වාරිකය මෙන් දස ගුණයක් ඔබේ ශුද්ධ ආදායම තිබිය යුතු ය.

එමෙන්ම ඔබ මුදල් ණයට දීමෙන් ද වළකින්න. කුමන අවස්ථාවකදීවත් නැවත ලබා ගැනීමේ පරමාර්ථයෙන් මුදල් කිසිවෙකුටත් ණයට ලබා නොදෙන්න. එසේ ණයට මුදල් ලබා දීමේ ප්‍රතිඵලය වන්නේ, ණයට දුන් ඔබේ හිතවතා ඔබට අහිමි වී සිතට දුකක් එක් වී ඔබට අලාබයක් සිදුවීමයි. මේ නිසා ඔබ ප්‍රතිපත්තියක් ලෙස මුදල් ණයට ලබා දීමෙන් වළකින්න. ඔබ උපයන මුදල් ඔබ ළඟට ගෙන්වා ගැනීමට ඔබ දැඩි කැප කිරීමක් කළ යුතු ය. ඒ මුදල් නිකරුණේ වෙනත් අයෙකු හට ලබා දීම ඔබ උපයන මුදල්වලට කරන නිගරුවකි. ඔබේ සීමාවන්ට අනුව පුණ්‍ය කටයුත්තක් හෝ වෙනත් කාර්යයක් සඳහා මුදල් පරිත්‍යාග කිරීමේ කිසිදු වරදක් නැත. එම අවස්ථාව සිතට ප්‍රීතියක් ගෙන දෙයි. කිසිවිටෙක ඔබ අනෙක් අයගේ යහපත උදෙසා කරන පරිත්‍යාග මගින් ඔබේ මුදල් ප්‍රමාණය අඩු නොවේ. ඔබෙන් ඉවතට යන මුදල් ප්‍රමාණය පිරවීම සඳහා ඔබ බලාපොරොත්තු නොවූ ආදායම්

මාර්ග ඔබ වෙතට ලඟා වී. ඔබ සිත සතුටින් කළ පරිත්‍යාග මෙන් කිහිප ගුණයකින් වැඩි මුදල් ඔබ වෙතට ගලා ඒ. ඔබ කිසිම විටෙක අධික තණ්හාවෙන් පිරුණු අයෙකු නොවිය යුතු ය. ආදායමට සරිලන සේ ඇඳුම් පැළඳුම් භාවිත කළ යුතු ය. ඔබ කැමති ආහාර පාන රස විඳින්න. නිතරම පිරිසිදුව, පිළිවෙළකට සිතේ සතුටින් ජීවත් වන්න. මුදල් උපයන අතර සිත සතුටින් තබාගැනීම අවශ්‍ය වේ. එමෙන්ම ඔබ යුතුකම් ඉටු කරන, ගරු කළ යුතු අයට ගරු කරන, ප්‍රසන්න අයෙකු විය යුතු ය. තවත් අයෙකු අපහසුතාවට පත්වන ආකාරයට කටයුතු නොකළ යුතු ය. නිතරම විශ්වයේ ඇති සුන්දරත්වය අත්විඳින්න. ආදායම් මාර්ග වැඩි කර ගැනීම සඳහා තම තීක්ෂණ බුද්ධිය යොදා ගන්න. විශ්වයේ සුපිරි බුද්ධිය ගැන සිතන්න. ඔබේ සිත ගැන දැඩිව විශ්වාස කරන්න. සිතට සියල්ල කළ හැකි බව ඔබ දැන ගත යුතු ය. සියලු බලවේග සිතට යටත් බව අමතක නොකරන්න. ඔබේ සිතේ ඇති බලවත් බව ඔබ හොඳින් අවබෝධ කර ගන්න. සිත පිළිබඳ විශ්වාස කර හොඳින් පුරුදු පුහුණු වී මෙහි සඳහන් කරුණුවලට අනුව ජීවත් වුවහොත් සෑම දිනකම ඔබට මුදල් ආකර්ෂණය මිස විකර්ෂණයක් සිදු නොවේ. සිත දුර්වල මිනිසාට ග්‍රහ බලපෑම්, ප්‍රේත දෝෂ ආදී සියලු ගුප්ත බලවේගවල බලපෑම් තිබේ. නමුත් සිත බලවත් අයට මේ කිසිදු බලපෑමක් නොමැත. විශ්වයට ආදරය කරමින් යහපත්ව ධනවත් වන, සිත ගැන විශ්වාස කරන්නා දවසින් දවස ඉහළටම ගමන් කරයි.



මේ පොතෙහි සඳහන් සෑම කරුණක්ම මා ප්‍රායෝගිකව සිදු කරන අතර මාගේ සාර්ථකත්වයට මේවා සෘජුවම දායක වී ඇත. මේ නිසා ඔබ කිහිප වතාවක් මේ පොත කියවන්න. මෙහි සඳහන් කරුණු ක්‍රියාවට නංවන්න. ඒවා දිගටම නොකඩවා පිළිපදින්න. ඔබ ඔබට ආදරය කරන්න. ඔබේ අනාගතය ඔබ අද දකින්න. අනාගතයේ ධනවත්ව සතුටින් ජීවත්වන ආකාරය ගැන සිතන්න. ඒ නිසා අදම ඒ වෙනුවෙන් තීරණ ගන්න. අද යනු, ඔබේ අනාගතයයි. කල්දැමීමේ පුරුද්ද අත්හැර අදම ක්‍රියාත්මක වන්න. මේ පොත කියවන ඔබ වෙනස් අයෙකු බවට පත් වන්න. කුමන හෝ තැනකින් ආරම්භ කරන්න. ඔබ ධනවතෙකු බවට පත් වී සමාජයට, රටට වැඩදායී පුරවැසියෙකු බවට පත් වන්න. බින්දුවෙන් ඔබ ආරම්භ කළ ඔබේ ජීවිතය අවසන් වනවිට කෝටි ගණනක දේපොළ ඔබ වෙත ආකර්ෂණය කරගෙන මහා ධනවතෙක් බවට පත් වී තිබිය යුතු ම ය. එය, මේ පොත රචනා කිරීමේ මාගේ පරම සිහිනයයි. එය මාගේ ඒකායන පැතුමයි. මාගේ නිර්මල අපේක්ෂාවයි.

ඉසුරුමත්, ප්‍රීතිමත් ජීවිතයකට පා තබා මේ විශ්වය සුන්දර කිරීමට ඔබ දායක වන බව මම ද හොඳින් ම දනිමි. එමෙන්ම ලක්ෂපතියන්ගේ, කෝටිපතියන්ගේ සොඳුරු ඉසව්වට ඔබ පැමිණෙන තුරු මම පෙරමග බලා සිටිමි.

සමෘද්! නුඹ ලක්ෂපතියෙකු, කෝටිපතියෙකු වන බව නියත ය. ඒකාන්ත ය. විරය, මෙය නුඹේ කාලයයි !!!

ජය!!!

**මතකයෙන් මැකී යාමට පෙර**

- විශ්වයේ විස්මිතබව අත්විඳින්න. ලොව පවතින සෑම ජීවී අජීවී වස්තුවක් තුළම පුදුමාකාර නිර්මාණාත්මක බලයක් ගැබ් වී තිබේ. ඒ විශ්ව බුද්ධියට ස්තූතිවන්ත වන්න.

- විශ්ව බුද්ධියේ අසමසම නිර්මාණය මිනිසා ය. එනම්, ඔබයි. ඔබ ඔබට ආදරය කරන්න.

- ඔබ, ඔබේ සිත හසුරුවන්න. පාලනය කරන්න. මෙහෙයවන්න. ඔබට ඔබ විශ්වාස නම්, ඔබට ඔබේ සිත



විශ්වාස නම් කළ නොහැක්කක් නොමැති බව ද මතක තබා ගන්න.

- ඔබ වෙනස්වන්න. ඔබ ලැබූ මිනිස් ජීවිතයට ගරු කරන්න. ඔබ සාර්ථක මිනිසෙකු වීම ලැබූ ජීවිතයට ගරු කිරීමකි.

- විශ්වයේ පවත්නා සෑම දෙයක්ම ආකර්ෂණ බලය මත ගොඩනැගී ඇත.

- මුලින්ම ඔබේ සිත හඳුනා ගන්න. ඔබේ සිත සෘණාත්මක නම් එය ධනාත්මක කිරීම ද ධනාත්මක නම් එය වඩාත් දියුණු නිපුණු කිරීම ද ඔබ කළ යුතු ය.

- **ඉහත සඳහන් මූලික සිද්ධාන්ත ඔබ ක්‍රියාත්මක කරයි නම්, ඔබ ව ධනවතෙකු වීම වැළැක්වීමට නොහැකි ය. දිරිගන්න. ජීවිතය ජයගන්න.**